# සිව්වැනි කොටස

## මහ බැංකුවේ හා ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයවුම් වලට අදාල

## 1980 ප්‍රධාන නීති අනපනත්


| | | පිටුව |
|---|---|---|
| 1. | 1980 අංක 12 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත .. | I |
| 2. | 1980 අංක 13 දරන බූදල් බදු පනත .. | II |
| 3. | 1980 අංක 23 දරන විදේශීය ණය (සංශෝධන) පනත .. | XXXIX |
| 4. | 1980 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත .. | XL |
| 5. | 1980 අංක 29 දරන මුදල් (සංශෝධන) පනත .. | LIX |
| 6. | 1980 අංක 43 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත | LIX |
| 7. | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත .. | LXI |
| 8. | 1980 අංක 58 දරන විසර්ජන පනත .. | LXXIV |
| 9. | 1980 අංක 59 දරන විසර්ජන (සංශෝධන) පනත .. | LXXVI |
| 10. | 1980 අංක 60 දරන ලංකා බැංකු (සංශෝධන) පනත .. | LXXVII |
| 11. | 1980 අංක 61 දරන මහජන බැංකු (සංශෝධන) පනත .. | LXXVII |
| 12. | 1980 අංක 62 දරන මුදල් නීති (සංශෝධන) පනත .. | LXXVIII |

# 1980 අංක 12 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 පෙබරවාරි මස 13 වන දින]

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1980 අංක 12 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** මේ පනතෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනතේ 8 වන වගන්තියෙහි ''1972 අප්‍රේල් 1 වන දින හෝ ඊට පසු'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''1972 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු, එහෙත් 1974 අප්‍රේල් මස 1 වන දින පසු නොවී'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(අ) ඒ වගන්තියේ (9) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:–

''(9) දායක මුදලේ කාර්තු වාර කොටසක සම්පූර්ණ මුදලම හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, පැහැර හරින්නා විසින්, එසේ ගෙවීම පැහැර හරින ලද මුදලට අමතරව දණ්ඩනයක් වශයෙන්—

(අ) එසේ ගෙවීම පැහැර හරින ලද මුදලේ සියයට පහකට සමාන මුදලක්, ගෙවිය යුතුය; තවද

(ආ) ගෙවීම පැහැර හැරීම ආරම්භ වීමෙන් පසු දින තිහක් ඉකුත් වීමට පෙර, ඒ ගෙවීම් පැහැර හරින ලද මුදල ගෙවනු නොලැබුවහොත්, එම මුදල ගෙවීම පැහැර හැර තිබෙන වැඩිදුරටත් වූ එක් එක් තිස් දිනක කාලපරිච්ඡේදය හෝ ඉන් යම් කොටසක් වෙනුවෙන්, ගෙවීම පැහැර හරින ලද මුදලේ සියයට එකකට සමාන වැඩිමනත් මුදලක් ගෙවිය යුතු ය:

එසේ වුව ද මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දණ්ඩනයක් වශයෙන් ගෙවිය යුතු සම්පූර්ණ මුදල, කිසිම අවස්ථාවක, ගෙවීම පැහැර හරින් ලද මුදලින් සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය.'' තව ද,

(ආ) ඒ වගන්තියේ අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:–

''(10) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩන මුදලක් අත්හැර දැමීම හෝ අඩු කිරීම කරන ලද යම් විශේෂ අවස්ථානුගත කරුණු හේතුකොට ගෙන ඒ මුදල අත්හැර දැමීමක් හෝ අඩු කිරීමක් සාධාරණ සහ යුක්ති සහගත බවට තමා සෑහීමට පත් වන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් එසේ අත්හැර දැමීම හෝ අඩු කිරීම කරනු ලැබිය හැකි ය.''

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි 16 වන වගන්තියට කරන ලද සංශෝධනය, සියලු කාර්ය සඳහා 1972 අප්‍රේල් මස 1 වන දින බලාත්මක වූ ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ඒ සංශෝධනය, ඒ දින හෝ ඉන්පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්ම අදාළ වන්නේ ය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"ගෙවන ලද දයක මුදල් වෙනුවෙන් සහතික නිකුත් කිරීම

42. (1) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් —

(i) 1973 අප්‍රේල් මස 30 වන දිනයෙන් අවසාන වන මාස දෙළහක් වූ කාලපරිච්ඡේදය තුළ;

(ii) 1974 ජූනි මස 30 වන දිනයෙන් අවසාන වන මාස දෙළහක් වූ කාලපරිච්ඡේදය තුළ; සහ

(iii) යම් තදනන්තර වර්ෂයක ජූනි මස 30 වන දිනයෙන් අවසාන වන මාස දෙළහක් වූ කාලපරිච්ඡේදය තුළ

සෑම තැනැත්තකු විසින්ම ගෙවන ලද දයක මුදල් වෙනුවෙන් හෝ සෑම තැනැත්තෙකුගෙන්ම අයකර ගන්නා ලද දයක මුදල් වෙනුවෙන් හෝ ඒ තැනැත්තා වෙත ඒ එක් එක් කාලපරිච්ඡේදය තුළ ඔහු විසින් ගෙවන ලද හෝ ඔහුගෙන් අය කර ගන්නා ලද මුළු දයක මුදල දක්වන සහතිකයක් නිකුත් කරනු ලැබීමට සැලැස්විය යුතුය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා 1973 මැයි මස 1 වන දිනයෙන් ආරම්භ වී 1973 ජූනි මස 30 වන දිනයෙන් අවසාන වන කාලපරිච්ඡේදය තුළ යම් තැනැත්තකු විසින් ගෙවන ලද හෝ යම් තැනැත්තකුගෙන් අයකර ගන්නා ලද යම් දයක මුදලක්, 1974 ජූනි මස 30 වන දිනයෙන් අවසාන වන මාස දෙළහක් වූ කාලපරිච්ඡේදය තුළ ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබූ ලෙස හෝ ඒ තැනත්තාගෙන් අයකර ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය."

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"දයක මුදල් වෙනුවෙන් පොලිය.

44. 42 වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක සඳහන් මුදල, එම සහතිකය නිකුත් කරන ලද්දේ යම් මාස දෙළහක කාලපරිච්ඡේදයක් වෙනුවෙන් ද, ඒ මාස දෙළහේ කාලපරිච්ඡේදයේ අවසාන දිනයට ඉක්බිතිවම එළඹෙන දිනයෙන් ආරම්භ වන අවුරුදු දෙකක කාලපරිච්ඡේදය තුළ තැන්පත්ව තිබේ නම්, ඒ මුදල වෙනුවෙන් පොලිය ගෙවනු ලැබිය යුතු ය. සහතිකය නිකුත් කරන ලද්දේ යම් මාස දෙළහක කාලපරිච්ඡේදයක් වෙනුවෙන් ද, ඒ මාස දෙළහේ කාලපරිච්ඡේදයේ අවසාන දිනයට ඉක්බිතිවම එළඹෙන දිනයෙන් ආරම්භ වන පළමුවන වර්ෂ දෙක වෙනුවෙන් සියයට පහක ප්‍රමාණය අනුව ද, තදනන්තර වර්ෂ වෙනුවෙන් සියයට පහක ප්‍රමාණය අනුව ද පොලිය ගෙවනු ලැබිය යුතු ය."

---

## 1980 අංක 13 දරන බූදල් බදු පනත

**[සහතිකය සටහන් කළේ 1980 පෙබරවාරි මස 20 වන දින]**

**1978 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන්පසු මිය ගිය හෝ මිය යන තැනැත්තන්ගේ බූදල්වල වටිනාකම මත බූදල් බදු අය කිරීම සහ එකතු කිරීම සඳහා ද ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

1. මේ පනත 1980 අංක 13 දරන බූදල් බදු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

### I වන පරිච්ඡේදය

### බූදල් බද්ද නියම කිරීම

2. 1978 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසු මිය ගිය හෝ මිය යන සෑම තැනැත්තෙකුගේම බූදලයේ වටිනාකම මත, 3 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ආගණනය කරනු ලබන, බූදල් බද්ද නමින් හඳුන්වනු ලබන්නා වූ බද්දක්, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැර, අය කරනු ලැබිය යුතු ය; ගෙවනු ලැබිය යුතු ය.

3. (1) 1978 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන්පසු මිය ගිය හෝ මිය යන යම් තැනැත්තකුගේ බූදලයේ වටිනාකම මත ගෙවිය යුතු බූදල් බදු ප්‍රමාණය, මේ පනතේ උපලේඛණයෙහි සඳහන් නිසි අනුප්‍රමාණ වලට අනුකූලව ආගණනය කළ යුතු ය.

(2) මිය ගිය යම් තැනැත්තකුගේ බූදලයේ වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා ඔහුගේ බූදලය සමන්විත වන කොටස් වන සියලු දේපළ, එක් බූදලයක් බවට පත් වන සේ සමූහනය කළ යුතු ය.

(3) යම් මිය යාමක දී සංක්‍රමණය වන දේපළ, මිය ගිය තැනැත්තාගේ බූදලයේ වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා එක් වරකට වඩා සමූහනය නො කළ යුතු අතර, එකම මරණය වෙනුවෙන් යම් දේපළකින් බූදල් බද්ද එක් වරකට වඩා අය නොකළ යුතු ය.

(4) මිය ගිය තැනැත්තකුගේ බූදලයේ කොටසක් වන්නා වූ යම් දේපළක් සම්බන්ධයෙන් ගෙවිය යුතු බූදල් බද්ද විය යුත්තේ ඒ බූදලයේ වටිනාකම මත ගෙවිය යුතු, (1) වන උපවගන්තියට අනුකූලව ආගණනය කරනු ලබන බද්දෙන්, එම බූදලයේ වටිනාකමට එම දේපළෙහි වටිනාකම දරන අනුපාතය හා සමාන බදු ප්‍රමාණයකි. එම දේපළෙහි වටිනාකම තීරණය කිරීමේ දී ඒ දේපළට අදාළ වන යම් ණයක් හෝ බැඳීමක් සම්බන්ධයෙන් 17 වන වගන්තිය යටතේ කරන ලද අඩු කිරීමට ඉඩ සැළසීමකට සමාන මුදලක අඩු කිරීමක් කරනු ලැබිය යුතු ය.

## II වන පරිච්ඡේදය

### මිය යාමේ දී සංක්‍රමණය වන දේපළ

4. මිය ගිය තැනැත්තකු මිය යාමේ දී සංක්‍රමණය වන දේපළ වලට පහත දැක්වෙන දෑ ඇතුළත් වන ලෙස සැළකිය යුතු ය:-

(අ) තමා මිය යන වේලාවේ දී නියාදනය කිරීමට මිය ගිය තැනැත්තාට බලය තිබුණු දේපළ;

(ආ) මිය ගිය තැනැත්තා විසින් දෙන ලද මරණාපේක්ෂක ත්‍යාගයක් වශයෙන් ගන්නා දේපළ;

(ඇ) (මිය ගිය තැනැත්තා විසින් තනිවම හෝ වෙනත් යම් තැනැත්තකු සමග සම්මතයෙන් නැතහොත් පිළියෙළ කර ගැනීමෙන් කරන ලද යම් මිලට ගැනීමක් හෝ ආයෝජනයක් ද ඇතුළුව) මිය ගිය තැනැත්තාට පරම අයිතිය තිබුණු යම් දේපළ හෝ ඉන් යම් කොටසක අර්ථදායී සම්බන්ධතාව තමාගේ මරණින් පසු වෙනත් තැනැත්තකුට උත්තරජීවිතාව මගින් සංක්‍රමණය වන හෝ උපචිත වන අන්දමට, මිය ගිය තැනැත්තා විසින් නියාදනය කිරීමෙන් නැතහොත් අන්‍යාකාරයකින් තමා සහ එකී වෙනත් තැනත්තා වෙත හවුලේ පැවරීමට හෝ සතු කිරීමට සලස්වන ලද දේපළ;

(ඈ) මිය ගිය තැනැත්තාගේ ජීවිතය රක්ෂණය කළ රක්ෂණ ඔප්පුවක්, නාමිතයකු වූයේ වුව ද පැවරුම්ලාභියකු වූයේ වුව ද යම් ත්‍යාගලාභියකුගේ අර්ථලාභය සඳහා, මිය ගිය තැනැත්තා විසින් සම්පූර්ණ වාර මුදල් තනිවම ගෙවා පවත්වාගෙන ගොස් ඇති අවස්ථාවක දී, ඒ රක්ෂණ ඔප්පුව යටතේ ලැබුණු මුදල් හෝ, ඒ අර්ථලාභය සඳහා වූ රක්ෂණ ඔප්පුවක වාර මුදල් වලින් කොටසක් මිය ගිය තැනැත්තා විසින් ගෙවා පවත්වාගෙන ගොස් ඇති අවස්ථාවක, ඒ රක්ෂණ ඔප්පුව යටතේ ලැබුණ ඒ මුදලින්, මිය ගිය තැනැත්තා ගෙවා ඇති වාර මුදල් වලට අනුපාත වන කොටසක්;

(ඉ) මිය ගිය තැනැත්තා විසින් තනිවම හෝ වෙනත් යම් තැනැත්තකු සමග සම්මතයෙන් නැතහොත් පිළියෙල කර ගැනීමෙන්, යම් වාර්ෂිකයක් හෝ වෙනත් යම් සම්බන්ධතාවක් මිලට ගෙන නැතහොත් සපයා තිබුණ අවස්ථාවක දී; මිය ගිය තැනැත්තාගේ මරණින් පසු, උත්තරජීවිතාව මගින් හෝ අන්‍යාකාරයකින් එහි අර්ථදායී සම්බන්ධතාව උපචිත වන නැතහොත් උද්ගත වන ප්‍රමාණයට ඒ වාර්ෂිකය හෝ සම්බන්ධතාව.

## III වන පරිච්ඡේදය

### නිදහස් කිරීම්

**5.** භාරය ඇති කළ වහාම දේපළෙහි සන්තකය සහ භුක්තිය අර්ථලාභියා විසින් සද්භාවයෙන් භාරගන්නා ලදුව එතැන් පටන් ඒ දේපළ මිය ගිය තැනැත්තා සහමුලින්ම බැහැර වන පරිද්දෙන් සහ ගිවිසුමක් මගින් හෝ අන්‍යාකාරයකින් මිය ගිය තැනැත්තාට යම් අර්ථලාභයක් ලැබීම සහමුලින්ම බැහැර වන පරිද්දෙන්, අර්ථලාභියා විසින් තබාගන්නා ලද නියාදනයක් වන්නා වූ යම් නියාදනයක් මිය ගිය තැනැත්තා විසින් සාදනු නොලැබූ නීතියෙන් ක්‍රියාත්මක කළ හැකි නියාදනයක් වුව ද එසේ මිය ගිය තැනැත්තා විසින් සාදනු ලැබූ නීතියෙන් ක්‍රියාත්මක කළ හැකි නියාදනයක් වුව ද, එවැනි නියාදනයක් යටතේ වෙනත් තැනැත්තකු වෙනුවෙන් භාරකරුවෙකු වශයෙන් මිය ගිය තැනත්තා විසින් දරනු ලැබූ දේපළ, මිය ගිය තැනැත්තා මිය යාමේ දී සංක්‍රමණය නොවන සේ සැලකිය යුතු ය.

**6.** තමාගේ ජීවිත කාලය සඳහා සහ වෙනත් යම් තැනැත්තකුගේ ජීවිත කාලය සඳහා සහ ඔවුනතුරෙන් උත්තරජීවියා සඳහා හෝ තමාගේ මරණින් පසු වෙනත් යම් තැනැත්තකුගේ වාසියට උද්ගත වන සේ හෝ, මිය ගිය තැනැත්තා විසින් තනිවම නැතහොත් වෙනත් යම් තැනැත්තකු සමග සම්මතයෙන් හෝ පිළියෙල කර ගැනීමෙන් මිලට ගත්තා වූ හෝ සපයන ලද්ද වූ සමූහනය කළ විට රුපියල් දස දහසක් නොඉක්මවන එක් වාර්ෂිකයක් හෝ ඊට වැඩි ගණනක් සම්බන්ධයෙන් බුදල් බද්ද නොගෙවිය යුතු ය.

**7.** ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හෝ ශ්‍රී ලංකාවේ යම් විශ්ව විද්‍යාලයකට නැතහොත් මහජන පුස්තකාලයකට හෝ 1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනත මගින් පිහිටුවන ලද ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට හෝ යම් පළාත් පාලන ආයතනයකට හෝ මියගිය තැනැත්තා විසින් රික්තවරණය කරන ලදුව ආණ්ඩුව විසින් හෝ ඒ විශ්ව විද්‍යාලය, පුස්තකාලය, මණ්ඩලය හෝ පළාත් පාලන ආයතනය විසින් ප්‍රතිග්‍රහණය කරන ලද යම් දේපළක් සම්බන්ධයෙන් බුදල් බද්ද නො ගෙවනු ලැබිය යුතු ය.

**8.** මිය ගිය තැනැත්තාගේ වැන්දඹුවට හෝ දරුවකුට, වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥපනත යටතේ හෝ රජයේ නිලධරයන් සඳහා නැතහොත් පළාත් පාලන සේවයෙහි නිලධරයන් සඳහා පිහිටුවා ඇති යම් විශ්‍රාම වැටුප් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් හෝ යටතේ ප්‍රදානය කරන ලද යම් විශ්‍රාම වැටුපක් සම්බන්ධයෙන් බුදල් බද්ද නො ගෙවිය යුතු ය. තව ද යම් විදේශීය රටක ආණ්ඩුව විසින්, ඒ ආණ්ඩුවේ මිය ගිය යම් නිලධරයකුගේ වැන්දඹුවකට හෝ දරුවකුට ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුපක් නැතහොත් වාර්ෂිකයක් සම්බන්ධයෙන් වන විට, ඒ විශ්‍රාම වැටුප නැතහොත් වාර්ෂිකය ගෙවනු ලබන්නේ මිය ගිය තැනැත්තා විසින් ඔහුගේ ජීවිත කාලය තුළ දී දායක මුදල් ගෙවන ලද යම් අරමුදලකින් වුව ද ඒ විශ්‍රාම වැටුප නැතහොත් වාර්ෂිකය සම්බන්ධයෙන් ද බුදල් බද්ද නො ගෙවිය යුතු ය.

**9.** නොබෙදුණු හින්දු පවුලක සාමාජිකයෙකු මිය ගිය අවස්ථාවක දී–

(අ) යම් චංචල දේපළක් එම පවුලේ හවුල් දේපළක් බව කොමසාරිස් ජනරාල් වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් ඒ දේපල සම්බන්ධයෙන්; හෝ

(ආ) යම් නිශ්චල දේපළක් එය චංචල දේපළක් වූයේ නම්, එය එම පවුලේ හවුල් දේපළක් විය හැකිව තිබුණු බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, ඒ නිශ්චල දේපළ සම්බන්ධයෙන්

බූදල් බද්ද නොගෙවිය යුතු ය.

**10.** යම් තැනැත්තකුගේ මරණය සිදු වූ දිනයේ දී ඔහු 1979 අංක 6 දරන වාසික ආගන්තුක (බදු නිදහස් කිරීම) පනතෙහි අර්ථ කථනය කර ඇති පරිදි වාසික ආගන්තුකයකුව සිටියේ නම්, ඒ තැනැත්තාගේ බූදලය සම්බන්ධයෙන් බූදල් බද්ද නොගෙවිය යුතු ය.

**11.** යම් තැනැත්තකු මිය යාමේ දී සංක්‍රමණය වන දේපළට, පදිංචිය සඳහා වූ යම් නිවාස ස්ථාන කිසිවක් ඇතුළත් වන අවස්ථාවක දී, ඒ නිවාස ස්ථාන වලින් එකක වටිනාකම රුපියල් තුන් ලක්ෂයකට සමාන වන්නේ නම් හෝ රුපියල් තුන් ලක්ෂය ඉක්මවන්නේ නම්, ඒ නිවාස ස්ථානයේ වටිනාකමින් රුපියල් තුන් ලක්ෂයක මුදලක් හෝ ඒ නිවාස ස්ථානයේ වටිනාකම රුපියල් තුන් ලක්ෂයක් නොඉක්මවන්නේ නම්, ඒ නිවාස ස්ථානයේ වටිනාකම හෝ බූදල් බද්ද ගෙවීමෙන් නිදහස් කළ යුතු ය.

**12.** මිය ගිය තැනැත්තකු ශ්‍රී ලංකාවෙහි තම සේවයේ යොදවා සිටි නිර්ව්‍යාජ සේවා නියුක්තයන් වූ තැනැත්තන් එක්කෙනෙකුට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට, සමූහනය කළවිට, රුපියල් තිස් දහසක් නොඉක්මවන මුදලක් ගෙවන ලෙස ඒ මිය ගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රයෙන් විධාන කර ඇති අවස්ථාවක දී, එම මුදල සම්බන්ධයෙන් යම් නිදහස් කිරීමක් 6 වන වගන්තිය යටතේ කර නොමැති නම්, ඒ මුදල බූදල් බද්ද ගෙවීමෙන් නිදහස් කළ යුතු ය.

**13.** 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 (9) (අ) වගන්තියේ කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් බවට, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දැන්වීමක් මගින් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති පුණ්‍යායතන එකකට හෝ ඊට වැඩි ගණනකට, සමූහනය කළ විට රුපියල් එක් ලක්ෂයක් නො ඉක්මවන්නා වූ මුදලක් ගෙවන ලෙස, මිය ගිය තැනැත්තකුගේ අන්තිම කැමැති පත්‍රයෙන් විධාන කර ඇති අවස්ථාවක දී, ඒ මුදල බූදල් බද්ද ගෙවීමෙන් නිදහස් කළ යුතු ය.

**14.** යම් තැනැත්තකු මිය යාමේ දී සංක්‍රමණය වන දේපළ වලට යම් ගෘහ භාණ්ඩ හෝ ස්වර්ණාභරණ ඇතුළත්වන අවස්ථාවක දී, රුපියල් විසිපන් දහසක් නො ඉක්මවන්නා වූ මුදලක් හෝ ඒ ගෘහභාණ්ඩවල හා ස්වර්ණාභරණවල වටිනාකම යන මේ දෙකින් අඩු මුදල හෝ බූදල් බද්ද ගෙවීමෙන් නිදහස් කළ යුතු ය.

## IV වන පරිච්ඡේදය

### දේපළවල වටිනාකම තීරණය කිරීම

**15.** (1) මිය ගිය තැනැත්තකුගේ යම් දේපළක වටිනාකම ඇස්තමේන්තු කිරීමේ දී, මෙහි මින් මතු සලස්වා ඇති විධිවිධාන වලට යටත්ව, මිය ගිය තැනැත්තා මිය ගිය දිනයේ දී ඒ දේපළ විවෘත වෙළෙඳපලේ දී විකුණන ලද නම්, තක්සේරු කරුවකුගේ මතය අනුව ලබාගත හැකි වේයයි සලකනු ලබන මිල, ඒ දේපළෙහි වටිනාකම වශයෙන් ඇස්මේන්තු කළ යුතු අතර, මුළු දේපළම එකවිටම, විවෘත වෙළෙඳපලට ඉදිරිපත් කරනු ලැබේය යන උපකල්පනය මත ඒ දේපළ ඇස්තමේන්තු කරන ලදැයි යන හේතුව නිසා ඇස්තමේන්තුවෙහි කිසිම අඩු කිරීමක් නොකළ යුතු ය:

එසේ වුව ද, මිය ගිය තැනැත්තාගේ මරණය හේතු කොට ගෙන ඒ දේපළෙහි වටිනාකම ක්ෂය වී ඇති බව තක්සේරු කරුවකු සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, ඒ දේපළ ඇස්තමේන්තු කිරීමේ දී තක්සේරුකරු විසින් ඒ ක්ෂය වීම සැලකිල්ලට ගනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත් අගය තක්සේරු කිරීමට ඇති දේපළ, නිශ්චල දේපළ වන අවස්ථාවක, ඒ දේපළේ වටිනාකම පහත දක්වෙන ආකාරයට ගණන් බැලූවිට ලැබෙන මුදල ප්‍රමාණය විය යුතු ය:-

(අ) මිය ගිය තැනැත්තා විසින් ඒ දේපළ 1977 මාර්තු මස 31 වන දින හෝ ඒ දිනට පෙර අත්කර ගන්නා ලද්දක් වූ විට-

(i) ඒ දේපළ 1977 මාර්තු මස 31 වන දින විවෘත වෙළෙඳ පළෙහි විකුණන ලද නම්, තක්සේරුකරුගේ මතය අනුව ඒ සඳහා ලබාගත හැකිව තිබුණු මිලට පහත සඳහන් මුදල, එනම්, 1977 මාර්තු මස 31 වන දිනට පසුව සහ මිය ගිය තැනැත්තා මිය ගිය දිනයට කලින් ඒ දේපළ විෂයෙහි වැඩි දියුණු කිරීම්, වෙනස් කිරීම් සහ අලුතින් එකතු කිරීම් කිසිවක් කර තිබුණේ නම් ඒ වැඩිදියුණු කිරීම්, වෙනස් කිරීම් හෝ අලුතින් එකතු කිරීම් සඳහා වැය වූ මුදලට සමාන මුදලක් එකතු කිරීමෙන් ලැබෙන මිල; හෝ

(ii) මිය ගිය තැනැත්තා මිය ගිය දිනයේ දී ඒ දේපළ විවෘත වෙළෙඳපළෙහි විකුණන ලද නම් තක්සේරු කරුගේ මතය අනුව ඒ සඳහා ලබාගත හැකිව තිබුණ මිල

යන මේ දෙකින් අඩු මිල ගණන් ගත යුතු ය; තව ද

(ආ) මිය ගිය තැනැත්තා විසින් ඒ දේපළ 1977 මාර්තු මස 31 වන දිනෙන් පසු අත්කර ගන්නා ලද්දක් වූ විට-

(i) මිය ගිය තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගන්නා ලද දිනයේ දී ඒ දේපළ විවෘත වෙළෙඳපළෙහි විකුණන ලද නම් තක්සේරුකරුගේ මතය අනුව ඒ සඳහා ලබාගත හැකිව තිබුණු මිලට පහත සඳහන් මුදල, එනම්, මිය ගිය තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගත් දිනයෙන් පසුව සහ මිය ගිය තැනැත්තා මිය ගිය දිනයට කලින් ඒ දේපළ විෂයෙහි වැඩිදියුණු කිරීම්, වෙනස් කිරීම් සහ අලුතින් එකතු කිරීම් කිසිවක් කර තිබුණේ නම් ඒ වැඩිදියුණු කිරීම්, වෙනස් කිරීම් හෝ අලුතින් එකතු කිරීම් සඳහා වැය වූ මුදලට සමාන මුදලක් එකතු කිරීමෙන් ලැබෙන මිල; හෝ

(ii) මිය ගිය තැනැත්තා මිය ගිය දිනයේ දී ඒ දේපළ විවෘත වෙළෙඳපළෙහි විකුණන ලද නම් තක්සේරු කරුගේ මතය අනුව ඒ සඳහා ලබාගත හැකිව තිබුණු මිල

යන මේ දෙකින් අඩු මිල ගණන් ගත යුතු ය.

(2) යම් දේපළක් සම්බන්ධයෙන් වන ආදායම උපචිත වී තිබුණු නමුත් මිය ගිය තැනැත්තා මිය යාමට පෙර ඔහු විසින් ඒ ආදායම ලබා ගෙන නොතිබුණු අවස්ථාවක දී, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපළෙහි වටිනාකම, (1) වන උපවගන්තිය යටතේ ඇස්තමේන්තු කරන ලද මිල සහ ඒ ආදායමේ මුදල් ප්‍රමාණය යන දෙකේ එකතුව විය යුතු ය.

(3) අගය තක්සේරු කිරීමට ඇති දේපළ යම් ඉඩමක නොබෙදූ කොටසක් වන අවස්ථාවකදී, එම නොබෙදූ කොටසේ වටිනාකම (1) වන උපවගන්තිය යටතේ ඇස්තමේන්තු කරන ලද පරිදි වූ ඒ මුළු ඉඩමේ වටිනාකමෙන් ඒ කොටසේ අනුපාතික වටිනාකම ගණන් ගෙන ඒ අනුපාතික ප්‍රමාණයෙන් සියයට දහයකට සමාන වන ප්‍රමාණයක් අඩු කිරීමෙන් පසු ලැබෙන වටිනාකම විය යුතු ය.

LIBRARY

(4) (අ) යම් සමාගමක කොටස් පැවරීමේ අයිතිය ඒ සමාගමේ ව්‍යවස්ථාවලිය මගින් සීමා කර ඇත්තේ ද එවැනි සමාගමක හෝ තැනැත්තන් පස් දෙනකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවක් විසින් පාලනය කරනු ලබන සමාගමක හෝ අගය තක්සේරු කිරීමට ඇති දේපළ (වරණීය කොටස් නොවන) කොටස්වලින්, සංයුක්ත වන්නා වූ ද, මිය ගිය තැනැත්තාගේ මරණයට පෙරාතුව වූ දොළොස් මාසයක කාල පරිච්ඡේදය තුළ දී, පිළිගත් ස්කන්ධ වෙළෙඳ මධ්‍යස්ථානයක නිල ලැයිස්තුවෙහි නැතහොත් මේ වගන්තියේ කාර්ය සඳහා මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් අනුමත කරන ලද යම් බ්‍රෝකර්වරුන්ගේ සංගමයක් මගින් ශ්‍රී ලංකාව තුළ නිකුත් කරන ලද යට කී ස්වභාවයේ ලැයිස්තුවක ඒ කොටස්වල මිල ගණන් ඇතුළත් ව නොතිබුණු බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වී ඇත්තා වූ ද අවස්ථාවක දී, (1) වන උපවගන්තියේ කුමක් සඳහන් ව ඇත ද, මේ පනතේ කාර්ය සඳහා ඒ කොටස් වල වටිනාකම ඒ සමාගමේ මුළු වත්කම්වල වටිනාකම අනුව ඇස්තමේන්තු කළ හැකිය.

(ආ) (අ) ඡේදයේ කාර්ය සඳහා —

"පස්දෙනකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවක් විසින් පාලනය කරනු ලබන සමාගම" යන්නෙන්, යම් සමාගමක නිකුත් කරන ලද මුළු කොටස් සංඛ්‍යාවෙන් භාගයකට වැඩි ප්‍රමාණයක් පස්දෙනකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවක්, ඔවුන්ගේ භාර්යාවන් හෝ බාලවයස්කාර දරුවන් විසින් කෙළින්ම හෝ නාමිකයන් මාර්ගයෙන් හෝ දරනු ලැබේ ද එවැනි සමාගමක් අදහස් වේ ;

"වරණීය කොටස" යන්නෙන්, යම් කොටසක් සඳහා හුදෙක් ස්ථාවර අනුප්‍රමාණයක ලාභාංශයක් ලබා ගැනීමට ඒ කොටස දරන්නාට හිමිකම ඇත්තේ ද එවැනි යම් කොටසක් අදහස් වේ ;

"කොටස" යන්නට කුමන නමකින් හැඳින්වුණ ද කොටසකට සමාන වන්නා වූ, යම් සමාගමක් පිළිබඳ කවර වූ හෝ යම් සම්බන්ධතාවක් ඇතුළත් වේ;

"සමාගමක මුළු වත්කම්වල වටිනාකම" යන්නෙන්, පවත්වා ගෙන යන සමාගමක් වශයෙන්, ඒ සමාගමේ කීර්තිනාමය ද ඇතුළු ව සියලු වත්කම්වල වටිනාකම (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ඇස්තමේන්තු කරන ලද විට ලැබෙන වටිනාකමින් —

(i) සමාගමේ යම් සෘණ ස්කන්ධ සහ වරණීය කොටස්වල සම මිල හෝ බේරුම් අගය යන දෙක අතුරින් වැඩි වටිනාකම ;

(ii) මුදලින් හෝ මුදල් වටිනාකමින් වූ ප්‍රතිෂ්ඨාවක් සඳහා සද්භාවයෙන් දරන ලද හෝ ඇති කරන ලද සමාගමේ සියලු ණය ;

(iii) සමාගමේ අනාගත හෝ සම්භාව්‍ය වගකීම් වශයෙන් සාධාරණ හා යුක්ති සහගත ලෙස ආගණනය කරන ලද මුදල හෝ, සමාගමේ මුදල් ප්‍රමාණය නිශ්චිත නැති යම් වගකීම් ;

(iv) අන් කිසිවක් සඳහා නොව සේවා නියුක්තයන්ට විශ්‍රාම වැටුප් ගෙවීමට හෝ, සේවා නියුක්තයන්ගේ හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ නැතහොත් ඥතීන්ගේ අර්ථලාභය සඳහා අන්‍යාකාරයකින් යෙදවීමට හෝ සද්භාවයෙන් අදහස් කරන ලද්ද වූ වෙනම ආයෝජනය කර ඇති යම් සංචිත අරමුදලක මුදල් ප්‍රමාණය

යන මේවා අඩු කිරීමෙන් පසු, ලැබෙන වටිනාකම අදහස් වේ.

16. තැනැත්තකු මියයාමේ දී සංක්‍රමණය වන දේපළ, මිය ගිය තැනැත්තා විසින් තමාගේ ජීවිතය සම්බන්ධයෙන් ලබා ගන්නා ලද රක්ෂණ ඔප්පුවකින් හෝ මිය ගිය තැනැත්තා විසින් මිල දී ගන්නා ලද යම් බදු සංචිත සහතිකවලින් ලැබෙන මුදල්වලින් සංයුක්ත වන අවස්ථාවක, ඒ ලැබෙන මුදල් ප්‍රමාණයෙන්, පහත සඳහන් මුදල් ප්‍රමාණ දෙකින් වඩා අඩු මුදල් ප්‍රමාණය අඩු කළ විට ලැබෙන ගණන ඒ ලැබෙන මුදලේ වටිනාකම වශයෙන් සැලකිය යුතුය: —

(අ) එම මුදල් ප්‍රමාණයෙන් බුදල් බද්ද ගෙවීම සඳහා යොද ගත හැකි කොටස ;

(ආ) ඒ මුළු මුදල් ප්‍රමාණයම මියගිය තැනැත්තාගේ බුදලයේ කොටසක් වූයේ නම් ගෙවිය යුතු විය හැකි බුදල් බදු ප්‍රමාණය.

17. (1) මිය ගිය තැනැත්තාගේ ශ්‍රී ලංකාවෙහි ඇති බුදලයේ වටිනාකම තීරණය කිරීමේ දී මෙහි මින් මතු එන විධිවිධානවලට යටත්ව, යුක්ති සහගත අවමංගල්‍ය වියදම් සඳහා ද මිය ගිය තැනැත්තා විසින් දරන ලද හෝ ඇති කර ගන්නා ලද ණය සහ බැඳීම් සඳහා හෝ මිය ගිය තැනැත්තාගේ බුදලයෙහි කොටසක් වන යම් දේපළකට මිය ගිය තැනැත්තා විසින් ඒ දේපළ උරුම වීමෙන්, ත්‍යාග ලැබීමෙන්, පැවරීමකින්, මිලදී ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීමට පෙරාතුව බැඳීමක් කරනු ලැබ ඔහු මිය ගිය දිනය වන විට එසේ බැඳීමකින් ම පැවතුණු ණය සහ බැඳීම් සඳහා හෝ අඩු කිරීමකට ඉඩ සැලසිය යුතු ය. එහෙත්—

(අ) මිය ගිය තැනැත්තා විසින් මුළුමනින් ම තමාගේ ප්‍රයෝජනය සහ ප්‍රතිලාභය සඳහාම මුදලින් හෝ මුදල් වටිනාකමින් වූ සම්පූර්ණ ප්‍රතිෂ්ඨාවක් සඳහා සද්භාවයෙන් දරන ලද හෝ ඇති කර ගන්නා ලද්ද වූ සහ ඔහුගේ සම්බන්ධතාව කෙරෙන් බලාත්මක වන ණය හෝ බැඳීම් වන්නේ නම් මිස, මිය ගිය තැනැත්තා විසින් දරන ලද ණය හෝ ඇතිකර ගන්නා ලද බැඳීම් ; හෝ

(ආ) වෙනත් යම් බුදලයකින් හෝ තැනැත්තකුගෙන් ප්‍රති පූරණයක් ලැබීමට අයිතිවාසිකමක් ඇති යම් ණයක් වෙනුවෙන් ඒ ප්‍රතිපූරණය ලබා ගත නොහැකි නම් මිස, එවැනි යම් ණයක් ; හෝ

(ඇ) බුදලයේ වෙන් වෙන් කොටස්වලට බැඳීමක් කරන ලද එකම ණයක් හෝ බැඳීමක් සඳහා එක් වරකට වඩා ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත දී ඇතිකර ගන්නා ලද (ශ්‍රී ලංකාවෙහිදී ගෙවීමට ගිවිසගන්නා ලද ණයක් හෝ ශ්‍රී ලංකාවෙහි පිහිටි දේපළ ඇපයට ලබා ගන්නා ලද ණයක් නොවන) යම් ණයක්, ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටියා වූ සහ මිය ගිය තැනැත්තාගේ බුදලයේ කොටසක් වන්නා වූ දේපළක් ඇත්නම් ඒ දේපළෙහි වටිනාකමේ ප්‍රමාණය තෙක් හැර ශ්‍රී ලංකාවෙන් පිටත ඇතිකර ගන්නා ලද එවැනි ණයක් වෙනුවෙන් අඩු කිරීමකට ඉඩ සැලසීමක් නොකළ යුතුය.

තවද යම් ණයක් හෝ බැඳීමක සම්බන්ධයෙන් එවැනි අඩු කිරීමට ඉඩ සැලසීමක් කෙරේද ඒ ණයට හෝ බැඳීමට යටත් දේපළෙහි වටිනාකමෙන්, ඒ ණය හෝ බැඳීම අඩු කළ යුතුය.

(2) මියගිය තැනැත්තකුගේ බුදලයේ වටිනාකම තීරණය කිරීමේදී—

(අ) මියගිය තැනැත්තාගේ ලාභ හෝ ආදායම හෝ ත්‍යාග හෝ ධනය වෙනුවෙන් ඔහු මියගිය දිනයට පෙරාතුව වූ යම් කාලයක් සඳහා මියගිය තැනැත්තාගේ පොල්මංකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ මියගිය තැනැත්තාගේ බුදලය පරිපාලනය කරන වෙනත් තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවේ බල පවත්නා යම් ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු යම් ආදයම් බද්දක්, ත්‍යාග බද්දක්, ධන බද්දක් හෝ ඒ සමාන වෙනත් බද්දක් සඳහා; සහ

(ආ) මියගිය තැනැත්තාගේ බුදලයේ කොටසක් වන යම් දේපළකින්, ඔහු මිය යාමට පෙර යම් කාලයක් සඳහා ඔහුට අත්වුණු හෝ ඔහු ලබා ගත් ලාභ සහ ආදායම වෙනුවෙන් වෙනත් යම් රටක බල පවත්නා ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු යම් බද්දක් සඳහා ද

අඩු කිරීමට ඉඩ සැලසීමක් කළ යුතුය.

## V වන පරිච්ඡේදය

### සහන

18· යම් තැනැත්තකු මිය යාමේ දී සංක්‍රමණය වන ඉඩමකින් හෝ (සමාගමක් විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයක් නොවන) ව්‍යාපාරයකින් හෝ ඉඩමක නැතහොත් එවැනි ව්‍යාපාරයක යම් සම්බන්ධතාවකින් සමන්විත යම් දේපළක් මත බුදල් බද්ද ගෙවිය යුතුව ඇති බවට සහ පළමුවන මියයාමේ දී ඒ දේපළ සංක්‍රමණය වූයේ යම් තැනැත්ත කුට ද ඒ තැනැත්තා මියයාමේදී සංක්‍රමණය වන එම දේපළ හෝ එහි යම් කොටසක් මත තදනන්තර අවුරුදු පහ ඇතුළත නැවත බුදල් බද්ද ගෙවිය යුතුව ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, දෙවන මියයාමේ දී සංක්‍රමණය වන දේපළ සම්බන්ධයෙන් ගෙවිය යුතු බුදල් බදු මුදල පහත දක්වෙන පරිදි අඩු කරනු ලැබිය යුතුය:—

(අ) පළමුවන මරණය සිදු වී එක් අවුරුද්දක් ඇතුළත දෙවන මරණය සිදුවන අවස්ථාවක සියයට පනහකින්;

(ආ) පළමුවන මරණය සිදු වී අවුරුදු දෙකක් ඇතුළත දෙවන මරණය සිදුවන අවස්ථාවක සියයට හතළිහකින්;

(ඇ) පළමුවන මරණය සිදුවී අවුරුදු තුනක් ඇතුළත දෙවන මරණය සිදුවන අවස්ථාවක සියයට තිහකින්;

(ඈ) පළමුවන මරණය සිදුවී අවුරුදු හතරක් ඇතුළත දෙවන මරණය සිදුවන අවස්ථාවක සියයට විස්සකින්;

(ඉ) පළමුවන මරණය සිදුවී අවුරුදු පහක් ඇතුළත දෙවන මරණය සිදුවන අවස්ථාවක සියයට දහයකින්:

එසේ වුවද, දෙවන මරණයේ දී බුදල් බද්ද ගෙවිය යුතු දේපළෙහි වටිනාකම පළමුවන මරණයේදී බුදල් බද්ද ගෙවිය යුතු වූ දේපළෙහි වටිනාකම ඉක්මවන අවස්ථාවක, මේ වගන්තිය යටතේ අඩු කිරීම ගණන් බැලිය යුතු බුදල් බදු මුදල ගණන් බැලීමේ කාර්යය සඳහා පසුව සඳහන් වටිනාකම කලින් සඳහන් වටිනාකම වෙනුවට ආදේශ කරනු ලැබිය යුතුය.

19· මියගිය තැනැත්තාගේ බුදලයේ කොටසක් වන දේපළ විදේශීය රටක පිහිටා ඇත්තා වූද මියගිය තැනැත්තාගේ මරණයේ දී ඒ දේපළ සම්බන්ධයෙන් ඒ රටේදී යම් බුදල් බද්දක් ගෙවිය යුතු බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන්නා වූද අවස්ථාවක, ඒ දේපළෙහි වටිනාකම තීරණය කිරීමේදී—

(අ) ඒ රටේදී ගෙවිය යුතු බුදල් බදු මුදල; හෝ

(ආ) ඒ රටේ පිහිටි දේපළෙහි වටිනාකම, බුදලයේ වටිනාකමට දරන අනුපාතයට සමාන වන්නා වූ, ඒ බුදලයේ වටිනාකම අනුව මේ පනත යටතේ ගෙවිය යුතු බුදල් බද්දේ යම් අනුපාතය,

යන දෙකින් කවර වූ අඩු ප්‍රමාණයට සමාන වන මුදලක් අඩු කිරීමට ඔහු විසින් ඉඩ දිය යුතුය.

## VI වන පරිච්ඡේදය

### බුදල් බද්ද සඳහා වගකීම

20· (1) මියගිය තැනැත්තාගේ මරණය සිදුවන අවස්ථාවේදී නියාදනය කිරීමට ඔහුට බලය තිබුණා වූ සියලු දේපළ සම්බන්ධයෙන් බුදල් බද්ද මියගිය තැනැත්තාගේ බුදලයේ පොල්මෑකරු විසින් ගෙවිය යුතු අතර, ඒ මියයාමේ දී සංක්‍රමණය වන්නා වූ වෙනත් යම් දේපළක් වෙනුවෙන් බුදල් බද්ද ගෙවීමට යටත් තැනැත්තන් විසින් ඒ ගෙවීම කරන මෙන් ඔහුගෙන් ඉල්ලා සිටිනු ලැබුවහොත්, ඒ වෙනත් යම් දේපළ සම්බන්ධයෙන් බුදල් බද්ද ද

ගෙවිය හැකිය. එහෙත්, පොල්මෑකරු වශයෙන් ඔහුට ලැබී ඇති, නැතහොත් තමාගේම නොසැලකිල්ල හෝ පැහැර හැරීම නිසා නොවේ නම් ලැබිය හැකි වූ වත්කම් ඉක්මවන යම් මුදල් බද්දකට පොල්මෑකරුවකු යටත් නොවිය යුතුය.

(2) මියගිය තැනැත්තා යයාමේදී දේපළ සංක්‍රමණය වී ඒ දේපළ සම්බන්ධයෙන් බුදල් බද්ද ගෙවීමට ඔහුගේ පොල්මෑකරු යටත් නොවන අවස්ථාවක, යම් දේපළක් එසේ සංක්‍රමණය වන්නේ නැතහොත් එසේ සංක්‍රමණය වන්නේ යයි යලකනු ලබන්නේ යම් තැනැත්තකුට ද ඒ සැම තැනැත්තකුම තමා විසින් සැබවින්ම භාරගනු ලැබූ හෝ නියාදනය කරනු ලැබූ හෝ දේපළවල ප්‍රමාණය සහ සැම භාරකරුවකුම, දේපළ භාරකරුවකුම, දේපළ ආරක්ෂකයකුම, කළමනාකරුවකුම හෝ එසේ සංක්‍රමණය වන දේපළෙහි යම් සම්බන්ධතාවක් හෝ එහි කළමනාකාරිත්වය කවර වූ හෝ අවස්ථාවකදී පවරනු ලැබූ සැම තැනැත්තකු ම සහ අන්සතු කිරීමෙන් හෝ වෙනත් ව්‍යුත්පන්න හිමිකමකින් එහි සන්තකය පවරනු ලැබූ සැම තැනැත්තකුම දේපළ සම්බන්ධයෙන් බුදල් බද්ද ගෙවීමට යටත් විය යුතුය. තවද, මේ පනතින් නියම කරනු ලබන කාලය තුළ හෝ ඉඩ දෙනු ලබන ඊටපසු කාලයක්, ඇතුළත දේපළ පිළිබඳ ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඔහු විසින් භාර දෙනු ලැබිය යුතුය.

එසේ වුවද, මේ වගන්තියෙහි කිසිවක් ශ්‍රී ලංකාවෙහි වාසික වෙනත් තැනැත්තකු වෙනුවෙන් අනුයෝජිතයෙකු වශයෙන් පමණක් ක්‍රියා කරන තැනැත්තකු බුදල් බද්ද ගෙවීමට යටත් නොකළ යුතුය.

**21**. (1) (2) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව—

(අ) පොල්මෑකරුවකු විසින් ගෙවිය යුතු බුදල් බද්ද, මියගිය තැනැත්තා මියයාමේ අවස්ථාවේදී නියාදනය කිරීමට ඔහුට බලය තිබූ සියලු දේපළ මත පළමු බැඳීමක් විය යුතුය. තවද, සම්පූර්ණ බුදල් බද්ද හෝ ඉන් යම් කොටසක් හෝ අයකර ගැනීම සඳහා ඒ දේපළට එරෙහිව ඒ බැඳීම බලාත්මක කරනු ලැබිය හැකිය;

(ආ) යම් දේපළක් වෙනුවෙන් පොල්මෑකරුවකු නොවන වෙනත් තැනැත්තකු විසින් ගෙවිය යුතු බුදල් බද්ද, ඒ දේපළ මත පළමු බැඳීමක් විය යුතුය.

(2) මෙහි මින් මතු විධිවිධාන සලසනු ලබන ආකාරයට යටත්ව (1) වන උප වගන්තියෙහි සඳහන් පළමු බැඳීම මරණයට පෙර හෝ ඉන් පසුව ක්‍රියාත්මක කරන ලද හෝ ඇති කරන ලද සියලු අන්සතු කිරීම්, බද්දීම් සහ බැඳීම් අභිබවා ප්‍රමුඛත්වය ලැබිය යුතුය:

එසේ වුවද—

(අ) ඒ බැඳීම ක්‍රියාවේ යෙදවීමේ දී යම් දේපළක් තහනමට ගැනීමේ දිනයට පෙර, දැන්වීමක් නොමැති වූ නිර්ව්‍යාජ ගැනුම්කරුවකුට, අගනා ප්‍රතිෂ්ඨාවක් සඳහා විකුණන ලද ඒ දේපළ කෙරෙහි ඒ බැඳීම ව්‍යාප්ත නොකළ යුතුය;

(ආ) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වනවිට මියයාමේ දිනයට පෙර ලියාපදිංචි කළ සාධන පත්‍රයකින් වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කරන ලද යම් බද්දක් හෝ බැඳීමක් අභිබවා ඒ බැඳීම ප්‍රමුඛත්වය නොලැබිය යුතුය.

(ඇ) චංචල දේපළ සම්බන්ධයෙන් වන විට, මියයාමේ දිනයට පෙර ලියාපදිංචි කළ සාධන පත්‍රයකින් වටිනාකම සඳහා සද්භාවයෙන් කරන ලද ඒ දේපළෙහි යම් උකසක හෝ යටත්කොට බැඳ තැබීමක් හෝ අභිබවා ඒ බැඳීම ප්‍රමුඛත්වය නොලැබිය යුතුය.

(3) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි යම් දේපළක් සම්බන්ධයෙන් බුදල් බද්ද සඳහා බැඳීමක්, මේ පනතේ කිසිවකින් ඇති කරන්නේ යයි නො සැළකිය යුතුය.

**22**. (1) යම් දේපළක් වෙනුවෙන් බුදල් බද්ද ගෙවීමට බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ තැනැත්තකුට, ඒ බද්ද ගෙවීමේ හෝ එවකටත් ගෙවන ලදුව ඇත්නම්, එ බදු මුදල ලබාගැනීමේ කාර්යය සඳහා ඒ දේපළ ඔහු වෙත සතු කරනු ලැබුවද නොලැබුවද, උචිත දිසා අධිකරණයේ කැමැත්ත ඇතිව, ඒ දේපළ හෝ එහි යම්

කොටසක් විකිණීමෙන් හෝ උකස් කිරීමෙන් හෝ ඒ දේපළ හෝ එහි යම් කොටසක් හෝ මත නිම කළ හැකි බැඳීමක් මගින් ඒ බදු මුදල සහ යම් පොළියක සහ ඒ සම්බන්ධයෙන් නිසි ලෙස දරන ලද හෝ ගෙවන ලද හෝ වියදම් ලබා ගැනීමට බලය තිබිය යුතුය.

(2) යම් දේපළක් වෙනුවෙන් බූදල් බද්ද ගෙවන ඒ දේපළෙහි බදු ගැනුම්කරුවකුට හෝ උකස් ලාභියකුට, ඒ දේපළ වෙනුවෙන් බූදල් බද්ද ඔහුට කරන ලද උකසක් මගින් ලබා ගත් ලෙස ඒ සමාන බැඳීමකට හිමිකම් ලැබිය යුතුය.

23. මියගිය තැනැත්තකුගේ දේපළෙහි අර්ථලාභි සම්බන්ධතාවක් ඇති තැනැත්තන් කීප දෙනකු අතර, මේ පනතෙහි විධි විධාන යටතේ බූදල් බද්ද ගෙවීමට බලය දෙනු ලැබු හෝ නියම කරනු ලැබු හෝ පොල්මඃකරුවකු විසින් ඒ දේපළ වෙනුවෙන් ගෙවන ලද ඒ සියලු බූදල් බදු, මියගිය තැනැත්තා විසින් දරන ලද ණයක් ලෙස සැලකිය යුතුය තවද, ඒ මියගිය තැනැත්තා විසින්, ඔහුගේ අන්තිම කැමති පත්‍රයක් ඇතොත්, එයින් අන්‍යාකාරයකින් විධාන කරනු ලැබ ඇත්නම් මිස, ඒ මියගිය තැනැත්තාගේ දේපළෙහි ඔවුන්ගේ සම්බන්ධතාවල වටිනාකම්වලට අනුපාතිකව ඒ තැනැත්තන් අතර ඒ ගෙවන ලද බූදල් බද්ද විභජනය කළ යුතුය.

## VII වන පරිච්ඡේදය

## ප්‍රකාශ

24. (1) සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ ප්‍රොබේට් බලපත්‍ර හෝ අද්මිනිස්ත්‍රාසි ලිපි ප්‍රදානය කිරීම අනිවාර්ය වන සෑම බූදලයකම පොල්මඃකරු විසින්, මියගිය තැනැත්තා මියගිය දින සිට මාස හයක් ඇතුළත, මියගිය තැනැත්තාගේ බූදලයේ වටිනාකම ඇතුළුව ඊට අදළ විස්තර පිළිබඳ සම්පූර්ණ සහ සත්‍ය ප්‍රකාශයක් ඇතුළත් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙහි වූ දේපළ පිළිබඳ ප්‍රකාශයක් උචිත දිසා අධිකරණය මගින් කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දෙනු ලැබිය යුතුය. තවද, වෙනත් යම් බූදලයක පොල්මඃකරුවකු විසින්, මියගිය තැනැත්තා මියගිය දින සිට මාස හයක් ඇතුළත, මියගිය තැනැත්තාගේ බූදලයේ වටිනාකම ඇතුළුව ඊට අදළ විස්තර පිළිබඳ සම්පූර්ණ සහ සත්‍ය ප්‍රකාශ යක් ඇතුළත් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙහි වූ දේපළ පිළිබඳ ප්‍රකාශයක් උචිත දිසා අධිකරණය මගින් කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දෙනු ලැබිය හැකිය. තවද, ඒ දේපළ පිළිබඳ ප්‍රකාශය සමග මියගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රයක් ඇතොත් එහි සහතික පිටපතක් ඔහු විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දෙනු ලැබිය යුතුය.

(2) මියගිය තැනැත්තකු මිය යාමේදී සංක්‍රමණය වන යම් දේපළක් සම්බන්ධයෙන් බූදල් බද්ද ගෙවීමට පොල්මඃකරු යටත් නොවන අවස්ථාවක, ඒ බූදල් බද්ද ගෙවීමට යටත් තැනැත්තා විසින් මියගිය තැනැත්තා මියගිය දින සිට මාස හයක් ඇතුළත ඒ දේපළෙහි වටිනා කම ඇතුළුව ඊට අදළ විස්තර පිළිබඳ සම්පූර්ණ සහ සත්‍ය ප්‍රකාශයක් ඇතුළත්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි අකෘතියෙහි වූ දේපළ පිළිබඳ ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දෙනු ලැබිය යුතුය.

25. යම් පොල්මඃකරුවකු හෝ බූදල් බද්ද ගෙවීමට යටත් වෙනත් තැනැත්තකු තමා විසින් භාර දෙනු ලැබු යම් දේපළ පිළිබඳ ප්‍රකාශයක–

(අ) බූදල් බද්දට යටත් දේපළ එයින් අත්හැර ඇති බවට; හෝ

(ආ) බූදල් බද්දට යටත් දේපළ සම්බන්ධයෙන් අඩුවෙන් තක්සේරු කිරීමක් එහි කර ඇති බවට; හෝ

(ඇ) මේ පනත යටතේ බලය දෙනු නොලැබු අඩු කිරීමකට හිමිකම් ඇති බවට හෝ

දෝෂයක් ඇති බව ඒ පොල්මඃකරුගේ හෝ බුදල් බද්ද ගෙවීමට යටත් ඒ වෙනත් තැනැත්තකුගේ හෝ දැන ගැනීමට ලැබෙන යම් අවස්ථාවක, ඒ දෝෂය පිළිබඳ විස්තර දක්වෙන තවත් ප්‍රකාශයක් ඔහු විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත වහාම භාර දෙනු ලැබිය යුතුය.

26. (1) තම මතය අනුව, මියගිය තැනැත්තකුගේ කටයුතු සම්බන්ධයෙන් තොරතුරු දීමට හැකි යම් තැනැත්තකුට, මේ පනත යටතේ තක්සේරුවක් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි තක්සේරුකරු විසින් සලකනු ලැබිය හැකි විස්තර ඒ දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත සැපයීමට නියම කරමින්, තක්සේරුකරු විසින් ලිඛිත දැන්වීමක් දෙනු ලැබිය හැකිය.

(2) දේපළ පිළිබඳ ප්‍රකාශයක් කිරීමට මේ පනතින් නියම කරන ලද .යම් තැනැත්තකුට හෝ (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් යවන ලද යම් තැනැත්තකුට හෝ මේ පනත යටතේ තක්සේරුවක් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි තක්සේරුකරු විසින් සලකනු ලැබිය හැකි ඔප්පු, පිඹුරු, සාධන පත්‍ර, පොත්, ගිණුම් හෝ ලේඛන හෝ තක්සේරුකරු විසින් නියම කරනු ලබන වේලාවකදී සහ ස්ථානයක දී ඒ දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට නියම කරමින් තක්සේරුකරුවකු විසින් ලිඛිත දැන්වීමක් දෙනු ලැබිය හැකිය.

## VIII වන පරිච්ඡේදය

## තක්සේරු

27. දේපළ පිළිබඳ තක්සේරුව භාර දෙනු ලැබුවද නොලැබුව ද මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් ගෙවිය යුතු බුදල් බද්ද තක්සේරුකරුවකු විසින් යම් අවස්ථාවකදී තක්සේරු කරනු ලැබිය හැකිය. තවද, ඒ බුදල් බද්ද ගෙවීමට යටත් වන්නේ යයි ඔහු අදහස් කරන තැනැත්තාට හෝ තැනැත්තන්ට හෝ ඒ තක්සේරුව පිළිබඳ දැන්වීමක් නිකුත් කළ යුතුය.

28. (1) මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් බුදල් බද්ද තක්සේරු කිරීමට අවශ්‍ය යයි තමා විසින් සලකනු ලබන විස්තර තමා වෙත ලැබීමෙන් පසු එක් අවුරුද්දක් ඇතුළත, බූදලය සම්බන්ධයෙන් ගෙවිය යුතු බුදල් බද්ද තක්සේරුකරුවකු විසින් තක්සේරු කොට, ඒ බද්ද ගෙවිය යුතු තැනැත්තා හෝ තැනැත්තන් හෝ තීරණය කළ යුතුය.

(2) බුදල් බද්ද වශයෙන් යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබීමට යටත් මුදල නියම මුදලට වඩා අඩුවෙන් තක්සේරු කරනු ලැබ ඇති බව තක්සේරුකරුවකුට පෙනී යන අවස්ථාවක, ඒ මියගිය තැනැත්තාගේ බූදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි ලිපි හෝ ප්‍රදානය කරනු ලැබ ඇති බව මියගිය තැනැත්තකුගේ පොල්මඃකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ විසින් තක්සේරුකරු වෙත ලිඛිතව දන්වනු ලබන දින සිට අවුරුදු දෙකක් ඇතුළත යම් අවස්ථාවක, තක්සේරුකරු විසින්, තම මතය අනුව ඒ තැනැත්තා විසින් ගෙවීමට යටත් මුදල පිළිබඳ අතිරේක තක්සේරුවක් කොට ඒ අතිරේක තක්සේරුව කිරීම සඳහා හේතු ඔහු වෙත ලිඛිතව දන්වනු ලැබිය හැකිය:

එසේ වුවද—

(අ) අඩුවෙන් තක්සේරු කිරීම වංචාවක් නිසා හෝ චූවමනාවෙන්ම මග හැරීමක් නිසා හෝ වන අවස්ථාවක, ඒ අතිරේක තක්සේරුව කවර වූ හෝ අවස්ථාවකදී කරනු ලැබිය හැකිය;

(ආ) පොල්මඃකරුවකු විසින් හෝ මේ පනත යටතේ බුදල් බද්ද ගෙවීමට යටත් වෙනත් යම් තැනැත්තකු විසින් හෝ තමා වෙත දන්වනු ලබන අතිරේක බද්දක් සඳහා වූ යම් වගකීමක් තක්සේරුකරුවකු විසින් කවර වූ හෝ අවස්ථාවකදී තක්සේරු කරනු ලැබිය හැකිය;

(ඇ) මේ වගන්තිය යටතේ කරන ලද අතිරේක තක්සේරුවකින් 40 වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි සඳහන් අවස්ථාවල දී හැර, 40 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක සඳහන් යම් දේපළක් කෙරෙහි බලපෑම හෝ ඒ මත බැඳීමක් ඇති කිරීම හෝ නොකළ යුතුය.

(3) (2) වන උපවගන්තිය යටතේ බුදල් බද්දක අතිරේක තක්සේරුවක කරන ලැබ ඇති අවස්ථාවක වංචාවක පිළිබඳ අවස්ථාවකදී හැර, බද්ද ගෙවීමට චිත්කම් රඳවා නොගෙන මියගිය තැනැත්තාගේ බුදලය අද්මිනිස්ත්‍රාසි කිරීමේ හෝ බෙද හැරීමේ හේතුවෙන් යම් අතිරේක තක්සේරුවක් යටතේ යම් බුදල් බද්දක් සඳහා පොල්මඃකරුවකු පෞද්ගලිකව යටත් නොවිය යුතුය.

(4) යම් තැනැත්තකු විසින් 24 වන වගන්තිය යටතේ භාර දෙන ලද ප්‍රකාශයක් නොපිළිගෙන ඒ තැනැත්තා සම්බන්ධයෙන් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරන ලබන අවස්ථාවක ඒ ප්‍රකාශය නොපිළිගැනීමට තමාගේ හේතු තක්සේරුකරු විසින් ඒ තැනැත්තාට ලිඛිතව දන්වනු ලැබිය යුතුය.

## IX වන පරිච්ඡේදය

### අභියාචන

**29.** (1) තමා බුදල් බද්ද ගෙවීමට යටත් නොවන්නේ යයිද, නැතහොත් තක්සේරුව දෝෂ සහිත යයිද යන හේතුව මත මේ පනත යටතේ කරන ලද තක්සේරුවක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, තක්සේරුව පිළිබඳ දැන්වීමේ දින සිට දින තිහක කාලයක් ඇතුළත, ඒ තක්සේරුවට විරුද්ධව කොමසාරිස් ජනරාල්වරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකිය:

එසේ වුවද ශ්‍රී ලංකාවෙහි නොසිටීම, රෝගාතුර වීම හෝ වෙනත් යුක්ති සහගත හේතුවක් නිසා ඒ කාලය ඇතුළත අභියාචනය කිරීමට අභියාචකට නොහැකි වූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වූ විට, අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාලය දීර්ඝ කරනු ලැබිය යුතුය.

(2) සෑම අභියාචනයක්ම කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කරනු ලබන ලිඛිත පෙත්සමක් මගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර ඒ අභියාචනයට හේතු පැහැදිලිව සඳහන් කරනු ලැබිය යුතුය.

(3) අභියාචනය කරන ලද්දේ යම් තක්සේරුවකට විරුද්ධව ද ඒ තක්සේරුව 24 වන වගන්තිය යටතේ භාර දෙනු ලැබීමට නියමිත දේපළ පිළිබඳ ප්‍රකාශයක් නොමැතිව කරන ලද තක්සේරුවක් වන අවස්ථාවක, තම අභියාචන පෙත්සම සමග දේපළ පිළිබඳ ප්‍රකාශයක් අභියාචක විසින් භාර දෙනු ලැබිය යුතුය.

(4) (1) වන (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානයන්ට අනුකූල නොවන සෑම අභියාචන පෙත්සමක් ම වලංගු නොවිය යුතුය.

(5) අභියාචක විසින් (1) වන උප වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන්නේ යම් දිනයකද ඒ දින සිට මාස තුනක් ඇතුළත, තම අභියාචනය සනාථ කිරීමෙහිලා අභියාචක විශ්වාසය තබන ලේඛන, සාක්ෂි දෙන තැනැත්තන්ගේ නම් සහ පදිංචි නාම සඳහන් ලැයිස්තුවක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය:

එසේ වුවද, අභියාචක විසින් තත් කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල සඳහන් කාලය කලින් කල දීර්ඝ කරනු ලැබිය හැකිය.

(6) වලංගු අභියාචන පෙත්සමක් ලැබුණු විට, තක්සේරුකරු විසින් වැඩිදුර පරීක්ෂණයක් කරනු ලැබීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් සලස්වනු ලැබිය යුතු අතර, ඒ පරීක්ෂණය අතරතුරදී අභියාචන පෙත්සමෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් එකඟත්වයක් ඇති කරගනු ලැබුවහොත් තක්සේරුවේ අවශ්‍ය සකස් කිරීම් කරනු ලැබිය යුතුය.

(7) (6) වන උපවගන්තිය යටතේ, විධිවිධාන සලසන ලද ආකාරයෙන් අභියාචක සහ තක්සේරුකරු අතර එකඟත්වයක් ඇතිකර ගනු නොලැබුවහොත් අභියාචනය විභාග කිරීම සඳහා වේලාවක් සහ ස්ථානයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය යුතුය.

(8) සෑම අභියාචකයකුම අභියාචනය විභාග කිරීම සඳහා නියම කරනු ලැබූ වේලාවෙහි සහ ස්ථානයෙහි කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ පැමිණ සිටිය යුතුය. අභියාචනය විභාගයට පුද්ගලිකව හෝ බලයලත් නියෝජිතයකු මගින් හෝ අභියාචකට පෙනී සිටිය හැකිය. අභියාචනයක විභාගය අඩාලව කල් තැබීම සුදුසු යයි කොමසාරිස් ජනරාල් වරයා කල්පනා කරන්නේ නම්, ඒ කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි වේලාවකදී සහ ස්ථානයකදී පැවැත්වීම පිණිස එය ඔහු විසින් කලින් කල අඩාලව කල් තබනු ලැබිය හැකිය. අභියාචක වෙනුවෙන් බලයලත් නියෝජිතයකු පැමිණ සිටින යම් අවස්ථාවක, අභියාචනයේ විභාගය කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩාලව කල් තබනු ලැබිය හැකි අතර, අභියාචනය තීරණය කිරීම සඳහා අභියාචක පුද්ගලිකව පැමිණ සිටීම අවශ්‍ය යයි ඔහු සලකන්නේ නම් අඩාලව කල් තබනු ලැබූ අභියාචනයේ විභාගය සඳහා නියමිත වේලාවෙහි සහ ස්ථානයෙහි පුද්ගලිකව අභියාචක පැමිණ සිටිය යුතු යයි ඔහු විසින් නියම කරනු ලැබිය හැකිය. අභියාචන යේ විභාගය සඳහා හෝ අඩාලව කල් තබන ලද යම් විභාගයක් සඳහා හෝ නියමිත වේලාවෙහි සහ ස්ථානයෙහි පෙනී සිටීමට අභියාචක විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා හෝ පැහැර හරිනු ලැබුවහොත් නැතහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබ, එසේ පුද්ගලිකව පැමිණ සිටීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් කොමසාරිස් ජනරාල් වරයා විසින් අභියාචනය නිෂ්ප්‍රභා කරනු ලැබිය හැකිය.

එසේ වුවද, අභියාචනය නිෂ්ප්‍රභා කරනු ලැබීමෙන් පසු යුක්ති සහගත කාලයක් ඇතුළත ඒ අභියාචන විභාගයේදී හෝ අඩාලව කල් තැබූ යම් විභාගයකදී ඔහු හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයා හෝ නිසි පරිදි පැමිණ සිටීම වළක්වනු ලැබුයේ ශ්‍රී ලංකාවේ නො සිටීම, රෝගාතුර වීම, හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා බවට අභියාචක විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් කරනු ලැබුවහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිෂ්ප්‍රභා කිරීමේ නියමය ඉවත් කොට අභියාචනයේ විභාගය සඳහා වේලාවක් සහ ස්ථානයක් නියම කරනු ලැබිය හැකිය.

(9) මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනයක් පිළිබඳව තීරණයක් කිරීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා විසින් —

( අ ) (5) වන උපවගන්තියෙහි සඳහන් ලැයිස්තුවේ ඇතුළත් කරන ලද යම් ලේඛනයක් පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කරන ලෙස හෝ එම ලැයිස්තුවෙහි සඳහන් යම් තැනැත්තකු සාක්ෂිය සඳහා කැඳවීමට හෝ අභියාචකට නියම කරනු ලැබිය හැකි ය; තවද

(ආ) තමා වෙත ඉදිරිපත් කිරීමට අභියාචක කැමති වන යම් සාක්ෂි සලකා බැලිය යුතු ය.

(10) අභියාචනය සම්බන්ධයෙන් අභියාචකගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ සාක්ෂි කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග කරනු ලබන අවස්ථාවක, ඒ සාක්ෂි පිළිබඳ වාර්තාවක් තබා ගැනීම හෝ තබා ගැනීමට සැලැස්වීම ඔහු විසින් කළ යුතු ය.

(11) මේ වගන්තිය යටතේ අභියාචනයක් තීරණය කිරීමේ දී අභියාචනය කරන ලද්දේ යම් තක්සේරුවකට විරුද්ධව ද, ඒ තක්සේරුව ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරනු ලැබිය හැකි ය. තව ද, අභියාචනය පිළිබඳව තීරණය අභියාචකට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

30. (1) අභියාචනය පිළිබඳව තම තීරණය කොමසාරිස් ජනරාල්වරයා විසින් නිවේදනය කිරීමෙන් පසු දින තිහක් ඇතුළත යම් අවස්ථාවක තම පෙත්සමේ වගඋත්තරකරු වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා නම් කරමින් අභියාචක විසින් අභියාචක පෙත්සමක් උචිත දිසා අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඒ පෙත්සමේ පිටපතක් කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(2) අභියාචක විසින් අභියාචන පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබ, ඒ පෙත්සම ඉදිරිපත් කරන ලද දින සිට දින තිහක් ඇතුළත එහි පිටපතක් කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දීම පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ පෙත්සම දිසා අධිකරණය විසින් නිෂ්ප්‍රභා කරනු ලැබිය යුතු ය.

(3) අධිකරණයේ කැමැත්ත ඇතිව සහ අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි නියමයන්ට යටත්ව හැර, අභියාචන විභාගයේ දී—

(අ) 29 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි සඳහන් ලැයිස්තුවෙහි ඇතුළත් නොකළ යම් ලේඛනයක් හෝ ඒ ලැයිස්තුවෙහි සඳහන් නොකළ යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි ඉදිරිපත් කිරීමට; හෝ

(ආ) 29 වන වගන්තියේ (9) වන උපවගන්තිය යටතේ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබූ විට, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමට තමා පැහැර හරිනු ලැබූ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ එම උපවගන්තිය යටතේ කැඳවනු ලැබූ විට, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් නොකළ යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි ඉදිරිපත් කිරීමට හෝ

අභියාචකට ඉඩ නොදිය යුතු ය.

(4) අභියාචන පෙත්සම ඉදිරිපත් කරනු ලැබ එහි පිටපතක් කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දෙනු ලැබූ විට, පැමිණිලිකරු වශයෙන් අභියාචක සහ විත්තිකරු වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා අතර නඩුවක් ලෙස අභියාචනය සලකනු ලැබීම හා පැවැත්වීම කළ හැකි ය. තව ද මෙහි මින් මතු සලසනු ලබන්නා වූ විධිවිධානවලට යටත්ව, සිවිල් නඩු විධාන සංග්‍රහයේ සහ මුද්දර ආඥාපනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය :

එසේ වුව ද, නඩුවේ දී අධිකරණය විසින් කරන ලද ආඥාවක් මගින් අන්‍යාකාරයකින් විධාන කරන්නේ නම් මිස, එවැනි යම් නඩුවක දී අභියාචකගේ පෙත්සම නොවන උත්තරවාද ඉදිරිපත් නොකළ යුතු ය:

එසේ ම තවදුරටත් එවැනි යම් නඩුවක දී සටහන් කරන ලද තීන්දු ප්‍රකාශයෙහි මේ පනත යටතේ බදුල් බද්ද වශයෙන් අභියාචක විසින් ගෙවනු ලැබීමට යටත් මුදලක් ඇත්නම් ඒ මුදල සඳහන් කළ යුතු ය.

(5) මෙහි මින් පෙර විධිවිධාන සලසා ඇති අභියාචනයක් සම්බන්ධයෙන් කරන ලද දිසා අධිකරණයේ යම් තීන්දු ප්‍රකාශයකින් හෝ ආඥාවකින් අතෘප්තියට පත් යම් පාර්ශ්වයක් විසින්, දිසා අධිකරණයේ නඩු තීන්දු හා ආඥාවලට විරුද්ධව අභියාචනය කිරීමට අදාළ තත් කාලයේ වලංගුව පවත්නා නීතියේ විධිවිධානවලට අනුකූලව අභියාචනය කරනු ලැබිය හැකි ය.

(6) මෙහි මින් පෙර විධිවිධාන සලසා ඇති දිසා අධිකරණයක, හෝ වෙනත් යම් අධිකරණයක් ඉදිරියේ පවත්නා සියලු නඩු කටයුතුවල දී කොමසාරිස් ජනරාල්වරයා නිලබලය ප්‍රකාර නඩු පවරන හෝ තමාට විරුද්ධව නඩු පවරනු ලබන රජයේ නිලධරයකු වශයෙන් සලකනු ලැබිය යුතු අතර, යම් ලිඛිත නීතියකින් නියමිත යම් මුදලක් තැන්පත් කරන ලෙස හෝ යම් ගාස්තුවක් ගෙවන ලෙස හෝ යම් ඇපයක් තබන ලෙස නියම කරනු නොලැබිය යුතු ය.

## X වන පරිච්ඡේදය

### තක්සේරු කිරීම්වල අවසානාත්මක භාවය සහ සාවද්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් දණ්ඩන

**31.** මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් ගෙවිය යුතු බූදල් බද්ද පිළිබඳ තක්සේරුවකට විරුද්ධව මේ පනතෙහි සඳහන් කාලය ඇතුළත කිසිදු වලංගු අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක හෝ එබඳු තක්සේරුවකට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයක් 29 වන වගන්තියේ (11) වන උපවගන්තිය යටතේ නිෂ්ප්‍රභා කරනු ලැබ ඇති අවස්ථාවක හෝ 29 (6) වන වගන්තිය යටතේ ඒ බදු මුදල පිළිබඳව එකඟත්වයකට එළඹ ඇති අවස්ථාවක හෝ ඒ මුදල අභියාචනයේ දී තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ තක්සේරු කරනු ලැබූ හෝ එකඟවනු ලැබූ හෝ අභියාචනයේ දී තීරණය කරනු ලැබූ තක්සේරුව, ඒ මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් වූ මේ පනතේ සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය :

එසේ වුව ද, අභියාචනයේ දී තීරණය කරනු ලැබූ යම් කාරණාවක් නැවත සලකා බැලීමක් සිදු නොවන්නා වූ යම් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් තක්සේරු කරුවකු විසින් කරනු ලැබීම මේ වගන්තියෙහි කිසිවකින් වළක්වනු නොලැබිය යුතු ය.

**32.** (1) යම් මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් කරනු ලැබූ තක්සේරු වක දී ඒ බූදලය සම්බන්ධයෙන් භාර දෙන ලද යම් ප්‍රකාශයක බූදලයේ කොටසක් වන්නා වූ යම් දේපළක් සම්බන්ධයෙන් දෙනු ලැබූ වටිනාකම, එම බූදලය සම්බන්ධයෙන් භාර දෙනු ලැබූ යම් ප්‍රකාශයක එම දේපළ සම්බන්ධයෙන් දෙනු ලැබූ වටිනාකම ඉක්මවන්නා වූ ද ඒ තක්සේරුව 31 වන වගන්තිය යටතේ අවසානාත්මක හා තීරණාත්මක වන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා විසින් එම ප්‍රකාශයෙහි තමා විසින් කරන ලද හෙළි කිරීමේ දී කිසිදු වංචාවක් හෝ චුවමනාවෙන් ම අතපසු කිරීමක් සිදු වී නැති බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි ඒ ප්‍රකාශය භාරදුන් තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, සාවද්‍ය ප්‍රකාශයක් කිරීම සම්බන්ධයෙන් දඬුවමක් වශයෙන් එකතුව රුපියල් දෙදහසක් නොඉක්මවන මුදලක් සහ අතිරික්ත ප්‍රමාණයට අදාළ වූ බූදල් බද්දට සමාන මුදලක් නිශ්චිත දිනයක හෝ ඊට පෙර ගෙවන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා විසින්, නියමය තමා වෙත දැනුම් දෙනු ලැබීමෙන් පසු දින විසි එකක් ඇතුළත ඊට විරුද්ධව උචිත දිසා අධිකරණය වෙත ලියවිල්ලකින් අභියාචනය කරනු ලැබිය හැකි ය. නියමයට විරුද්ධ වීමේ හේතු අභියාචනයෙහි සඳහන් කළ යුතු ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ යම් අභියාචනයක් විභාග කර, ඊට සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් හැකිතාක් දුරට 30 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය. අභියාචනයක් කරන ලද්දේ කොමසාරිස් ජනරාල්වරයාගේ යම් නියමයක් සම්බන්ධයෙන් ද ඒ නියමයෙන් පනවනු ලැබූ දණ්ඩනය දිසා අධිකරණය විසින් ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි වුව ද, ඒ දණ්ඩනයේ යම් වැඩි කිරීමක්, ඒ දඬුවම වශයෙන් (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි උපරිම මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ යම් තැනැත්තකු කෙරෙහි දඬුවමක් පනවනු ලැබූ අවස්ථාවක, 64 වන වගන්තියේ (අ) ඡේදය යටතේ එම ප්‍රකාශයට අදාළ වරදකට නඩු පවරනු ලැබීමට ඔහු යටත් නොවිය යුතු ය.

## XI වන පරිච්ඡේදය

### බූදල් බද්ද ගෙවීම

**33.** (1) තක්සේරු දැන්වීමෙහි විධාන කරනු ලැබ ඇති ආකාරයට, ඒ දැන්වීමෙහි සඳහන් දින හෝ ඊට පෙර බූදල් බද්ද ගෙවනු ලැබිය යුතු ය.

(2) බූදල් බද්ද හෝ ඉන් යම් කොටසක් ගෙවීම, තමා විසින් කරනු ලබන නියමයෙහි සඳහන් දිනයක් දක්වා අත්හිටුවා තබන ලෙස කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන්නේ නම් මිස; යම් අභියාචනයක් කර ඇත ද බූදල් බද්ද ගෙවනු ලැබිය යුතු ය.

(3) තක්සේරු දැන්වීමෙහි හෝ (2) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයක හෝ සඳහන් දින හෝ ඊට පෙර නොගෙවන ලද යම් බූදල් බද්දක්, බූදල් බදු වාරික වලින් ගෙවීම පිළිගැනීමට කොමසාරිස් ජනරාල්වරයා එකඟ වන්නේ නම් මිස, ගෙවීම පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**34.** (1) මේ පනත යටතේ බූදල් බද්ද ගෙවීමට යටත් වන්නා වූ යම් තැනැත්තකු විසින්, ඒ බදු මුදලේ වටිනාකමට සමාන, මියගිය තැනැත්තාගේ මිය යාමේදී සංක්‍රමණය වන්නා වූ නිශ්චල දේපළ, ඒ බූදල් බද්ද මුදලින් ගෙවීම වෙනුවට ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත පවරන ලෙස, බූදල් බදු ගෙවීම සඳහා නියමිත දිනට පෙර කොමසාරිස් ජනරාල් වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(2) එබඳු කිසිම ඉල්ලීමකට අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මිස, කොමසාරිස් ජනරාල් වරයා විසින් අවකාශ දීම හෝ එය ප්‍රතික්ෂේප කිරීම කරනු නොලැබිය යුතුය.

(3) මේ වගන්තිය යටතේ බූදල් බද්ද ගෙවීමෙහි ලා පවරන ලද යම් නිශ්චල දේපළක වටිනාකම, මේ පනතේ කාර්ය සඳහා තීරණය කරන ලද ඒ දේපළෙහි වටිනාකම වන්නේය.

(4) බූදල් බද්ද ගෙවීමෙහි ලා යම් නිශ්චල දේපළක් ආණ්ඩුව වෙත පැවරීම, ඒ දේපළෙහි හිමිකම පරීක්ෂා කිරීම හා ඒ දේපළෙහි පැවරුම් ඔප්පුව ලියා අත්සන් කිරීම හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වූ සියලු ගාස්තු, අයකිරීම් හා වියදම් ඉල්ලුම්කරු විසින් දරනු ලැබිය යුතුය.

**35.** (1) යම් බූදල් බද්දක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් මුදලින් ගෙවීම වෙනුවට මේ වගන්තියේ පහත දැක්වෙන විධිවිධානවලට අනුකූලව ආණ්ඩුවේ ස්කන්ධ භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත පවාරණය කරනු ලැබිය හැකි ය.

(2) කිසිම ස්කන්ධයක් —

(අ) එය ශ්‍රී ලංකාවේදී නිකුත් කරන ලද ශ්‍රී ලංකා ආණ්ඩුවේ ස්කන්ධය නම්; හා

(ආ) එය නිකුත් කරන වේලාවේ දී මියගිය තැනැත්තා විසින් ම ඊට දායක වී ඇත්නම් හෝ ඔහුගේ මරණයට එක් වර්ෂයකට නොඅඩු කාලයකට පෙර ඔහු විසින් එය මිළදී ගනු ලැබ ඇත්නම්

මිස මේ වගන්තියේ කාර්ය සඳහා නොපිළිගත යුතුය.

(3) පවාරණය කරන ලද ස්කන්ධය සම්පූර්ණයෙන් ගෙවනු ලැබ, නිකුත් කරන ලද්ද වූ ද සම මිළට නිදහස් කළ හැකි වූ ද ස්කන්ධයක් වන අවස්ථාවක, ඒ ස්කන්ධය පවාරණය කිරීම —

(අ) ඒ ස්කන්ධයේ ප්‍රකාශිත අගයේ; හා

(ආ) ඒ ස්කන්ධයේ උපචිත පොළියේ

එකතුවට සමාන වූ ප්‍රමාණයක් මුදලින් ගෙවීමට සමාන ලෙස සලකනු ලැබිය යුතුය.

(4) පවාරණය කරන ලද ස්කන්ධය සම්පූර්ණයෙන් ගෙවනු නොලැබූ හෝ සම මිළට අඩුවෙන් නිකුත්කරනු ලද්ද වූ හෝ සම මිළට වැඩියෙන් හෝ අඩුවෙන් බේරාගත හැකි වූ අවස්ථාවක, ඒ ස්කන්ධය පවාරණය කිරීම—

(අ) ඒ ස්කන්ධයේ ප්‍රකාශිත අගයේ නියමිත කොටසට සමාන මුදලක; හා

(ආ) ඒ ස්කන්ධයේ උපචිත පොළියේ

එකතුවට සමාන ප්‍රමාණයක් මුදලින් ගෙවීමට සමාන ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ, යම් ස්කන්ධයකට අදාලව "නියමිත කොටස" යන්නෙන්, 74 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් කොටසක් අදහස් වේ. එම කොටස, ස්කන්ධය සඳහා මුලින්ම දයක වූ මුදලින් හෝ ස්කන්ධය බේරුම් කිරිම සඳහා ගෙවිය යුතු මුදලින් වඩා අඩු මුදලට නොඅඩු වූ කොටසක් විය යුතුය.

(5) මේ වගන්තිය යටතේ යම් තැනැත්තෙකු විසින් ස්කන්ධයක් පවාරණය කිරීම, ඔහු විසින් ගෙවනු ලැබිය යුතු බුදල් බද්ද ඉක්මවන මුදලකින් ගෙවීම හා සමාන වශයෙන් (3) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය යටතේ සලකන අවස්ථාවක අතිරික්තය පහත දැක්වෙන ආකාරයට බැහැර කළ යුතු ය:—

(අ) අතිරික්ත මුදල් ප්‍රමාණය රුපියල් එක් සියයකට නොඅඩු අවස්ථාවක—

(i) එහි සංයුක්ත රුපියල් එක් සියයේ එක් එක් සම්පූර්ණ මුදල ඒකකයක් ලෙස ගණන් ගත යුතු අතර, භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි එක් එක් ඒකකය හෝ ඒකක දෙකකකින් හෝ ඊට වැඩි ගණනකින් යුත් එක් එක් සමූහය, පවාරණය කරන ලද ස්කන්ධය වශයෙන් නිකුත් කරන ලද එම ස්කන්ධයේ ආකාරයෙන් ම ආපසු දිය යුතු ය; තව ද

(ii) ඒකකයක යම් නොගෙවූ කොටසක් මුදලින් ආපසු දිය යුතු ය; තව ද

(ආ) අතිරික්ත මුදල් ප්‍රමාණය රුපියල් එක් සියයට අඩු අවස්ථාවක, ඒ මුදල ඒ මුදලින් ආපසු දිය යුතුය.

**36.** (1) මියගිය තැනැත්තාගේ මරණය සිදු වූ දින සිට මාස දෙළහක් ඉකුත් වූ පසු නොගෙවා ඇත්තාවූ සියලු බුදල් බදුවලට වර්ෂයකට සියයට අට බැගින් ද, ඒ දින සිට මාස තිස් හයක් ඉකුත් වූ පසු නොගෙවා ඇත්තා වූ සියලු බුදල් බදුවලට වර්ෂයකට සියයට දෙළහ බැගින් ද වූ සුළු පොළිය ගෙවනු ලැබිය යුතු ය.

(2) එබදු කාලයක් ආරම්භයේදී නොගෙවා ඇති බදු ප්‍රමාණයට, ලිත් මාස තුනක සම්පූර්ණ කාලයක් සඳහා පොළිය ගණන් බැලිය යුතු ය. මරණය සිදු වූ දිනයේ සිට මාස දෙළහක් ඉකුත් වීමෙන් පසුව එළඹෙන මාසයේ පළමුවන දින, එකී පළමුවන කාලය ආරම්භ විය යුතුය.

(3) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු පොළිය, ගෙවීම පැහැර හරින ලද බුදල් බද්දේ කොටසක් ලෙස අයකර ගනු ලැබිය යුතු ය.

(4) යම් බද්දක් ගෙවීමට යටත් යම් තැනැත්තකු ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් මිය ගිය තැනැත්තාගේ බූදලයට ආපසු ගෙවිය යුතු යම් මුදලකින් හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි මියගිය තැනැත්තාගේ බැරට ඇති මුදල් වලින් හෝ කොමසාරිස් ජනරාල් වරයා අනුමත කළ යම් විශ්‍රාම වැටුපකින් නැතහොත් අර්ථසාධක අරමුදලකින් මියගිය තැනැත්තාට ගෙවනු ලැබීමට ඇති මුදල් වලින් හෝ අවස්ථාවෝචිත පරිදි ඒ බද්ද හෝ එහි යම් වාරිකයක් ගෙවීමට කටයුතු පිළියෙල කර ඇති බවට ඒ බද්ද හෝ වාරිකයක් ගෙවීමට තමාට නියමකර ඇති දිනයෙහි හෝ එදිනට පෙර කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් කරන්නා වූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ බද්ද හෝ වාරිකය ගෙවීම සඳහා වැඩිපුර කාලයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට දෙනු ලැබිය හැකි ය. ඒ වැඩිපුර දෙන ලද කාලය ඉකුත්වන තුරු අවස්ථාවෝචිත පරිදි, ඒ බද්ද හෝ වාරිකය, ගෙවීම, පැහැර හරින ලද බද්දක් හෝ වාරිකයක් ලෙස නොසැලකිය යුතු අතර, එසේ වැඩිපුර කාලය දෙන ලද්දේ යම් දිනයක ද ඒ දිනයෙන් ආරම්භව ඒ වැඩිපුර දුන් කාලය ඉකුත් වන දිනයෙන් අවසාන වන කාලය තුළ දී ඒ බද්ද හෝ වාරිකය සඳහා පොළියක් නොගෙවිය යුතුය.

(5) 28 (2) වන වගන්තිය යටතේ කරන ලද අතිරේක තක්සේරු කිරීමක් උද්ගත වන බූදල් බද්දේ කොටස වෙනුවෙන් පොළිය ගෙවිය යුතු වන අවස්ථාවක, ඒ අතිරේක තක්සේරුව කිරීමේ දී වූ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, ඒ පොළිය අතහැරීම හෝ අඩු කිරීම කොමසාරිස් ජනරාල් වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(6) බූදල් බද්ද තක්සේරු කරනු නොලැබ ඇති අවස්ථාවක, පසුව තක්සේරු කරනු ලැබිය යුතු බූදල් බද්ද වෙනුවෙන් යම් මුදලක් බද්ද ගෙවීමට යටත් පොල්මෑකරු හෝ වෙනත් තැනැත්තා විසින්, කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය හැකි ය; තවද, තක්සේරු කරනු ලැබූ කල්හි එසේ ගෙවන ලද යම් මුදලක් ඒ තැනැත්තාගෙන් අය විය යුතු බූදල් බද්දට විසර්ජනය කළ යුතු ය.

**37.** මේ පනත යටතේ පොළිය හා බූදල් බද්ද වශයෙන් යම් තැනැත්තකු විසින් යම් මුදලක් ගෙවිය යුතු වන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් කරන ලද යම් ගෙවීමක් පළමුව පොළියටත් අනතුරුව බූදල් බද්දටත් විසර්ජනය කරනු ලැබිය යුතු ය.

38 (1) මියගිය තැනැත්තකුගේ බූදලය සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් නිශ්චල දේපළවලින් සමන්විත වන්නේ යයි ද බූදල් බද්ද ගෙවීම සඳහා ඇති බූදලයට අයත් චංචල දේපළ ඒ ගෙවීම සඳහා ප්‍රමාණවත් නැතැයි ද කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන්නේ නම්, නියම කරනු ලැබිය හැකි යම් නියමයන්ට, කොන්දේසිවලට හා කාර්ය පටිපාටියට යටත්ව, සමාන අර්ධ වාර්ෂික වාරික දහසයකට නොවැඩි ගණනකින් බූදල් බද්ද ගෙවීම කොමසාරිස් ජනරාල්වරයා විසින් පිළිගනු ලැබිය හැකි ය. එබඳු වාරික වලින් පළමුවන වාරිකය මියගිය තැනැත්තාගේ මරණය සිදු වූ දින සිට මාස හයක් ගතවන දිනයක දී ගෙවිය යුතු වන්නේය.

(2) කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඇප තබන තෙක්, හා ඇප තබතහොත් මිස, වාරික වලින් බූදල් බද්ද ගෙවීමට කිසිම තැනැත්තෙකුට අවසර දෙනු නොලැබිය යුතු ය.

(3) බූදල් බද්ද වාරික වලින් ගෙවීමට අවසර දෙනු ලැබ ඇති තැනැත්තකු විසින් එය ගෙවිය යුතු දිනට පසු දින විසි අටක් ඇතුළත එවැනි යම් වාරිකයක් ගෙවීම පැහැර හරින අවස්ථාවක, ඉතිරි වාරික, ගෙවීම පැහැර හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, නොගෙවා ඉතිරිව ඇති මුලු බූදල් බදු ප්‍රමාණය, ගෙවීම පැහැර හරිනු ලැබ ඇති බූදල් බදු අයකර ගැනීම සඳහා මේ පනතෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට අය කරගනු ලැබිය හැකිය.

## XII වන පරිච්ඡේදය

### ගෙවීමේ හා නිදහස් කිරීමේ සහතිකය

**39.** (1) තමා ගෙවීමට යටත් සියළු බූදල් බදු ගෙවීම, යම් පොල්මඃකරුවකු විසින් කරනු ලැබූ විට හෝ කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ගෙවීම සඳහා ඇප වූ විට, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ බවට සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතුය. බූදල් බද්ද ගෙවනු ලැබුවේ හෝ එය ගෙවීම සඳහා ඇපවූයේ යම් දේප-ළක් සම්බන්ධයෙන් ද ඒ දේපළ පිළිබඳ ප්‍රකාශයේ පිටපතක් ද ඊට ඇමිණිය යුතුය.

(2) මේ පනත යටතේ බූදල් බද්ද ගෙවීමට යම් පොල්මඃකරුවකු යටත් නොවන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ බවට වූ සහතිකයක්, බූදල් බද්ද නොගෙවිය යුත්තේ යම් දේපලක් සම්බන්ධයෙන් ද ඒ දේපළ පිළිබඳ ප්‍රකාශයේ පිටපතක් ද ඊට අමුණා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතුය.

**40.** (1) මිය ගිය තැනැත්තෙකු මිය යාමේ දී සංක්‍රමණය වන, මේ පනත යටතේ පොල්මඃකරුවකු විසින් බූදල් බද්ද ගෙවීමට යටත් වන සියලු දේපළ සම්බන්ධයෙන් සම්පූර්ණ බූදල් බද්ද ගෙවනු ලැබ ඇති බවට හෝ ගෙවනු ලබන බවට සෑහීමට පත් වූ කල්හි, පොල්මඃ-කරු විසින් ඉල්ලා සිටිනු ලැබේ නම් ඒ බවට වූ සහතිකයක්, ඒ සහතිකයේ සඳහන් දේපළ, බූදල් බද්ද තවදුරටත් අයකර ගැනීමේ යම් හිමිකම් පෑමකින් නිදහස් කරමින්, කොමසාරිස් ජනරාල් වරයා විසින් දෙනු ලැබිය යුතු ය.

(2) මිය යාමකින් සංක්‍රමණය වන යම් දේපළක් සම්බන්ධයෙන් බූදල් බද්ද ගෙවීමට පොල්මඃකරුවකු නොවන තැනැත්තකු යටත් වන අවස්ථාවක, 24 වන වගන්තිය යටතේ, ඒ දේපළ ගැන සඳහනක් ඇතුළත් ප්‍රකාශයක් පොල්මඃකරු විසින් භාර දී නොමැති නම්, ඒ තැනැත්තා විසින්, තමාගේ උපරිම දැනුමට හා විශ්වාසයට අනුව ඒ මිය යාමේ දී සංක්‍රමණය වන සියලු දේපළ හා ඊට හිමිකම් ඇති ඒ ඒ තැනැත්තන් පිළිබඳ වූ සම්පූර්ණ ප්‍රකාශයක් කොමසාරිස් ජනරල්වරයා වෙත සපයනු ලැබිය යුතු ය; තව ද ඉල්ලුම්කරු යටත් වන්නේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළ සම්බන්ධයෙන් බූදල් බද්ද ගෙවිය යුතු අනුප්‍රමාණය කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි අතර, ඒ අනුප්‍රමාණය අනුව බද්ද ගෙවනු ලැබූ කල්හි, ඒ දේපළ අදාල වන තාක් දුරට, බූදල් බද්ද තවදුරටත් අයකර ගැනීමේ යම් හිමිකම් පෑමකින් ඒ දේපළ සහ ඉල්ලුම්කරු නිදහස් කරනු ලැබිය යුතු ය. තව ද ඒ නිදහස් කිරීම පිළිබඳ සහතිකයක් කොමසාරිස් ජනරාල් වරයා විසින් දෙනු ලැබිය යුතු ය.

(3) පොල්මඃකරුගේ හෝ මියගිය තැනැත්තා මිය යාමේ දී සංක්‍රමණය වන යම් දේපලකට සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුගේ ඉල්ලීමක් මත ඒ බූදලය සම්බන්ධයෙන් ගෙවිය යුතු බූදල් බද්ද හා ඒ සඳහා වූ පොළියද සමග බූදලයේ කොටසක් වන වෙනත් දේපල සම්බන්ධයෙන් ගෙවිය යුතු බූදල් බදු ප්‍රමාණය ගැන සැලකිල්ලක් දක්වමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට ගෙවීමට නියම කරනු ලැබිය හැකි යම් අතිරේක මුදල් ප්‍රමාණය ද ගෙවනු ලැබූ විට සහතිකයේ සඳහන් දේපළ, බූදල් බද්ද සඳහා වූ තවදුරටත් යම් හිමිකම් පෑම්වලින් නිදහස් කෙරෙන සහතිකයක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) වංචා කිරීමක් හෝ වැදගත් කරුණු හෙළිකිරීම පැහැර හැරීමක් කරන ලද විට, මේ වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයාගේ සහතිකයකින් යම් තැනැත්තකු හෝ දේපළක් හෝ බූදල් බද්දෙන් නිදහස් නොකරනු ලැබිය යුතු අතර, මියයාමේදී සංක්‍රමණය වී ඇති බවට පසුව සොයාගනු ලැබූ දේපළ (4) වන... 

එසේ වුව ද සහතිකයේ ඇතුළත් යම් දේපළක් සම්බන්ධයෙන් ගෙවිය යුතු සම්පූර්ණ බුද්දල් බද්ද නිදහස් කිරීමක් යයි අදහස් කෙරෙන සහතිකයකින්, දූෂිමක් නොමැති අගනා ප්‍රතිශ්‍යාවක් සඳහා වූ නිර්ව්‍යාජ ගැණුම්කරුවකු එවැනි යම් වංචා කිරීමක් හෝ පැහැර හැරීමක් තිබුණේ වී නමුදු බුද්දල් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

**41.** කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද යම් සහතිකයක කරන ලද යම් ප්‍රකාශයක්, පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලබන තුරු, නිවැරදි බවට පූර්වානුමානය කරනු ලැබිය යුතු ය. පටහැනි තත්ත්වය ඔප්පු කිරීමක් නොමැති විට, අධිකරණයක් විසින් එවැනි යම් ප්‍රකාශයක් පිළිබඳව වැඩිදුර ඔප්පු කිරීම නියම නොකර එය මත ක්‍රියා කළ යුතුය.

**42**. (අ) මේ පනත යටතේ පොල්මංකරු විසින් ගෙවීමට බැඳී ඇති බුද්දල් බද්ද ගෙවූ බවට හෝ ගෙවීම සඳහා ඇප වූ බවට, නැතහොත් මේ පනත යටතේ බුද්දල් බද්ද ගෙවීමට පොල්මංකරු බැඳී නැති බවට වූ සහතිකය කොමසාරිස් ජනරාල් වරයා විසින් නිකුත් කරනු ලබන තුරු; හා

(ආ) එසේ නිකුත් කරන ලද සහතිකය අධිකරණයට ඉදිරිපත් කරනු ලබන තුරු මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් අධිකරණය විසින් කිසිදු ප්‍රොබෙට් බල පත්‍රයක් හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයක් ප්‍රදානය නොකරනු ලැබිය යුතු ය.

**43**. මියගිය තැනැත්තකු මිය යාමේ දී සංක්‍රමණය වන දේපළවලට—

(අ) 4 (ඈ) වගන්තියේ අර්ථානුකූලව රක්‍ෂණ ඔප්පුවක් වන, මිය ගිය තැනැත්තා තම ජීවිතය සම්බන්ධයෙන් ඇති කළ රක්‍ෂණ ඔප්පුවක් යටතේ ලැබෙන මුදලක්; හෝ

(ආ) මියගිය තැනැත්තාට සහ වෙනත් යම් තැනැත්තකුට බැර වනසේ යම් බැංකුවක හෝ ආයතනයක හෝ යම් තැනැත්තකු වෙත හෝ තැන්පත් කළ මුදලක්

ඇතුළත් වන අවස්ථාවක දී, යම් කොන්ත්‍රාත්තුවක ගිවිසුමක හෝ ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, යම් තැනැත්තකු විසින්—

(i) (අ) ඡේදයේ සඳහන් මුදලින් යම් කොටසක්; හෝ

(ii) (ආ) ඡේදයේ සඳහන් මුදලින් අඩකට වඩා වැඩි මුදලක් හෝ

කොමසාරිස් ජනරාල්වරයාගේ මුද හැරීමේ සහතිකයක් ලබා ගැනීමෙන් පසුව හැර මිය ගිය තැනැත්තාගේ මරණයෙන් පසු ඒ මුදලට හිමිකමක් ඇති යම් තැනැත්තකුට, ගෙවීම නීත්‍යානුකූල නොවිය යුතුය.

## XIII වන පරිච්ඡේදය

### බුද්දල් බදු අයකර ගැනීම

**44.** (1) යම් තැනැත්තකු විසින් බුද්දල් බද්ද ගෙවූ විට ප්‍රොබෙට් බලපත්‍රයකට හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයකට තමා හිමිකම් ලබන බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පුකර, ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බුද්දල් බද්ද වෙනුවෙන් යම් මුදලක් මියගිය තැනැත්තාගේ බූදලයේ කොටසක් වන යම් මුදලකින් හෝ ණය වලින් එකතුකර ගන්නා ලෙස කොමසාරිස් ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටින අවස්ථාවකදී, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින්, මියගිය තැනැත්තාගේ බූදලය සම්බන්ධයෙන් ගෙවිය යුතු බුද්දල් බද්ද පියවීමට ප්‍රමාණවත් යයි කොමසාරිස්

ජනරාල්වරයා විසින් සලකනු ලැබිය හැකි ඒ මුදල්වල හෝ ණයවල ප්‍රමාණය, ඒ දැන්වීමෙහි සඳහන් ආකාරයට සහ එහි සඳහන් කාලය ඇතුළත ගෙවීමට ඒ මුදල් දරණ නැතහොත් ඒ ණය ගෙවිය යුතු තැනැත්තාට හෝ තැනැත්තන්ට නියම කරනු ලැබිය හැකිය.

(2) කොමසාරිස් ජනරල් වරයා විසින් (1) වන උපවගන්තිය ප්‍රකාර දැන්වීමක් යවනු ලැබූ යම් තැනැත්තකු විසින්, යම් ලිඛිත නීතියක, කොන්ත්‍රාත්තුවක හෝ ගිවිසුමක කුමක් සඳහන් වුව ද, මියගිය තැනැත්තාගේ බූදලය වෙනුවෙන් ඔහු දරන්නා වූ නැත-හොත් ඒ බූදලයට ඔහු විසින් ගෙවිය යුතු වූ මුදලේ ප්‍රමාණයට ඒ දැන්වීම අනුව ක්‍රියා කළ යුතු වන අතර, ඒ යටතේ කරන ලද කවර වූ හෝ ගෙවීමක් සම්බන්ධයෙන් සියළු සිවිල් හෝ අපරාධ නඩු කටයුතු වලට ප්‍රතිපක්ෂව මෙයින් ඒ තැනැත්තා වග කීමෙන් ආරක්‍ෂා කරනු ලැබේ.

(3) යම් තැනැත්තකු මිය ගිය තැනැත්තාගේ බූදලයට යම් ණයක් ගෙවීමට නියමිත දිනයට කලින් කවර වූ හෝ අවස්ථාවක, ඒ තැනැත්තාගෙන් ඒ ණය එකතුකර ගැනීමට හෝ අයකර ගැනීමට (1) වන උපවගන්තියෙහි හෝ (2) වන උපවගන්තියෙහි කිසිවකින් කොමසාරිස් ජනරාල්වරයාට බලය නොලැබෙන අතර, එසේ බලය ලැබේ යයි නොසලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද දැන්වීමක් මගින් ගෙවීමට නියම කරන ලද යම් මුදලක් ඒ දැන්වීම ප්‍රකාර ගෙවා නොමැති අවස්ථාවක, ඒ මුදල, ඒ දැන්වීම යොමු කරනු ලැබූ තැනැත්තාගෙන් අය විය යුතු බූදල් බද්දක් සේ සහ ඒ බූදල් බද්ද ගෙවීම පැහැර හරිනු ලැබූ සේ ඒ තැනැත්තාගෙන් අය කර ගත හැකි විය යුතු ය.

45. (1) යම් බූදල් බද්දක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති කවර වූ හෝ ආකාරයකින් ඒ බද්ද අයකර ගැනීමට කටයුතු කිරීමට පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින්—

(අ) ඒ බූදල් බද්දේ විස්තර; සහ

(ආ) ඒ බූදල් බද්ද අයකර ගැනීම සඳහා කටයුතු කිරීමට අදහස් කරනු ලබන බව සඳහන් කරමින් පැහැර හරින්නා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් නිකුත් කළ යුතුය.

(2) ඒ බූදල් බද්ද අය කරනු ලබන්නේ යම් තක්සේරුවක් සම්බන්ධයෙන් ද ඒ තක්සේරුවට විරුද්ධව 29 වන වගන්තියෙහි සඳහන් කාලය ඇතුළත ඒ පැහැර හරින්නා අභියාචනය කර නොමැති නම්, ඔහු විසින්, ඒ දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත දී එසේ නියම කරනු ලැබූ බූදල් බද්දට යම් විරෝධතාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. 31 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද කොමසාරිස් ජනරාල්වරයා විසින් විරෝධතා-වන් සලකා බලා ඒ පිළිබඳ ව තම තීරණය දිය යුතු අතර, ඒ තීරණය අවසානාත්මක විය යුතුය.

46. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින්, බූදල් බද්ද එකතු කරන්නන් වශයෙන් තැනැත්තන් පත් කරනු ලැබිය හැකිය.

(2) (අ) යම් බූදල් බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ බූදල් බද්ද පිළිබඳ විස්තර ද එය ගෙවිය යුතු තැනැත්තාගේ නම සහ ලිපිනය ද ඇතුළත් සහතිකයක් දිසාපතිවර-යකු, උප දිසාපතිවරයකු, පිස්කල්වරයකු, නියෝජ්‍ය පිස්කල්වරයකු හෝ බූදල් බද්ද එකතු කරන්නකු වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. බූදල් බද්ද ගෙවීම පැහැර හැර ඇත්තේ යම් තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා මියයාමේ දී සංක්‍රමණය වූ චංචල දේපළ තහනමට ගැනීමෙන් හා විකිණීමෙන් සහතිකයේ නම් කොට ඇති තැනැත්තාගෙන් බූදල් බද්ද අය කර ගනු ලැබීමට සැලැස්වීම පිණිස ඒ සහතිකය නිකුත් කරන ලැබූ නිලධරයාට බලය පැවරෙන අතර, එසේ කරන ලෙස ඒ නිලධරයාට මෙයින් නියම කරනු ලැබේ.

(ආ) චංචල දේපළක් තහනමට ගැනීම ඊට ඉතාම යෝග්‍ය යයි ඒ නිලධරයා කල්පනා කරන ආකාරයට කළ යුතු අතර, ඒ නිලධරයා විසින් යම් චංචල දේපළක් තහනමට ගත් වහාම ඔහු විසින් ඒ දේපළවල ලැයිස්තුවක් නොපමාව පිළියෙල කොට, එහි අත්සන් කර, පැහැර හරින්නාට එය දිය යුතු ය; තව ද එහි පිටපතක් කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

(ඇ) එසේ තහනමට ගනු ලැබූ දේපළ—

( i ) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් වන අවස්ථාවක, ගෙවීම පැහැර හරිනු ලැබූ මුදල් බද්ද පියවීමෙහි ලා එය යෙදිය යුතුය;

( ii ) විදේශීය ව්‍යවහාර මුදල් වන අවස්ථාවක, ඒ මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තැන්පත් කළ යුතු අතර, ඉන් උපලබ්ධි වන මුදල්, ගෙවීම පැහැර හරින ලද බද්ද පියවීමෙහි ලා යෙදිය යුතුය.

(iii) මුදල් නොවන අවස්ථාවක, පැහැර හරින්නා විසින් වියදම් හා ගාස්තු ගෙවීමට යටත් ව, ඒ දේපළ දින පහක් තබා ගත යුතු ය. පැහැර හරින්නා විසින් වියදම් හා ගාස්තු සහිතව මුදල් බද්ද ඉහත කී දින පහ ඇතුළත නොගෙවනු ලැබුවහොත්, දිසාපතිවරයා, උප දිසාපතිවරයා, පිස්කල්, නියෝජ්‍ය පිස්කල් හෝ මුදල් බද්ද එකතු කරන්නා විසින් ඒ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය යුතු ය; නැතහොත් ඒ දේපළ ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක් හෝ යම් සංස්ථාවක හෝ පොදු සමාගමක හෝ කොටසක් වූ අවස්ථාවක, බ්‍රෝකර්වරයකු මගින් එදින පවතින වෙළඳ අගය අනුව ඒ දේපළ විකිණීමට සැලැස්විය යුතු ය.

(ඈ) (ඇ) ඡේදයේ (iii) වන අනුඡේදයෙහි සඳහන් විකිණීමකින් ලැබූ මුදල්—

( i ) පළමුව, දේපළ තහනමට ගැනීමේ, තබා ගැනීමේ හා විකිණීමේ වියදම් හා ගාස්තු ගෙවීම පිණිසද;

( ii ) දෙවනුව, ගෙවීම පැහැර හැර ඇති මුදල් බද්ද ගෙවීම පිණිස ද යෙදිය යුතු ය. තව ද යම් ශේෂයක් වෙතොත් එය මුදල් නඩුගෙව බැරට පත් කළ යුතු ය.

(3) කොමසාරිස් ජනරාල්වරයා විසින් මේ වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කෙරෙන කවර වූ හෝ අවස්ථාවක, සහතිකයෙහි නම් කොට ඇති තැනැත්තා වෙත ඒ වේලාවෙහි දී ම ඒ පිළිබඳ නිවේදනයක්, පෞද්ගලිකව බාරදීමෙන් හෝ තැපැලෙන් යවනු ලබන ලියාපදිංචි කළ ලිපියක් මගින් හෝ විදුලි පුවතක් මගින් නිකුත් කළ යුතු ය; එහෙත් ඒ තැනැත්තාට ඒ නිවේදනය නොලැබීම හේතු කොට ගෙන මේ වගන්තිය යටතේ වූ කටයුතු බල රහිත නොවිය යුතු ය.

47. (1) යම් මුදල් බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ මුදල් බද්ද පිළිබඳ විස්තර ද එය ගෙවිය යුතු තැනැත්තාගේ නම සහ ලිපිනය ද මුදල් බද්ද අය කර ගනු ලබන්නේ යම් දේපළක් විකිණීමෙන් නම් ඒ දේපළ පිළිබඳ උපලේඛනයක් ද ඇතුළත් වන්නා වූ, එකතු කිරීමේ සහතිකයක් යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලබන සහතිකයක්, උචිත දිසා අධිකරණය වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකිය; කොමසාරිස් ජනරාල්වරයා සුදුසු යයි කල්පනා කරන්නේ නම්, දේපළ සඳහා අවම මිලක් ද සඳහන් කළ හැකි අතර, ඒ මිලට අඩුවෙන් ඒ දේපළ නොවිකිණිය යුතු ය. එවිට ඒ දේපළ හෝ ඒ දේපළින් පිස්කල් හෝ නියෝජ්‍ය පිස්කල් හෝ විසින් අවශ්‍ය යයි සැලකිය හැකි යම් කොටසක් තහනමට ගෙන කොමසාරිස් ජනරාල්වරයා විසින් සඳහන් කරන ලද යම් මිලක් වෙතොත් ඒ මිලට නොඅඩු මිලකට විකිණීමට නියම කරමින් දිසා අධිකරණය විසින් ඒ පිස්කල් හෝ නියෝජ්‍ය පිස්කල් වෙත රිට් ආඥාවක් නිකුත් කළ යුතු අතර, ඒ තහනමට ගැනීම හා විකිණීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 සිට 297 දක්වා වූ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(2) මේ පනත යටතේ දිසා අධිකරණයක් වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් මත ඒ අධිකරණය විසින් බූදල් බද්ද ගෙවීම සඳහා තීන්දු ප්‍රකාශයක් සටහන් කර ඇති නඩුවක දී මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

48. (1) ගෙවීම පැහැර හරින ලද බූදල් බද්ද අයකර ගැනීම තහනමට ගැනීමෙන් හා විකිණීමෙන් ක්‍රියාත්මක කළ නොහැකි බව හෝ අවස්ථාවෝචිත නොවන බව හෝ කොමසාරිස් ජනරාල්වරයා ගේ මතය වන කවර වූ හෝ අවස්ථාවක, නැතහොත් තහනමට ගැනීමෙන් හා විකිණීමෙන් සම්පූර්ණ බූදල් බදු මුදල අයකර ගනු නොලැබූ අවස්ථාවක, ඒ බූදල් බද්දේ විස්තර ද පැහැර හරින්නාගේ නම සහ අන්තිමට දනා සිටි වාසස්ථානය ද ඇතුළත් සහතිකයක්, ඒ වාසස්ථානය පිහිටි කොට්ඨාශය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත්කරනු ලැබිය හැකි ය. එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් බූදල් බද්ද අයකර ගැනීම සඳහා ඒ ගෙවීම පැහැර හරින්නාට විරුද්ධව තවදුරටත් නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන්දැයි කරුණු දක්වීමට ඔහු තමා ඉදිරියට කැඳවිය යුතු ය. තව ද ප්‍රමාණවත් කරුණු නොදක්වනු ලැබුවහොත් ගෙවීම පැහැර හරින ලද බද්ද, දඩයකින් පමණක් දඬුවම් කළ යුතු හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් නොකළ යුතු වරදක් සඳහා, මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් ඒ පැහැර හරින්නාට නියම කරන ලද දඩයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එවිට, එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධාන (එහි (අ), (ඇ) සහ (එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ විය යුතු ය. තව ද ඒ දණ්ඩන නියමය කරන අවස්ථාවේ දී, ඒ උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකි වූ යම් විධානයක් ඔහු විසින් කළ හැකි ය.

(2) (1) වන උප වගන්තියේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිවැරදි බව මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රශ්න කිරීම හෝ විභාග කිරීම නොකළ යුතු අතර, ඒ අනුව ඒ සහතිකයෙහි ඇති යම් ප්‍රකාශයක නිවැරදි බව සලකා බැලීමට හෝ තීරණය කිරීමට හෝ ගෙවීම පැහැර හැරිය බද්ද නියම කරනු ලැබ ඇත්තේ යම් තක්සේරුවක් සම්බන්ධයෙන් ද ඒ තක්සේරුවට විරුද්ධව අභියාචනයක් විනිශ්චයට භාජන ව තිබීමේ හේතුව නිසා ම පමණක් ඒ නඩු කටයුත්ත කල් දැමීමට හෝ විලම්බනය කිරීමට හෝ ඒ උප වගන්තියෙහි වූ කිසිවකින් මහෙස්ත්‍රාත්වරයෙකුට බලය නොපැවරෙන්නේ ය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) සිට (5) තෙක් වූ උපවගන්තිවල කිසිවක්, මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් කවර වූ හෝ අවස්ථාවකට අදාළ නොවිය යුතු ය.

(4) ගෙවීම පැහැර හරින්නකු වෙත දඩයක් නියම කරන ලද ලෙස (1) වන උපවගන්තිය යටතේ සැලකෙන යම් අවස්ථාවක, ඒ දඩ මුදල ගෙවීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් කල් දෙනු ලැබිය හැකිය; නැතහොත් ඒ මුදල වාරික මගින් ගෙවන ලෙස විධාන කරනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හේතු දක්වීම සඳහා ඒ උපවගන්තිය යටතේ කල් දීමෙහි හෝ දඩය ගෙවීම සඳහා (4) වන උපවගන්තිය යටතේ කල් දීමෙහි හෝ පූර්ව ගම්‍ය කොන්දේසියක් වශයෙන්, අධිකරණය විසින් ඇප මුදල් නියම කරනු ලැබිය හැකි ය. තව ද ගෙවීම පැහැර හරින්නාට ඇප දීම නියම කරනු ලබන අවස්ථාවක, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(6) යම් ගෙවීමක් වාරික මගින් ගෙවීමට (4) වන උපවගන්තිය යටතේ විධාන කරනු ලැබ තිබිය දී ඉන් කවර වූ හෝ වාරිකයක් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ වන විට නොගෙවා ඉතිරිව ඇති සියලු ම වාරිකයන් ගෙවීම පැහැර හැර තිබුණු පරිදි නඩු කටයුතු පැවැත්විය හැකි ය.

49. (1) මිය ගිය තැනැත්තෙකුගේ මරණයේ දී ගෙවිය යුතු බූදල් බද්ද ගෙවීම පැහැර හැර ඇත්තා වූ ද—

(අ) යම් තැනැත්තකු, මිය ගිය තැනැත්තාගේ බූදලය සඳහා හෝ ඒ බූදලය නිසා පොල්මඃකරුවකුට යම් මුදලක් ගෙවීමට සූදනම්ව සිටිය හැකි බව; හෝ

(ආ) යම් තැනැත්තකු, ඒ බූදලය සඳහා හෝ ඒ බූදලය නිසා යම් මුදලක් තබාගෙන සිටිය හැකි බව; හෝ

(ඇ) යම් තැනැත්තකු, ඒ බූදලය සඳහා හෝ ඒ බූදලය නිසා පොල්මඃකරුවකුට යම් මුදලක් ගෙවීම පිණිස වෙනත් යම් තැනැත්තකුගෙන් බලය ලබා සිටිය හැකි බව; හෝ

(ඈ) යම් තැනැත්තකු තමා විසින් පොල්මඃකරුවකුට ගෙවනු ලැබුයේ නම්, ඔහු විසින් ඒ බූදලයට බැර කරනු ලැබීමට නියමිත මුදලක් ඒ බූදලය සඳහා හෝ ඒ බූදලය නිසා ගෙවීමට බැඳී සිටිය හැකි බව,

කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන්නා වූ ද අවස්ථාවක, ගෙවීම පැහැර හරින ලද බූදල් බද්දේ මුදල් ප්‍රමාණය නොඉක්මවන යම් මුදලක් දැන්වීමෙහි විධානය කර ඇති පරිදි ගෙවන ලෙස නියම කරන ලිඛිත දැන්වීමක් ඒ තැනැත්තාට කොමසාරිස් ජනරාල්වරයා විසින් දෙනු ලැබිය හැකි ය. ඒ දැන්වීම ලැබුණු දිනයෙහි දී දැන්වීම ලැබූ තැනැත්තාගේ අතෙහි ඇති හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ ඔහු විසින් ගෙවනු ලැබීමට සූදනම් වන නැතහොත්, ඒ දිනට පසු දින තිහක කාලය ඇතුළත යම් අවස්ථාවක, ඔහු අතට පත් වන හෝ ඔහුගෙන් අයවිය යුතු වන හෝ ඔහු විසින් ගෙවනු ලැබීමට සූදනම් වන යම් මුදලකට ඒ දැන්වීම අදාළ විය යුතු ය.

(2) මේ වගන්තිය ප්‍රකාර ගෙවන ලද යම් බූදල් බද්දක් 58 වන වගන්තියේ අර්ථානුකූලව වෙනත් තැනැත්තකු වෙනුවෙන් ගෙවන ලද්දක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(3) (1) වන උප වගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට, ප්‍රස්තුත මුදල ඒ වගන්තියේ සඳහන් දින තිහක කාලය ඇතුළත ඔහුගේ අතට පත් නොවීමේ හේතුවෙන් හෝ ඔහුගෙන් අයවිය යුතු නොවීමේ හේතුවෙන් ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වූ විට, ඔහු විසින් ඒ කාලය ඉකුත් වී දින දහහතරක් ඇතුළත ඒ දැන්වීම අනුව ඔහුට ක්‍රියා කිරීමට නොහැකි වූ කරුණු කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

(4) (1) වන උප වගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට, ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි ඒ ඇත්තා වූ ද, (3) වන උපවගන්තියෙන් නියම කර ඇති පරිදි කොමසාරිස් ජනරාල්වරයාට දැනුම්දීම ඒ තැනැත්තා විසින් පැහැර හැර ඇත්තා වූ ද අවසස්ථාවක, නැතහොත් දැන්වීම අදාළ වන බූදල් බද්ද හෝ ඉන් යම් කොටසක් ඒ තැනැත්තා විසින් අඩු කර ගනු ලැබ හෝ අඩුකර ගැනීමට හැකිව තිබී, ඒ බූදල් බද්ද හෝ ඉන් කොටස කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරන ලද පරිදි (1) වන උපවගන්තියෙහි සඳහන් දින තිහක කාලය ඉකුත් වීමෙන් පසු දින දහ හතරක් ඇතුළත, ගෙවා නොමැති අවස්ථාවක අඩුකර ගැනීමට ඔහුට නියම කරනු ලැබූ සම්පූර්ණ බූදල් බද්ද සඳහා ඔහු විසින් පුද්ගලිකව යටත් විය යුතු වන අතර ඒ බූදල් බදු මුදල රජයට අය විය යුතු ණයක් වශයෙන් ඔහුගෙන් අයකර ගනු ලැබිය හැකි ය.

**50.** (1) මිය ගිය තැනැත්තකු, ඔහු මිය යන විට ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු ව සිට, ඒ මිය ගිය තැනැත්තා මියයාමේ දී සංක්‍රමණය වන දේපළ සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් බූදල් බද්දක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, ගෙවීම පැහැර හැර ඇති බූදල් බදු මුදල හෝ ඒ හවුල් ව්‍යාපාරයෙහි මිය ගිය තැනැත්තා සතුව පැවති සම්බන්ධතාවේ මුදල යන දෙකින් අඩු මුදල, දැන්වීමෙහි විධාන කර ඇති පරිදි ගෙවන ලෙස නියම කරමින් මිය ගිය තැනැත්තා මිය යන විට ඒ හවුල් ව්‍යාපාරයෙහි හවුල්කරුවකු ව සිටි යම් තැනැත්තකුට කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් දෙනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය ප්‍රකාර ගෙවන ලද යම් බූදල් බද්දක් 58 වන වගන්තියේ අර්ථානුකූලව වෙනත් තැනැත්තකු වෙනුවෙන් ගෙවන ලද්දක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ දෙනු ලැබූ දැන්වීමක් අනුව ක්‍රියා නොකර සිටින අවස්ථාවක, ගෙවීම පැහැර හැර ඇති බූදල් බදු මුදල හෝ ඒ හවුල් ව්‍යාපාරයෙහි මිය ගිය තැනැත්තා සතුව, මිය යන අවස්ථාවේ දී පැවති සම්බන්ධතාවේ මුදල යන දෙකින් අඩු මුදල, ඔහුගෙන් අය විය යුතු බූදල් බද්දක් වශයෙන් මෙන් ම ගෙවීම පැහැර හැර ඇති බූදල් බද්දක් වශයෙන් ඔහුගෙන් අයකර ගත යුතු ය.

**51.** යම් තැනැත්තකුගෙන් බූදල් බද්ද අයකර ගැනීම සඳහා මේ පනතින් නියමිත විශේෂ කාර්ය පටිපාටිය මගින්, රජයට අය විය යුතු ණය අයකර ගැනීම සඳහා වෙනත් යම් ආකාරයකින් හෝ යම් ලිඛිත හෝ වෙනත් යම් නීතියක් යටතේ ඇති වෙනත් යම් කාර්ය පටිපාටියකින් එවැනි යම් බූදල් බද්දක් හෝ ඉන් කොටසක් අයකර ගැනීමට රජයට ඇති අයිතිවාසිකම කෙරෙහි බලපෑම හෝ එය අහෝසි කිරීම හෝ නොකළ යුතු අතර ඊට බලපෑමක් කෙරෙන්නේ යයි හෝ එය අහෝසි කෙරෙන්නේ යයි නොසලකනු ලැබිය යුතු ය.

**52** (1) යම් තැනැත්තකුට දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින්, ඒ තැනැත්තාගෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් අයවිය යුතු යම් බූදල් බද්දක් අයකර ගැනීමේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයාට අවශ්‍ය විය හැකි යම් තොරතුරක්, ඒ දැන්වීමෙහි නියමිත කාලය ඇතුළත සපයන මෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(2) මේ පරිච්ඡේදයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරන ලද්ද වූ හෝ භාරදෙන ලද්ද වූ බලතලවලින් හෝ කර්තව්‍යයන්ගෙන් කවරක් වුව ද කොමසාරිස් ජනරාල්වරයා විසින් තම අත්සන සහිත ලියවිල්ලකින් යම් තක්සේරුකරුවකුට පවරා දෙනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ යම් බලතල හෝ කර්තව්‍යය පවරා දෙනු ලැබූ සෑම තක්සේරුකරුවෙක් ම කොමසාරිස් ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් ව ඒ බලතල ක්‍රියාත්මක කළ යුතු ය; කර්තව්‍ය කළ යුතු ය.

**53.** මේ පරිච්ඡේදයෙහි "බද්ද" යන්නෙන් බූදල් බද්ද අදහස් වන අතර, ඒ බද්ද සඳහා ගෙවිය යුතු යම් පොළියක් ද මේ පනත යටතේ ගෙවිය යුතු යම් දඩ, දණ්ඩන, ගාස්තු, වියදම් හෝ අය කිරීම් ද ඊට ඇතුළත් වේ.

## XIV වන පරිච්ඡේදය

## විවිධ කරුණු

54. (1) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා හෝ කොමසාරිස්වරයා හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයා හෝ තක්සේරුකරුවකු විසින් දෙනු ලබන සෑම දැන්වීමක ම අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයාගේ හෝ කොමසාරිස්වරයාගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම සඳහන් විය යුතු ය. තව ද ඒ සෑම දැන්වීමක ම, කොමසාරිස් ජනරාල්වරයාගේ හෝ කොමසාරිස්වරයාගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම ඒ දැන්වීමෙහි මුද්‍රණය කර හෝ මුද්‍රා තබා හෝ ඇත්තේ නම් අවස්ථාවෝචිත පරිදි, ඒ කොමසාරිස් ජනරාල්වරයා හෝ කොමසාරිස්වරයා හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයා හෝ තක්සේරුකරු විසින් අත්සන් තබන ලද්දක් මෙන් වලංගු හා බලාත්විත විය යුතු ය.

(2) මේ පනත ප්‍රකාර දෙනු ලබන සෑම දැන්වීමක් ම යම් තැනැත්තකුට පෞද්ගලිකව හෝ ඔහු විසින් දැන්වීම් භාරදීමේ කාර්ය සඳහා සපයා ඇති ලිපිනයට හෝ අන්තිමට දන සිටි ඔහුගේ ලිපිනයට හෝ අන්තිමට දන සිටි ඔහුගේ පදිංචි ස්ථානයට නැතහොත් ඔහු ව්‍යාපාරයක් පවත්වාගෙන යන හෝ පවත්වා ගෙන යමින් සිටි යම් ස්ථානයකට ගෙන ගොස් භාරදීමෙන් නැතහොත් තැපැලෙන් යැවීමෙන් භාරදිය හැකි ය:

එසේ වුව ද, තක්සේරු දැන්වීමක් පෞද්ගලිකවම හෝ ඉහත කී යම් ලිපිනයකට හෝ ස්ථානයකට ලේඛනගත තැපැලෙන් යැවීමෙන් හෝ භාරදිය යුතුය.

(3) තැපැලෙන් යවන ලද යම් දැන්වීමක් එය තැපැල් මාර්ගයෙන් සාමාන්‍යයෙන් ලැබිය යුතු දිනයට පසු දින භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) තැපැලෙන් භාරදුන් බව ඔප්පු කිරීමෙහි ලා දැන්වීම අඩංගු ලිපිය යථා පරිදි ලිපිනය ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතුය.

(5) නිර්වාසික තැනැත්තකුට මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ භාරදෙනු ලැබීමට නියමිත සෑම දැන්වීමක් ම ඔහුගේ අනුයෝජිතයාට භාරදෙනු ලැබිය හැකිය.

(6) යම් දැන්වීමක හෝ සහතිකයක යම් තැනැත්තකුගේ නම සහ නිල නාමය සඳහන්ව ඇති සහ මේ පනත යටතේ ඔහු විසින්, එය නිකුත් කරන ලද බව ඉන් ඇඟැවෙන අවස්ථාවක, පටහැනි තත්ත්වය ඔප්පු කෙරෙන තුරු, ඒ දැන්වීම හෝ සහතිකය නිකුත් කරන ලද දිනයේදී ඒ නම දරන තැනැත්තාට ඒ නිල නාමය හිමිව තිබුණු බව පූර්වානුමානය කළ යුතුය. තවද ඒ තැනැත්තාගේ නම සහ නිලය අධිකරණය විසින් පිළිගනු ලැබිය යුතුය.

55. යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබිය යුතු යයි මේ පනතේ විධිවිධාන යටතේ නියමිත සියලු ක්‍රියා, කරුණු සහ දේවල් කිරීම සම්බන්ධයෙන් ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු, සභාපති හෝ වෙනත් ප්‍රධාන නිලධරයා වගකිව යුතුය:

එසේ වුවද, මේ පනතේ විධිවිධාන යටතේ යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් නියෝජනය කරන්නා වශයෙන් යම් තැනැත්තකුට දැන්වීමක් භාර දෙන ලද්දේ ද, ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය සමග තමාගේ සම්බන්ධයක් නොමැති බව හෝ ශ්‍රී ලංකාව නේවාසික වෙනත් යම් තැනැත්තකු ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ප්‍රධාන නිලධරයා බව හෝ ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඔහු ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ප්‍රධාන නිලධරයා වශයෙන් සලකනු ලැබිය යුතුය.

56. (1) මේ පනතින් හෝ මේ පනත යටතේ යම් තැනැත්තකු විසින් කළ යුතු යයි නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඒ තැනැත්තා අශක්‍ය තැනැත්තෙක් නම් ඔහුගේ භාරකරු විසින්ද නිර්වාසික තැනැත්තෙක් නම් ඔහුගේ අනුයෝජිතයා විසින් ද කළ යුතු යයි නියමිත ලෙස සැලකිය යුතුය.

(2) නිර්වාසික තැනැත්තකු මියගිය අවස්ථාවක, මේ පනත යටතේ බූදල් බද්ද අයකිරීමේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කල ඉල්ලා සිටිනු ලබන සියලු තොරතුරු හා විස්තර, ඒ තැනැත්තා මියයන විට ඔහුගේ අනුයෝජිතයා වූ යම් තැනැත්තකු විසින් තමාගේ උපරිම දැනීම සහ විශ්වාසය අනුව, කොමසාරිස් ජනරාල්වරයාට සපයනු ලැබිය යුතුය.

57. තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හවුල් ව්‍යාපාරයක් වශයෙන් හෝ අන්‍යාකාරයකින්, තමන් ම වෙනුවෙන් හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් තත්ත්වයකින් එක්ව ක්‍රියා කරන අවස්ථාවක දී, ඒ තත්ත්වයෙන් ක්‍රියා කරන පුද්ගලයකු විසින් කළ යුතු යයි මේ පනතේ විධිවිධාන යටතේ නියමිත සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීම සම්බන්ධයෙන් එකී තැනැත්තන් සාමූහිකව හා තනි තනිව වග කිව යුතුය.

58. (1) භාරකරු වශයෙන් බූදල් බද්ද ගෙවීමට යටත් වන්නාවූ හෝ වෙනත් තැනැත්තකු වෙනුවෙන් බූදල් බද්ද අයකර ගනු ලැබිය හැකි හෝ වෙනත් තැනැත්තකු වෙනුවෙන් බූදල් බද්ද අයකර ගනු ලැබූ සෑම තැනැත්තකු විසින් ඒ වෙනත් තැනැත්තා වෙනුවෙන් හෝ භාරකරු වශයෙන් තම තත්ත්වය අනුව තම සන්තකයට හෝ පාලනයට හෝ පත්වන වත්කම්වලින් ඒ බූදල් බදු මුදල ඉදිරිපත් කිරීමට සෑහෙන ප්‍රමාණයක් තබාගත හැකි අතර, ඒ වත්කම් තමා වෙත තබාගැනීම සම්බන්ධයෙන් වගකීමෙන් ආරක්ෂාව ඔහුට කවර වූ හෝ තැනැත්තකුට ප්‍රතිපක්ෂව ලැබිය යුතු අතර, ඒ ආරක්ෂාව ඔහුට මෙයින් සලසනු ලැබේ.

(2) යම් තැනැත්තකු විසින් භාරකරුවකු වශයෙන් ක්‍රියා කිරීමේදී, බූදල් බද්ද ගෙවන ලදුව එසේ ගෙවන ලද බූදල් බද්දේ මුදල තබා ගැනීමට තමාට හැකිවන පරිදි භාරයේ වත්කම් තමාගේ සන්තකයට හෝ පාලනයට පත් නොවන අවස්ථාවක ගෙවන ලද බූදල් බද්දේ මුදල භාරයේ අර්ථලාභීන්ගෙන් භාරකරුට අයවිය යුතු ණයක් විය යුතුය.

(3) වෙනත් තැනැත්තකු වෙනුවෙන් බූදල් බද්ද ගෙවීමට යටත් තැනැත්තකු විසින් බූදල් බද්ද ගෙවනු ලැබ හෝ ඒ තැනැත්තාගෙන් අයකරගනු ලැබ හෝ එසේ ගෙවන ලද බූදල් බද්දේ මුදල ඔහු විසින් තබා ගත හැකි පරිදි ඒ වෙනත් තැනැත්තාගේ වත්කම් කිසිවක් ඔහුගේ සන්තකයට හෝ පාලනයට හෝ පත් නොවන අවස්ථාවක, ඒ බූදල් බද්දේ මුදල ඒ වෙනත් තැනැත්තාගෙන් ඔහුට අයවිය යුතු ණයක් විය යුතුය.

59. (1) මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බූදල් බද්දේ ප්‍රමාණය අඩු කරන හෝ අඩු කිරීම ප්‍රතිඵලය විය හැකි යම් ගනුදෙනුවක් කෘත්‍රිම හෝ ව්‍යාජ බව නැතහොත් යම් නියාදනයක් ඇත්ත වශයෙන්ම ක්‍රියාත්මක නොකරන ලද බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, එවැනි යම් ගනුදෙනුවක් හෝ නියාදනයක් හෝ ඔහු විසින් නොසලකා හැරිය හැකි අතර, ඒ අනුව ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබිය යුතුය.

(2) මේ වගන්තියෙහි "නියාදනය" යන්නට යම් භාරයක්, ප්‍රදානයක් ප්‍රඥප්තියක්, ගිවිසුමක් හෝ එකඟවීමක් ඇතුළත් වේ.

60. මියගිය තැනැත්තකුගේ අන්තිම කැමති පත්‍රයෙහි පොල්මෑකරු ලෙස නම් කරන ලද හෝ පත් කරන ලද තැනැත්තකු පොල්මෑකරු වශයෙන් ධුරය භාර ගැනීමට අකමැති වන්නේ නම්, මේ පනත යටතේ පොල්මෑකරුවකුගේ බැඳීම් වලින් සහ වගකීම්වලින් නිදහස් කරන ලෙස ඔහු විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව ඉල්ලුම් කරනු ලැබිය හැකිය; තවද, ඉල්ලුම්කරු මියගිය තැනැත්තාගේ යම් දේපළක් සන්තකයට ගැනීම හෝ ඒ පිළිබඳ අයුතු මැදිහත්වීමක් හෝ කර නැති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, ඒ අනුව නිදහස් කිරීමේ සහතිකයක් ඔහු විසින් නිකුත් කරනු ලැබිය හැකිය:

එසේ වුවද, සහතිකය ලබා ගන්නා ලද්දේ වංචාවෙන් හෝ දුරර්පනය කිරීමෙන් හෝ සිද්ධි පිළිබඳ සාවද්‍ය ප්‍රකාශයක් කිරීමෙන් බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වුවහොත්, නැතහොත් සහතිකය නිකුත් කිරීමෙන් පසු යම් අවස්ථාවක ඒ සහතිකය දරන්නා විසින් මියගිය තැනැත්තාගේ දේපළ සන්තකයට ගෙන ඇත්නම් හෝ ඊට අයුතු ලෙස මැදිහත් වී ඇත්නම් ඔහු විසින් ඒ සහතිකය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකිය.

## XV වන පරිච්ඡේදය

### ආපසු ගෙවීම

**61**. (1) බූදල් බද්ද වශයෙන් ගෙවා ඇති යම් මුදලක් ආපසු ගෙවන ලෙස හිමිකම් පෑමක්, තක්සේරු දැන්වීමක් නිකුත් කරන ලද දින සිට වර්ෂ තුනක් ඇතුළත යම් අවස්ථාවක, ඒ හිමිකම් පෑමට හේතුවන කරුණු සහිතව කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව කරනු ලැබ, ඒ බූදල් බද්ද වැඩිපුර ගෙවා ඇති බව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරන ලදහොත්, එසේ වැඩිපුර ගෙවන ලද බූදල් බද්ද කොමසාරිස් ජනරාල්වරයා විසින් ආපසු ගෙවීම නිත්‍යානුකූල විය යුතු අතර, ඔහු විසින් එසේ කළ යුතු බව මෙයින් නියම කරනු ලැබේ:

එසේ වුවද—

(i) යම් නීති කටයුත්තක් හේතු කොටගෙන, මියගිය තැනැත්තාගෙන් අයවිය යුතු ණයක් වෙනුවෙන් අවසර දිය හැකි අඩු කිරීමක් නිශ්චය කරනු නොලැබ ඇති අවස්ථාවක, පොල්මාකරුවකුට ඒ හේතුව නිසා ඉහත කී පරිදි බූදල් බදු ආපසු ගෙවීමක් සඳහා වූ හිමිකම් පෑමක් ඉහත කී තුන් අවුරුදු කාලය තුළ කළ නොහැකි වූ විට ඒ හිමිකම් පෑම සඳහා සාධාරණ වූ වැඩිපුර යම් කාලයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් දීම නිත්‍යානුකූල විය යුතුය;

(ii) මේ වගන්තියේ සඳහන් කිසිවකින්—

(අ) යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ අභියාචනයක් මගින් මතු කරන ලද නැතහොත් මතු කරනු ලැබිය හැකිව තිබුණු යම් හේතුවක් මත, බූදල් බද්ද වශයෙන් ගෙවන ලද යම් මුදලක් ආපසු ගෙවීම සඳහා වූ හිමිකම් පෑමක් ඉදිරිපත් කිරීමේ යම් අයිතිවාසිකමක් හෝ ආපසු ගෙවනු ලැබීමේ අයිතිවාසිකමක්; හෝ

(ආ) බූදල් බද්ද වශයෙන් වැඩිපුර ගෙවන ලද මුදලක් අයකර ගැනීම සඳහා හෝ ආපසු ගෙවනු ලැබීම සඳහා රජයට විරුද්ධව නඩු පැවරීමේ යම් අයිතිවාසිකමක් යම් තැනැත්තකු වෙත නොපිරිනැමෙන අතර එසේ පිරිනැමෙතැයි නොසැලකිය යුතුය.

(2) තමා විසින් ගෙවන ලද බූදල් බදු මුදල ආපසු ගෙවනු ලැබීමට යම් තැනැත්තකුට හිමිකම් ඇති සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ මුදල, මෙහි පහත දැක්වෙන කාලය ඇතුළත, එනම්:—

(අ) ආපසු ගෙවීම කරන්නට සිදු වූයේ 29 වන වගන්තියේ (6) වන උප වගන්තිය යටතේ තක්සේරුකරුවකු සමග ඇතිකරගත් එකඟවීමක් අනුව තක්සේරුවක මුදල අඩු කිරීම නිසා හෝ තක්සේරුවක් සම්බන්ධයෙන් වූ අභියාචනයක අවසාන තීරණය නිසා නම්, ඒ එකඟවීමේ දින සිට හෝ ඒ තීරණය ඒ තැනැත්තාට දැනුම් දෙනු ලැබූ දින සිට මාස හයක කාලයක් ඇතුළත; හෝ

(ආ) වෙනත් යම් අවස්ථාවක නම්, ඒ ආපසු ගෙවීම සඳහා ඒ තැනැත්තාගේ හිමිකම් පෑම ලිඛිතව කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ දින සිට මාස හයක කාලයක් ඇතුළත,

ආපසු ගෙවා නොමැති අවස්ථාවක, (අ) හෝ (ආ) ඡේදයෙහි සඳහන් මාස හයක කාලයෙන් පසු නොගෙවා ඉතිරි වූ ආපසු ගෙවීමේ මුදල සඳහා ඒ මුදල නොගෙවා පවතින එක් එක් සම්පූර්ණ මාසයක කාලය සඳහා සියයට එක බැගින් වූ අනුප්‍රමාණය මත ගණන් බලන ලද පොලී මුදලකට ඒ තැනැත්තා හිමිකම් ලැබිය යුතුය.

## XVI වන පරිච්ඡේදය

### වැරදි සහ දණ්ඩන

**62.** මේ පනත යටතේ තමා විසින් භාරදිය යුතු හෝ සැපයිය යුතු දේපළ පිළිබඳ ප්‍රකාශයක් හෝ වෙනත් කවර වූ හෝ ප්‍රකාශයක් භාරදීම පැහැර හරින සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, ඒ එක් එක් වරදට රුපියල් පන්සියයක් නොඉක්මවන්නාවූ දඩයකට ඔහු යටත් විය යුතුය.

**63.** 26 වන වගන්තිය හෝ 49 වන වගන්තිය හෝ 52 වන වගන්තිය හෝ 77 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, ඒ එක් එක් වරදට රුපියල් පන්සියයක් නොඉක්මවන්නා වූ දඩයකට ඔහු යටත් විය යුතුය.

**64.** නිදහසට සාධාරණ කරුණක් නොමැතිව—

(අ) මේ පනත යටතේ භාරදිය යුතු වූ හෝ සැපයිය යුතු වූ හෝ දේපළ පිළිබඳ ප්‍රකාශයක හෝ වෙනත් කවර වූ හෝ ප්‍රකාශයක ඇතුළත් කළ හෝ ඇතුළත් කළ යුතුව තිබුණා වූ හෝ යම් දේපළක වටිනාකම අත්හැර දමන්නා වූ නැතහොත් අඩුවෙන් සඳහන් කරන්නා වූ; හෝ

(ආ) 17 වන වගන්තිය යටතේ අඩු කිරීමට ඉඩ සැලසීමක් සඳහා වූ හිමිකම් පෑමක් සම්බන්ධයෙන් යම් සාවද්‍ය ප්‍රකාශයක් කරන්නා වූ; හෝ

(ඇ) බූදල් බද්දකට තමා හෝ වෙනත් තැනැත්තකු යටත්වීම කෙරෙහි බලපාන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් සාවද්‍ය තොරතුරක් සපයන්නා වූ

සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු ව වරදකරු කරනු ලැබූ විට, ඒ එක් එක් වරදට මුළු මුදල රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකටද, ඒ වරද හේතු කොටගෙන අඩුවෙන් අය කරනු ලැබූ හෝ ඒ වරද අනාවරණය නොවිණි නම්, එසේ අඩුවෙන් අයකරනු ලැබිය හැකි වූ යම් බූදල් බදු මුදලක් වූයේද ඒ බූදල් බදු මුදලට ද ඔහු යටත් විය යුතුය.

**65.** බූදල් බද්ද ගෙවීම මග හැරීමේ හෝ වෙනත් තැනැත්තකුට බූදල් බද්ද ගෙවීම මග හැරීමට ආධාර කිරීමේ චේතනාවෙන්—

(අ) මේ පනත යටතේ භාරදෙනු ලැබූ ප්‍රකාශයක ඇතුළත් කළ යුතු ව තිබුණු යම් දේපළක් ඒ ප්‍රකාශයෙහි ඇතුළත් නොකර හරින්නා වූ; හෝ

(ආ) 17 වන වගන්තිය යටතේ අඩු කිරීමට ඉඩ සැලසීමක් සඳහා කරනු ලබන හිමිකම් පෑමක් සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශයක් කරන්නා වූ; හෝ

(ඇ) මේ පනත යටතේ භාරදෙනු ලැබූ හෝ සපයනු ලැබූ යම් ප්‍රකාශයක්, ප්‍රකාශ කිරීමක් හෝ වාර්තාවක් සත්‍ය යයි විශ්වාස කිරීමට සාධාරණ හේතු නොමැති ව ඊට අත්සන් තබන්නා වූ; හෝ

(ඈ) මේ පනතෙහි විධිවිධාන අනුව අසනු ලැබූ ප්‍රශ්නයකට, හෝ තොරතුරු සපයන ලෙස කරනු ලැබූ ඉල්ලීමකට, වාචිකව හෝ ලිඛිතව අසත්‍ය පිළිතුරක් දෙන්නා වූ හෝ සපයන්නා වූ; හෝ

(ඉ) යම් අසත්‍ය ගිණුම් පොතක් හෝ වෙනත් ලියවිල්ලක් පිළියෙළ කරන්නා වූ හෝ පවත්වාගෙන යන්නා වූ හෝ එබන්දක් පිළියෙළ කිරීමට හෝ පවත්වා ගෙන යෑමට බලය දෙන්නා වූ; හෝ

(ඊ) යම් වංචනික ක්‍රමයකින්, ප්‍රයෝගයකින් හෝ උපක්‍රමයකින් ප්‍රයෝජන ගන්නා වූ හෝ ප්‍රයෝජන ගැනීමට බලය දෙන්නා වූ හෝ

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත් වරයකු ඉදිරිපිටදී පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට –

(i) අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ එසේ සහාය ලැබූ අන් තැනැත්තා විසින් මේ පනත යටතේ ගෙවීමට යටත්, එසේ මග හැරියා වූ හෝ මඟ හැරීමට තැත් කළා වූ බදුල් බදු මුදල මෙන් දෙගුණයකට සමාන මුදලකින්; සහ

(ii) රුපියල් දස දහසක් නොඉක්මවන මුදලකින්

සමන්විත දඩයක් ගෙවීමට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතුය.

**66**. (i) 73 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ රහස්‍යතාව පිළිබඳ දිවුරුම් දීමට නියමිත තැනැත්තකුව සිටියදී ඒ දිවුරුම නොදී මේ පනත යටතේ කටයුතු කරන්නා වූ; හෝ

(ii) 73 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන හෝ 73 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ දෙන ලද දිවුරුම කඩ කරමින් කටයුතු කරන්නා වූ; හෝ

(iii) මේ පනතේ විධිවිධානවලට පටහැනිව කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර දෙන් නාවූ, අනුබල දෙන්නා වූ හෝ පොළඹවන්නා වූ

සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, ඒ එක් එක් වරදට රුපියල් එක් දහසක් නො ඉක්මවන දඩයකට හෝ මාස හයක් නො ඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

**67**. 43 වන වගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකුම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිටදී පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව, වරදකරු කරනු ලැබූ විට, ඒ වගන්තියේ විධිවිධාන කඩ කරමින් ගෙවන ලද මුදලට සමාන මුදලක දඩයකට යටත් වන්නේය.

**68**. වරද සිදු කරන ලද අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන එම වරද සම්බන්ධයෙන් පවරන ලද නඩු කටයුත්තේ තීන්දුවට පෙර යම් අවස්ථාවක, මේ පනත යටතේ වූ වරදක් කොමසාරිස් ජනරාල්වරයා විසින් සමථයට පත් කරනු ලැබිය හැකිය.

69. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩු පැවරීමක් කරගෙන යෑම හෝ එවැනි යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීම හෝ මේ පනත යටතේ යම් දණ්ඩනයක්, දඩයක් නැතහොත් බන්ධනාගාරගත කිරීමක් යම් තැනැත්තකුට නියම කිරීම හේතුකොටගෙන බුදල් බද්ද සඳහා තක්සේරු කරනු ලැබීමට හෝ ඒ බුදල් බද්ද ගෙවීමට යම් තැනැත්තකුගේ ඇති බැඳීම කෙරෙහි බලපෑමක් නොවිය යුතුය

70. මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක්, කොමසාරිස් ජනරාල්වරයාගේ මෙහෙයවීමෙන් හෝ ඔහුගේ ලිඛිත අනුමතය ඇතිව හෝ හැර, ආරම්භ නොකරනු ලැබිය යුතුය.

71. මේ පනත යටතේ බුදල් බද්ද අයකර ගනු ලැබීමට යටත් යම් තැනැත්තකු විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් මේ පනත යටතේ පැන නැගෙන යම් කාරණයක් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ කොමසාරිස්වරයකු වෙත හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු වෙත හෝ තක්සේරුකරුවකු වෙත ප්‍රකාශයක් කරනු ලැබූ හෝ ලේඛනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, වෙනත් යම නීතියක කුමක් සඳහන් වුවද, මේ පනතේ 63 වන, 64 වන හෝ 65 වන වගන්තියෙහි සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධ වූ යම් නඩු කටයුතුවලදී ඒ ප්‍රකාශය හෝ ලේඛනය සාක්ෂියේදී ආවේශය කරනු ලැබිය යුතුය.

## XVII වන පරිච්ඡේදය

### පරිපාලනය

72. (1) මේ පනත පරිපාලනය කිරීමේ කාර්ය කොමසාරිස් ජනරාල්වරයා සතුව පැවැතිය යුතුය.

(2) මේ පනතේ කවර වූ හෝ විධිවිධානයන් මගින් කොමසාරිස් ජනරාල්වරයා වෙත පිරිනමා ඇති, නියම කොට ඇති, හෝ භාර කොට ඇති යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට යම් කොමසාරිස්වරයකුට හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකුට හෝ තක්සේරුකරුවකුට කොමසාරිස් ජනරාල්වරයා විසින්, සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පැවරිය හැකිය.

(3) මේ පනතින් කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරනු ලැබූ, නියම කරනු ලැබූ හෝ භාර කරනු ලැබූ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කරන හෝ ඉටු කරන කොමසාරිස්වරයකු, නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු හෝ තක්සේරුකරුවකු පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක්, ඒ බලය ක්‍රියාත්මක කිරීමට හෝ ඒ කාර්යය හෝ කර්තව්‍යය ඉටු කිරීමට බලය දෙනුලැබූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(4) මේ පනතින් තක්සේරුකරුවකු වෙත පවරනු ලැබූ, නියම කරනු ලැබූ හෝ භාර කරනු ලැබූ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය; නැතහොත් ඉටු කරනු ලැබිය හැකිය.

73 (1) මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමෙහි ලා හැර, මේ පනත යටතේ පත් කරනු ලැබූ සෑම තැනැත්තකු ම හෝ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකුට සහාය වීම සඳහා හෝ නියුක්ත කරනු ලැබ සිටින හෝ නියුක්ත කරනු ලැබ සිටි සෑම තැනැත්තකු ම මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී මියගිය තැනැත්තකුගේ බුදලය පිළිබඳව තමාට දැන ගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යතාව ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහි ලා සහාය වීම කළ යුතු ය. තව ද ඉන් යම් කාරණයක් ඒ මියගිය තැනැත්තාගේ පොල්මඃකරුට හෝ ඒ පොල්මඃකරුගේ බලය ලත් නියෝජිතයාට හෝ අමාත්‍යවරයාට හෝ මුදල්

අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ හැර වෙනත් යම් තැනැත්තකුට නොදැන්විය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි ඇති කවර වූ හෝ ලේඛනයක් ලබා ගැනීමට යම් තැනැත්තකුට ඉඩ හැරීම හෝ අවසර දීම හෝ නොකළ යුතු ය.

(2) මේ පනත යටතේ පත් කරනු ලැබූ හෝ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවනු ලැබූ හෝ සෑම තැනැත්තකු විසින් මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිටදී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර, සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යතාව පිළිබඳ දිවුරුමක් දී ඊට අත්සන් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ පත් කරනු ලැබූ හෝ මේ පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා නියුක්ත කරවනු ලැබූ කිසිම තැනැත්තකුට, මේ පනතෙහි විධිවිධාන හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය පරිදි හැර, මේ පනත යටතේ භාර දෙන ලද්ද වූ හෝ සපයන ලද්ද වූ යම් ප්‍රකාශයක්, ලේඛනයක් හෝ තක්සේරුවක් යම් අධිකරණයක දී ඉදිරිපත් කිරීමට හෝ මේ පනත යටතේ සවකීය කාර්ය ඉටුකිරීමේ දී තමාට දැනගැනීමට ලැබෙන යම් කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයකට හෙළිදරව් කිරීමට නැතහොත් දැන්වීමට හෝ නියම නොකරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියෙහි කුමක් සඳහන් ව ඇත ද, මේ පනත යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ සවකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැනගැනීමට ලැබෙන යම් කාරණයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින්—

(අ) මේ පනත යටතේ හෝ ඒ වෙනත් යම් ලිඛිත නීතිය යටතේ හෝ යම් කාර්යයක් ඉටුකිරීම සඳහා ඒ කාරණය දැනුම්දීම අවශ්‍ය නම්, එම දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකුට, සහ

(ආ) මිය ගිය තැනැත්තාගේ බූදලය වෙනුවෙන් යම් දේශයක දී ගෙවිය යුතු මුදල් බද්ද සම්බන්ධයෙන් සහනය දීමට, ඒ දේශයේ මුදල් බදු අධිකාරියට

හැකි වන සේ අවශ්‍ය ප්‍රමාණයට ඒ අධිකාරියට දැනුම් දිය හැකි ය; තව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ පනත යටතේ හෝ ඔහු විසින් ක්‍රියාවේ යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ තමා වෙත භාරදෙන ලද හෝ සපයන ලද යම් ප්‍රකාශයක හෝ ලේඛනයක සඳහන් විස්තර වල පිටපතක්, එය ඒ විස්තරවල සත්‍ය පිටපතක් බවට ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් සහතික කරනු ලැබ, මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී යම් අධිකරණයකට ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකි ය. තවද ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥා පනතේ කුමක් සඳහන් ව ඇත ද, ඒ පිටපත සාක්ෂියේ දී ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් ප්‍රකාශයක් හෝ ලේඛනයක් ලියූ, සෑදූ, අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත් අකුරු හෝ අත්සන ඔප්පු කිරීමට අවශ්‍ය කවර වූ හෝ විටක ඒ ඔප්පු කිරීමේ කාර්යය සඳහා පමණක්, ඒ ප්‍රකාශයේ හෝ ලේඛනයේ මුල් පිටපත කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකි ය:

එසේ ම තවදුරටත්, ඒ ප්‍රකාශයක හෝ ලේඛනයක මුල් පිටපත හෝ ඒ ප්‍රකාශයක හෝ ලේඛනයක සඳහන් යම් විස්තරවල පිටපතක් හෝ යම් අධිකරණයකට ඉදිරිපත් කිරීමට කවර වූ හෝ විටක දී කොමසාරිස් ජනරාල්වරයාට බල නොකරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුවද—

(අ) මියගිය තැනැත්තකුගේ බුද්ගලය සම්බන්ධයෙන් යම් අධිකරණයක තෙස්තමේන්තු නඩු කටයුත්තක් පවරනු ලැබ ඒ අධිකරණය විසින් නියම කරනු ලැබුවහොත්, ඒ බුද්ගලය සම්බන්ධයෙන් තමාට මේ පනත යටතේ භාර දී ඇති හෝ සපයා ඇති හෝ යම් ප්‍රකාශයක්, වාර්තාවක් හෝ තක්සේරුවක් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; තව ද

(ආ) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 158 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි හෝ (6) වන උපවගන්තියෙහි හෝ (7) වන උපවගන්තියෙහි හෝ (8) වන උපවගන්තියෙහි හෝ (9) වන උපවගන්තියෙහි හෝ (10) වන උපවගන්තියෙහි හෝ (11) වන උපවගන්තියෙහි සඳහන් යම් කොමිෂන් සභාවක් විසින් හෝ නිලධරයකු විසින් හෝ නියම කරනු ලැබුවහොත් යම් තැනැත්තකුගේ කටයුතුවලට අදාළ ව මේ පනත යටතේ තමා වෙත ඇති සියලු තොරතුරු කොමසාරිස් ජනරාල්වරයා විසින් සැපයිය යුතු ය.

## XVIII වන පරිච්ඡේදය

## සාමාන්‍ය විධිවිධාන

74. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ බලාත්මක කිරීමේ කාර්ය සඳහා සහ නියම කිරීමට මේ පනතින් නියමිතව ඇති හෝ බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියෝගයක් උල්ලංඝනය කිරීම හෝ ඒ නියෝගයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම මහෙස්ත්‍රාත්වරයකු විසින් ලඝු ක්‍රමයට නඩු විභාග කළ හැකි වූ ද රුපියල් පන්සියයක් නොඉක්මවන්නා වූ දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකිවූ ද මේ පනත යටතේ වූ වරදක් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද කිසිම නියෝගයක්, එය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන තෙක්, බලාත්මක නොවිය යුතු ය. එසේ අනුමත කරනු ලැබූ බවට වූ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

75. මේ පනතේ සියලු කාර්ය සඳහා හෝ ඉන් යමක් සඳහා භාවිත කළ යුතු ආකෘති කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි ය.

76. (1) මේ පනතේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයාට අවශ්‍ය වන යම් තොරතුරක් සැපයිය හැකි තත්ත්වයක යම් රජයේ නිලධරයකු සිටින බව කොමසාරිස් ජනරාල් වරයාගේ මතය වන අවස්ථාවක දී, ඒ තොරතුර සපයන ලෙස ලිඛිත ඉල්ලීමක් මඟින් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ රජයේ නිලධරයාගෙන් ඉල්ලා සිටිය හැකි ය. ඒ සෑම රජයේ නිලධරයකුම ඒ අවශ්‍ය වන තොරතුර තමාගේ උපරිම දැනීම සහ විශ්වාසය අනුව සැපයිය යුතු ය.

(2) යම් රෙජිස්ටර්, පොත්, වාර්තා, ලිපි, ලේඛන හෝ කටයුතු වාර්තා පරීක්ෂා කිරීමෙන් මේ පනත යටතේ බුද්ගල් බද්ද ලබා ගැනීමට හෝ එවැනි යම් බුද්ගල් බද්දක් සම්බන්ධයෙන් කරන ලද යම් වංචාවක් හෝ නොකර හැරීමක් ඔප්පු කිරීමට හෝ එවැන්නක් අනාවරණය කිරීමට ඉඩ ලැබෙයි ද ඒ රෙජිස්ටර්, පොත්, වාර්තා, ලිපි, ලේඛන හෝ කටයුතු වාර්තා භාරව සිටින සෑම රජයේ නිලධරයකු ම, කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිතව බලය දෙන ලද

DISCARDED
UNIVERSITY OF ... LIBRARY



යම් තැනැත්තකුට, සැම සාධාරණ වේලාවක් තුළදී ම, ඒ කාර්යය සඳහා ඒවා පරීක්ෂා කිරීමට ද ඉන් අවශ්‍ය යයි තමා සලකනු ලබන සටහන් සහ උද්ධෘත ගැනීමට ද යම් ගාස්තුවක් හෝ අයකිරීමක් නොමැතිව අවසර දිය යුතු ය.

(3) මේ වගන්තියෙහි ''රජයේ නිලධරයා'' යන්නට පළාත් පාලන ආයතනයක හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ නියුක්ත කවර වූ හෝ නිලධරයෙක් ඇතුළත් වේ.

77. කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිත දැන්වීමක් මගින්, මියගිය තැනැත්තකුගේ බූදලයේ කොටසක් වන චංචල හෝ නිශ්චල යම් දේපළක ආරක්ෂාව, පාලනය, රැකවරණය, කළමනාකරණය හෝ සන්තකය දරණ යම් තැනැත්තකුට, ඒ දැන්වීමෙහි නම්කර ඇති යම් රජයේ නිලධරයකුට ඒ දේපළ පරීක්ෂා කිරීමට ඉඩ දෙන ලෙස, නියම කරනු ලැබිය හැකි ය; එවැනි යම් දැන්වීමක් යොමු කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙතද ඒ තැනැත්තා, ඒ දැන්වීම ලැබුණු පසු, ඒ දැන්වීම අදාළ වන දේපළ පරීක්ෂා කිරීම සඳහා, ඒ දැන්වීමේ නම් කරනු ලැබ ඇති රජයේ නිලධරයාට සියලු පහසුකම් සලසා දිය යුතු ය.

78. (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— ''අනුයෝජිතයා'' යන්න නිර්වාසික තැනැත්තකු සම්බන්ධයෙන් යෙදුණු විට, ඊට පහත සඳහන් අය ඇතුළත් වෙති:—

(අ) ශ්‍රී ලංකාව තුළ සිටින ඇටෝර්නි බලකරුවෙක්, වෙළඳ නියෝජිතයෙක්, දේපළ භාරගන්නෙක් හෝ කළමනාකාර වරයෙක්; සහ

(ආ) ඒ නිර්වාසික තැනැත්තා වෙනුවෙන් යම් දේපළක ආරක්ෂාව, රැකවරණය, සන්තකය, කළමනාකරණය හෝ පාලනය ඇතිව ශ්‍රී ලංකාව තුළ සිටින යම් තැනැත්තෙක්;

''උචිත දිසා අධිකරණය'' යන්නෙන්, කොළඹ දිසා අධිකරණය අදහස් වන අතර, මියගිය තැනැත්තාගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීමට අධිකරණ බලය ඇති වෙනත් යම් දිසා අධිකරණයක් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී නිකුත් කරන ලද ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ නැවත මුද්‍රා තැබූ වෙනත් යම් දිසා අධිකරණයක් ඊට ඇතුළත් වේ;

''තක්සේරුකරු'' යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා පත් කරන ලද දේශීය ආදායම් තක්සේරුකරුවකු අදහස් වන අතර, ජ්‍යෙෂ්ඨ දේශීය ආදායම් තක්සේරුකරුවෙක් ඊට ඇතුළත් වේ;

''බලයලත් නියෝජිතයා'' යන්නෙන්, බූදල් බද්ද ගෙවීමට යටත් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදුණු විට, නීතිඥවරයෙක්, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයෙක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ගණකාධිකාරි වරයෙක් හෝ (145 වන අධිකාරය වන) සමාගම් ආඥාපනත යටතේ සාදන ලද සමාගම් (විගණකවරුන්) පිළිබඳ නියෝග යටතේ විගණකවරයකු ලෙස ලියා පදිංචි කරනු ලැබ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද පුද්ගලයෙක් අදහස් වේ;

''පුද්ගල මණ්ඩලය'' යන්නට යම් පළාත් පාලන ආයතනයක්, රජයේ අධිකාරියක්, සංස්ථාවක්, හෝ සමාගමක් සහ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ පුද්ගල සංගමයක්, ශ්‍රේණියක්, සමිතියක් හෝ සමාජයක් ඇතුළත් වේ;

''කොමසාරිස් ජනරාල්වරයා'' යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා පත්කරන ලද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

''කොමසාරිස්වරයා'' යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා පත් කරන ලද දේශීය ආදායම් කොමසාරිස්වරයා අදහස් වේ;

"සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සංස්ථාගත කරන ලද හෝ ලියා පදිංචි කරන ලද යම් සමාගමක් අදහස් වේ;

"මියගිය තැනැත්තා" යන්නෙන්, 1978 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන්පසු මියගිය යම් තැනැත්තෙක් අදහස් වේ;

"දේපළ පිළිබඳ ප්‍රකාශය" යන්නෙන්, පොල්මෑකරුවකු විසින් හෝ බූදල් බද්ද ගෙවීමට යටත් වෙනත් තැනැත්තකු විසින් ,ඒ බූදල් බද්ද තක්සේරු කිරීමේ කාර්යය සඳහා මේ පනත යටතේ භාරදෙන ලද ප්‍රකාශයක් අදහස් වේ;

"නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා පත් කරන ලද නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස්වරයා අදහස් වේ;

"බූදලය" යන්නෙන්—

(අ) මරණය සිදුවුණු අවස්ථාවේ දී ශ්‍රී ලංකාවෙහි වසතිය ඇතිව සිටි මියගිය තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට, "බූදලය" යන්නෙන්, ශ්‍රී ලංකාව තුළ නොපිහිටි නිශ්චල දේපළ හැර කවර වූ හෝ ස්ථානයක පිහිටි, ඔහු මියයාමේ දී සංක්‍රමණය වන සියලු දේපළ අදහස් වේ; තව ද

(ආ) මරණය සිදුවුණු අවස්ථාවේ දී ශ්‍රී ලංකා වසතිය නොමැතිව සිට මියගිය තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට, "බූදලය" යන්නෙන් ශ්‍රී ලංකාව තුළ පිහිටි, ඔහු මියයාමේ දී සංක්‍රමණය වන සියලු දේපළ අදහස් වේ;

"බූදල් බද්ද හෝ බද්ද" යන්නෙන්, මේ පනත යටතේ නියම කරනු ලබන බූදල් බද්ද අදහස් වේ;

"පොල්මෑකරු" යන්නෙන්, මියගිය තැනැත්තකුගේ බූදලය පිළිබඳ පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු අදහස් වන අතර, මේ පනත යටතේ වූ වගකීමක් සම්බන්ධයෙන් වන විට, මියගිය තැනැත්තාගේ දේපළ සන්තකයට ගන්නා හෝ ඊට මැදිහත්වන යම් තැනැත්තෙක් ද මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය නිකුත් කිරීම හෝ නැවත මුද්‍රා තැබීම සඳහා දිසා අධිකරණයක් වෙත ඉල්ලුම් කර ඇති හෝ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ. ;

"අශක්‍ය තැනැත්තා" යන්නෙන්, යම් බාලවයස්කාරයෙක් හෝ සිහි විකල තැනැත්තෙක් අදහස් වේ;

"බැඳීම්" යන්නට, උකස්, යටත් කොට බැඳ තැබීම් සහ නිම කළ හැකි බැඳීම් ඇතුළත් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටුකරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ;

"නිර්වාසික" යන්නෙන් ශ්‍රී ලංකාවෙහි පදිංචි නොවූ යනු අදහස්වේ;

"තැනැත්තා" යන්නට මියගිය තැනැත්තෙකු සම්බන්ධයෙන් යෙදුණු විට හැර, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

"දේපළ" යන්නට, සෑම වර්ගයක ම චංචල හෝ නිශ්චල දේපළ ද, එය විකිණීමෙන් ලැබෙන මුදලද, විකිණීමෙන් ලැබූ මුදල තත් කාලයේ නියෝජනය කරන යම් මුදල්, ආයෝජන හෝ වෙනත් වත්කම්ද ඇතුළත් වේ;

"මියයාමේ දී සංක්‍රමණය වන දේපළ" යන්නට, මියයාමේ දී සංක්‍රමණය වන්නේ යයි සලකනු ලබන දේපළ මරණය සිදු වූ විගස ම හෝ ඉන් යම් කාලයකට පසුව හෝ, නියත වශයෙන්, හෝ සම්භාව්‍ය වශයෙන් හෝ සහ ප්‍රාරම්භයේදී ම හෝ ආදේශාත්මක සීමා කිරීමක් මගින් හෝ සංක්‍රමණය වන දේපළ ඇතුළත් වන අතර, බුදල් බද්ද ගෙවීමෙන් නිදහස් යම් දේපළක් ඊට ඇතුළත් නොවේ. තවද, "මියයාමේදී" යන යෙදුමට, "මියයාම සැලකිල්ලට ගැනීමෙන් පමණක් නිශ්චය කළ හැකි කාලයක දී" යන්නද ඇතුළත් වේ.

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම් කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්ද වූ හෝ පිහිටුවනු ලබන්නා වූද ආණ්ඩුව විසින් ප්‍රදානයන් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලින් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"භාරකරු" යන්නට, අශක්‍ය තැනැත්තකු හා සම්බන්ධයෙන් යෙදුණු විට, යම් භාරකරුවකු, දේපළ ආරක්ෂකයෙකු, කළමනාකරුවකු හෝ ඒ අශක්‍ය තැනැත්තා වෙනුවෙන් යම් දේපළක් මෙහෙයවීම, පාලනය කිරීම හෝ කළමනාකරණය කිරීම අයත්ව සිටින වෙනත් තැනැත්තකු ඇතුළත් වේ.

(2) (අ) තමා ස්වීය නෛතික තත්ත්වය ඇත්තකු වූයේ නම් තමා විසින් දේපළ නියාදනය කළ හැකි වන අන්දමට බුදලයක් හෝ එහි යම් සම්බන්ධතාවක් හෝ පොදු බලයක් යම් තැනැත්තෙකුට ඇත්නම් ඒ තැනැත්තා දේපළ නියාදනය කිරීමට නිසි බලය ඇති තැනැත්තකු ලෙස මේ පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය; "පොදු බලය" යන්නට ජීවිත කාලය තුළ දී සාධන පත්‍රයකින් හෝ අන්තිම කැමති පත්‍රයකින් හෝ ඒ දෙකින්ම හෝ තමා සුදුසු යයි සිතන ආකාරයකට දේපළ අයිතිය නියම කිරීමට හෝ නියාදනය කිරීමට ප්‍රදානලාභීට හෝ එය දරණ වෙනත් තැනැත්තෙකුට හැකි කරවන සෑම බලයක් හෝ අධිකාරයක් ම ඇතුළත් වේ; එහෙත් තමා විසින් නොකරන ලද නියාදනයක් යටතේ භාරකාර තත්ත්වයකින් ක්‍රියාත්මක කළ හැකි යම් බලයක් ඊට ඇතුළත් නොවේ.

(ආ) වෙනත් තැනැත්තකුගේ එකඟත්වය අවශ්‍ය වෙතත්, අවශ්‍ය නොවූවත් මියගිය තැනැත්තකුගේ සම්බන්ධතාවකින් බලාත්මක වන නියාදනයක්, ඒ මියගිය තැනැත්තා විසින් කරනු ලැබූ ලෙස මේ පනතේ කාර්ය සඳහා සැලකිය යුතු ය.

(ඇ) දේපළකින් මුදල් අයකර ගැනීමට යම් තැනැත්තකුට පොදු බලයක් ඇතිවිට ඒ මුදල්, ඔහු විසින් නියාදනය කිරීමට බලයක් ඇති දේපළ ලෙස මේ පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

79. 1978 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසු මියගිය තැනැත්තකුගේ බුදලයේ වටිනාකම මත බුදල් බද්ද අය කිරීම හා ගෙවීම කෙරෙහි හෝ ඒ සම්බන්ධයෙන් හෝ බුදල් බදු ආඥාපනතේ කිසිවක් අදාළ නොවිය යුතු ය.

80. (1) බුදල් බදු ආඥාපනතේ කුමක් සඳහන්ව ඇත ද—

(අ) බුදල් බදු ආඥාපනත යටතේ ගෙවිය යුතු යම් බුදල් බද්දක මුදලට උපචිත යම් පොලී ප්‍රමාණයක් අඩු කිරීම හෝ අත් හැරීම කාරණයේ සියලු අවස්ථානුගත කරුණු අනුව සලකා බලන කල සාධාරණ සහ යුක්ති සහගත බව කොමසාරිස් ජනරාල්වරයා විසින් අදහස් කරනු ලබන්නේ නම් ඔහු විසින් ඒ අඩු කිරීම හෝ අත්හැරීම හෝ කළ හැකිය; තව ද

(ආ) 1977 අප්‍රේල් මා මස 1 වන දින දී හෝ ඊට පසු නමුත් 1978 නොවැම්බර් මස 15 වන දිනට පෙර මියගිය තැනැත්තකුගේ බුදලයේ වටිනාකම මත ඒ ආඥාපනත යටතේ ගෙවිය යුතු බුදල් බද්ද ගණන් බැලීමේ කාර්යය සඳහා ඒ බුදලයේ කොටසක් වන යම් නිශ්චල දේපළක වටිනාකම පහත සඳහන් ආකාරයට ගණන් බැලූ විට ලැබෙන මුදල් ප්‍රමාණය ලෙස සැලකිය යුතු ය:—

(i) මියගිය තැනැත්තා විසින් එම දේපළ 1977 මාර්තු මස 31 වන දිනට පෙර අත් කර ගෙන තිබූ දේපළක් වූ විට, එම දේපළ 1977 මාර්තු මස 31 වන දින විවෘත වෙළඳපොළෙහි විකුණුවේ නම් තක්සේරුකරුගේ මතය අනුව ඊට ලැබිය හැකිව තිබූ මිලට එම දේපළෙහි 1977 මාර්තු මස 31 වන දිනට පසුව නමුත් මියගිය තැනැත්තා මියගිය දිනයට පෙර, කරන ලද වැඩිදියුණු කිරීම්, වෙනස් කිරීම් සහ අලුතෙන් එකතු කිරීම් කිසිවක් වී නම් ඒවායේ වටිනාකමට සමාන මුදල් ප්‍රමාණයක් එකතු කළ විට ලැබෙන මුදල් ප්‍රමාණය ; තව ද

(ii) එම දේපළ මියගිය තැනැත්තා විසින් 1977 මාර්තු මස 31 වන දින හෝ ඊට පසුව නමුත් 1978 නොවැම්බර් මස 15 වන දිනට පෙර අත්කර ගෙන තිබූ දේපළක් වූ විට එම දේපළ මියගිය තැනැත්තා විසින් අත්කර ගත් දිනයේ දී එය විවෘත වෙළෙඳ පළෙහි විකුණුවේ නම්, තක්සේරුකරුගේ මතය අනුව ඊට ලැබිය හැකිව තිබූ මිලට, මියගිය තැනැත්තා එම දේපළ අත්කර ගත් දිනයෙන් පසුව නමුත් මියගිය තැනැත්තා මියගිය දිනයට පෙර එම දේපළෙහි කරන ලද වැඩිදියුණු කිරීම්, වෙනස් කිරීම් සහ අලුතෙන් එකතු කිරීම් කිසිවක් වී නම් ඒවායේ වටිනාකමට සමාන මුදල් ප්‍රමාණයක් එකතු කළ විට ලැබෙන මුදල් ප්‍රමාණය.

(2) බූදල් බදු ආඥාපනතේ 49 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, 1978 නොවැම්බර් මස 15 වන දිනට පෙර මියගිය තැනැත්තකුගේ බූදලයේ වටිනාකම මත බූදල් බදු ආඥාපනත යටතේ ගෙවිය යුතු යම් බූදල් බද්දක් ගෙවීම 1979 නොවැම්බර් මස 15 වන දින වන විට පැහැර හැර ඇති අවස්ථාවක 1979 නොවැම්බර් මස 15 වන දින සිට, 1981 නොවැම්බර් මස 15 වන දිනයත් එම බූදල් බද්ද ගෙවූ දිනයත් යන මේ දින දෙකින් පළමුවෙන් එළඹෙන දිනය තෙක්, වර්ෂයකට සියයට අට බැගින් වූ අනුප්‍රමාණයක් අනුව ගෙවීම පැහැර හැර ඇති බූදල් බදු මුදල වෙනුවෙන් සුළු පොලිය ගෙවිය යුතු අතර, 1981 නොවැම්බර් මස 15 වන දිනය වන විට ඒ බූදල් බද්ද ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක 1981 නොවැම්බර් මස 15 වන දින සිට ඒ බූදල් බද්ද ගෙවන දිනය තෙක් වර්ෂයකට සියයට දෙළහ බැගින් වූ අනුප්‍රමාණයක් අනුව ගෙවීම පැහැර හැර ඇති බූදල් බදු මුදල වෙනුවෙන් සුළු පොලිය ගෙවිය යුතු ය.

(3) 1978 නොවැම්බර් මස 15 වන දිනට පෙර මියගිය තැනැත්තකුගේ බූදලයේ වටිනාකම මත ගෙවිය යුතු බූදල් බද්ද ගෙවීම මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී පැහැර හැර ඇති අවස්ථාවක, බූදල් බදු ආඥාපනතේ කුමක් සඳහන්ව ඇත ද ඒ බදු මුදල මේ පනත යටතේ ගෙවීම පැහැර හැර ඇති බූදල් බද්දක් වූවා සේ එකතු කිරීම හා අය කිරීම කරනු ලැබිය හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල "බූදල් බද්ද" යන්නට බූදල් බදු ආඥාපනත යටතේ හෝ මේ වගන්තිය ප්‍රකාර හෝ උපචිත වූ පොළිය ද ඇතුළත් වේ

## උප ලේඛනය (3 වන වගන්තිය)

| I වන තීරය (බූදලයේ වටිනාකම) | | II වන තීරය (බූදල් බද්දේ අනුප්‍රමාණය) |
|---|---|---|
| බූදලයේ වටිනාකමේ ප්‍රථම රු. 1,00,000 සඳහා | .... | නැත |
| බූදලයේ වටිනාකමේ ඊළඟ රු. 1,00,000 සඳහා | .... | සියයට 5 යි |
| බූදලයේ වටිනාකමේ ඊළඟ රු. 1,00,000 සඳහා | .... | සියයට 10 යි |
| බූදලයේ වටිනාකමේ ඊළඟ රු. 1,00,000 සඳහා | .... | සියයට 15 යි |
| බූදලයේ වටිනාකමේ ඊළඟ රු. 1,00,000 සඳහා | .... | සියයට 20 යි |
| බූදලයේ වටිනාකමේ ඊළඟ රු. 1,00,000 සඳහා | .... | සියයට 25 යි |
| බූදලයේ වටිනාකමේ ඊළඟ රු. 2,00,000 සඳහා | .... | සියයට 30 යි |
| බූදලයේ වටිනාකමේ ඊළඟ රු. 2,00,000 සඳහා | .... | සියයට 35 යි |
| බූදලයේ වටිනාකමේ ඊළඟ රු. 2,00,000 සඳහා | .... | සියයට 40 යි |
| බූදලයේ වටිනාකමේ ඊළඟ රු. 2,00,000 සඳහා | .... | සියයට 45 යි |
| බූදලයේ වටිනාකමේ ඊළඟ රු. 2,00,000 සඳහා | .... | සියයට 50 යි |
| බූදලයේ වටිනාකමේ ඊළඟ රු. 3,00,000 සඳහා | .... | සියයට 55 යි |
| බූදලයේ වටිනාකමේ ඊළඟ රු. 5,00,000 සඳහා | .... | සියයට 60 යි |
| බූදලයේ වටිනාකමේ ඊළඟ රු. 5,00,000 සඳහා | .... | සියයට 65 යි |
| බූදලයේ වටිනාකමේ ඊළඟ ඉතිරි කොටස සඳහා | .... | සියයට 70 යි |

## 1980 අංක 23 දරන විදේශීය ණය (සංශෝධන ) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජූනි මස 6 වන දින]

1957 අංක 29 දරන විදේශීය ණය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

1 මේ පනත 1980 අංක 23 දරන විදේශීය ණය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු '' ප්‍රධාන ප්‍රඥප්තිය '' යනුවෙන් සඳහන් කරනු ලබන) 1957 අංක 29 දරන විදේශීය ණය පනතෙහි දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ. :—

''ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත දෙනු ලබන විදේශීය ණය සම්බන්ධයෙන් ද රාජ්‍ය සංස්ථා-වලට සහ පොදු ව්‍යවසාය වලට දෙනු ලබන විදේශීය ණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඇපවනු පිණිස ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.''

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන 3 වන, සහ 4 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ:—

'' ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත දෙනු ලබන විදේශීය ණය වලට සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් කරනු ලබන ඇපවීම්වලට අදාළ එකඟවීම් යනාදිය අත්සන් තැබීමට බලය පවරා ඇති තැනැත්තා.

2. ජනාධිපතිවරයා විසින් හෝ, ජනාධිපතිවරයා විසින් තත් කාර්යය සඳහා විශේෂයෙන් ම බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්—

(අ ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත දෙනු ලබන විදේශීය ණයකට අදාළ එකඟවීමකට;

(ආ ) රාජ්‍ය සංස්ථාවකට නැතහොත් පොදු ව්‍යවසායකට දෙනු ලබන විදේශීය ණයකට අදාළව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් කරනු ලබන ඇපවීමකට; සහ

(ඇ ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ලියා අත්සන් තබනු ලැබිය යුතු යයි එම එකඟවීම නැතහොත් ඇපවීම මඟින් නියමිත යම් ගිවිසුමකට, බැඳුම්කරයකට, පොරොන්දු පත්‍රයකට, හෝ වෙනත් ලේඛන-යකට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව නමින් සහ ඒ ආණ්ඩුව වෙනුවෙන් අත්සන් තබනු ලැබිය හැකි ය.

එකඟවීම් සහ ඇපවීම් යටතේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගෙවනු ලැබිය යුතු මුදල් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බව.

3. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින්—

(අ ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත දෙනු ලබන විදේශීය ණයකට අදාළ එකඟවීමක් යටතේ;

(ආ ) රාජ්‍ය සංස්ථාවකට නැතහොත් පොදු ව්‍යවසායකට දෙනු ලබන විදේශීය ණයකට අදාළ ඇපවීමක් ප්‍රකාර; සහ

(ඇ ) එවැනි එකඟවීමක් නැතහොත් ඇපවීමක් ක්‍රියාවේ යෙදවීමෙහි ලා අත්සන් තබන ලද යම් ගිවිසුමක්, බැඳුම්කරයක් හෝ පොරොන්දු පත්‍රයක් යටතේ

ගෙවනු ලැබිය යුතු සියලු මුදල් මෙයින් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් කරනු ලැබේ.

විදේශීය ණයකට අදාළ එකඟවීමක් නැතහොත් ඇපවීමක් ක්‍රියාවේ යෙදවීම පිණිස විධිවිධාන සැලසීමෙහි ලා මුදල් අමාත්‍යවරයාගේ බලය.

4. (1) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත දෙනු ලබන විදේශීය ණයකට අදාළ එකඟවීමක් නැතහොත් රාජ්‍ය සංස්ථාවක් හෝ පොදු ව්‍යවසායක් වෙත දෙනු ලබන විදේශීය ණයකට අදාළව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් කරනු ලබන ඇපවීමක් බලාත්මක කිරීම පිණිස අවශ්‍ය විධිවිධාන, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින්, මුදල් විෂයය භාර අමාත්‍ය වරයා විසින් සලස්වනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදා පළ කරනු ලබන සෑම නියමයක් ම නීතියක බලය දරන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදු පළ කරනු ලබන සෑම නියමයක් ම, එම නියමය කර මාසයක් ඇතුළත දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.''

4 ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

''අර්ථ නිරූපණය.

5. මේ පනතෙහි—

''විදේශීය ණය'' යන්නෙන්—

(අ) විදේශීය ආණ්ඩුවක් විසින් හෝ විදේශීය ආණ්ඩුවක නියෝජ්‍යායතනයක් විසින් ; හෝ

(ආ) කිසියම් ජාත්‍යන්තර සංවිධානයක් විසින් ; නැතහොත්

(ඇ) පොදු වශයෙන් හෝ කිසියම් විශේෂ ගනුදෙනුවක් වෙනුවෙන් හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් අනුමත කරනු ලැබිය හැකි වූ ද, ශ්‍රී ලංකාවෙන් පිටත වූ ද සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථා ගත කරනු නො ලැබූ යම් තැනැත්තකු විසින් නැතහොත් පුද්ගල මණ්ඩලයක් විසින්

ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත හෝ රාජ්‍ය සංස්ථාවක් නැතහොත් පොදු ව්‍යවසායක් වෙත හෝ ප්‍රදානය කරනු ලබන, ඕනෑම ව්‍යවහාර මුදලක ණයක් අදහස් වන අතර, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව, රාජ්‍ය සංස්ථාව හෝ පොදු ව්‍යවසාය සහ ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු අතර යම් ගනුදෙනුවක් වෙනුවෙන්, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ හෝ රාජ්‍ය සංස්ථාවේ හෝ පොදු ව්‍යවසායේ යම් බැඳීමක් නිදහස් කරන්නා වූ, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් හෝ රාජ්‍ය සංස්ථා විසින් හෝ පොදු ව්‍යවසාය විසින් එවැනි යම් විදේශීය ආණ්ඩුවකට, නියෝජ්‍යායතනයකට, සංවිධානයකට, තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට ගෙවීමට භාරගනු ලබන යම් මුදල් ප්‍රමාණයක් ද ඊට ඇතුළත් වේ;

''රාජ්‍ය සංස්ථාව'' යන්නෙන් සමාගම් ආඥා පනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්ද වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබනන්ා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

''පොදු ව්‍යවසාය'' යන්නෙන් සමාගම් ආඥා පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ ද ගෙවා ඇති ප්‍රාග්ධනයෙන් සියයට පණහකට නොඅඩු ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් දරනු ලබන්නා වූ ද යම් සමාගමක් අදහස් වේ.'

---

## 1980 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජූනි මස 24 වන දින]

**1979 අංක 28 දරණ දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

1 මේ පනත 1980 අංක 24 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි—

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි "සහ (ඌ) ඡේදයෙහි" යන වචන වෙනුවට "(ඌ) ඡේදයෙහි සහ (ඕ) ඡේදයෙහි" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයෙහි (ii) අනුඡේදයෙහි එන, "මුදල් ප්‍රමාණයක් විය යුතුය ; තවද" යන වචන වෙනුවට, "මුදල් ප්‍රමාණයක් විය යුතු ය ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයෙහි එන, "මුදල් ප්‍රමාණයක් විය යුතුය." යන වචන වෙනුවට "මුදල් ප්‍රමාණයක් විය යුතුය ; තව ද" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඈ) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඕ) යම් දේපළක් නිශ්චල දේපළක් වන අවස්ථාවක සහ 1977 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඒ දේපළ අත්කර ගනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තාගෙන් ප්‍රාග්ධන ලාභ අත්වන තැනැත්තා විසින් 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ත්‍යාගයක හෝ උරුමයක ආකාරයෙන් ඒ දේපළ අත්කර ගනු ලැබූ අවස්ථාවක, දෙවනුව සඳහන් තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගනු ලැබූ අවස්ථාවේ දී, එහි වටිනා කම 1977 අප්‍රේල් 1 මස වන දිනට පසුව දෙවනුව සඳහන් තැනැත්තා විසින් ඒ දේපළ සම්බන්ධයෙන් කරන ලද යම් වැඩි දියුණු කිරීම්, එකතු කිරීම් හෝ වෙනස් කිරීම්වල වියදමෙන් වැඩි කරන ලද 1977 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළෙහි වෙළෙඳ අගයට සමාන මුදලක් විය යුතුය." ; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "මේ පනතේ 23 වන වගන්තිය යටතේ" යන වචන වෙනුවට "මේ පනතේ 23 වන වගන්තිය යටතේ හෝ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඕ) ඡේදය යටතේ" යන වචන ආදේශ කිරීමෙන්,

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) ඒ වගන්තියේ (අ) ඡේදයෙහි:—

(අ) ඒ ඡේදයේ (xviii) අනුඡේදයේ "1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත" යන වචන වෙනුවට "1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා 1966 අංක 37 දරණ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (xxv) අනුඡේදයෙහි "යම් ජාතික ලොතරැයියකින්" යන වචන වෙනුවට "1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා යම් ජාතික ලොතරැයියකින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ ඡේදයේ (xxvi) අනුඡේදයෙහි "සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතුය." යන වචන වෙනුවට "සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය;" සහ

(ඈ) ඒ ඡේදයේ (xxvi) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් :—

"(xxvii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පදනම;

(xxviii) 1978 අංක 1 දරන වෝටර් හෝල් රඟහල පදනම පනතින් පිහිටුවන ලද වෝටර් හෝල් රඟහල පදනම;

(xxix) 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරි ගැන්වීමේ පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව;
(xxx) වෛද්‍ය ආඥාපනතින් පිහිටුවන ලද ලංකා වෛද්‍ය සභාව;

(xxxi) 1961 අංක 31 දරන ආයුර්වේද පනතින් පිහිටුවන ලද ආයුර්වේද වෛද්‍ය සභාව ; සහ

(xxxii) 1970 අංක 7 දරන හෝමියෝපති පනතින් පිහිටුවන ලද හෝමියෝපති සභාව; " ;

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයෙහි—

(අ) ඒ ඡේදයේ (iii) අනුඡේදයෙහි " ඒ සංස්ථාවේ " යන වචන වෙනුවට " 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ සංස්ථාවේ; " යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (iii) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(iv) විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක යම් ගණුදෙනු කටයුතුවලින් රටට උපචිත වීමට ඉඩ ඇති විදේශීය විනිමය වාසි කෙරෙහි සැලකිල්ල ඇතිව, ඒ ඒකකයේ අක් වෙරළෙහි සියළු ගණු දෙනුවලින් සහ ඒ ඒකකයේ අමාත්‍ය වරයා විසින් අනුමත කරනු ලැබිය හැකි පෙර වෙරළෙහි විදේශීය ව්‍යවහාර මුදල් ගණුදෙනුවලින් ඇති වන්නා වූ" ; සහ

(3) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ (i) අනුඡේදයෙහි " ඒ ව්‍යාපාරය හා සම්බන්ධ " යන වචන වෙනුවට "ඒ ආයතනයේ මූලික කාර්යය සැබවින්ම ක්‍රියාත්මක කරන අතරතුර කරගෙන යනු ලබන ව්‍යාපාරයක් හෝ ඒ ව්‍යාපාරය හා සම්බන්ධ " යන වචන ආදේශ කිරීමෙන් ; ".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (1) වන උප වගන්තිය වශයෙන් ඒ වගන්තිය නැවත අංක කිරීමෙන්;

(ආ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයෙහි—

(i) ඒ ඡේදයෙහි (iii) වන අනුඡේදයෙහි " කොළඹ ක්‍රම සංවිධානය මගින් හෝ " යන වචන වෙනුවට "කොළඹ ක්‍රම සංවිධානය මගින් හෝ ආසියා පදනම මගින් හෝ" ; යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) ඒ ඡේදයේ (vi) වන අනුඡේදයේ එන, "ගුවන් හමුදාවක සාමාජිකයකුගේ; සහ" යන වචන වෙනුවට, ' ගුවන් හමුදාවක සාමාජිකයකුගේ; " යන වචන ආදේශ කිරීමෙන්;

(iii) ඒ ඡේදයේ (vii) වන අනුඡේදයේ එන, "සිවිල් තත්ත්වයකින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ තැනැත්තකුගේ," යන වචනය වෙනුවට, "සිවිල් තත්ත්වයකින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ තැනැත්තකුගේ ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(iv) ඒ ඡේදයේ (vii) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (viii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද ආසියා පදනම විසින් ශ්‍රී ලංකාවෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ ද යම් තැනැත්තකුගේ" ;

(ඇ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඖ) ඡේදයෙහි " ඒ පඩිනඩි; සහ " යන වචන වෙනුවට "ඒ පඩිනඩි;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) ඒ වගන්තියේ (1) වන උපවගතියේ (ඕ) ඡේදයෙහි "රුපියල් එක් දහස් දෙසීයක් නොඉක්මවන ලාභ සහ ආදයම" යන වචන වෙනුවට "රුපියල් එක් දහස් දෙසීයක් නොඉක්මවන ලාභ සහ ආදයම;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඕ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් —

"(ක) යම් සේවා නියුක්තයකු පදිංචි ස්ථානයේ සිට වැඩ කරන ස්ථානයට හෝ වැඩ කරන ස්ථානයේ සිට ඔහුගේ පදිංචි ස්ථානයට හෝ ගමන් කිරීම සඳහා සේවා යෝජකයකු විසින් ඒ සේවා නියුක්තයාට සපයන ලද මෝටර් කෝච් රථයකින් නොමිලේ ප්‍රවාහනය කිරීමේ වටිනාකම"; සහ

(ඊ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් —

" (2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි හෝ (ඇ) ඡේදයෙහි හෝ (ඈ) ඡේදයෙහි හෝ (ඉ) ඡේදයෙහි සඳහන් කිසිවක් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව සමග ගිවිසුමකට එළඹී ව්‍යවසායක් නොවන යම් ව්‍යවසායක් සමග හෝ ව්‍යවසායක් විසින් 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව —

(අ) සේවා නියුක්ත ගිවිසුමකට ඇතුළත් වූ ද; නැතහොත්

(ආ) ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබ, සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ ද යම් පුද්ගලයකුට හෝ ඔහු සම්බන්ධයෙන් හෝ අදාල නොවිය යුතුය".

**5** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (ඊ) ඡේදයෙහි "කොටසක් වන යම් පොලියක්" යන වචන වෙනුවට "කොටසක් වන යම් පොලියක්;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (උ) යම් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් සමග විදේශීය ව්‍යවහාර මුදල් වලින් යම් තැනැත්තකුගේ බැරට ඇති මුදල් මත ඔහුට උපචිත වන පොලිය."

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි—

(i) "මේ පනතේ 16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන හෝ 21 වන වගන්ති යටතේ " යන වචන සහ ඉලක්කම් වෙනුවට "මේ පනතේ 15, 16, 16අ, 16ආ, 17, 18, 19, 20, 21, 22අ, 22ආ සහ 22ඇ වන වගන්ති යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) "ගෙවනු ලබන ලාභාංශයක්" යන වචන වෙනුවට "ගෙවනු ලබන යම් ලාභාංශයක් ; " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඇ) සමාගමක් විසින් ලබා ගන්නා ලද, (ආ) ඡේදයෙහි සඳහන් යම් ලාභාංශයකින්, ඒ සමාගමේ කොටස් හිමියන්ට 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන්පසුව ගෙවනු ලබන යම් ලාභාංශයක්, ඒ දෙවනුව සඳහන් ලාභාංශය ගෙවනු ලැබුවේ ඒ සමාගම විසින් පළමු සඳහන් ලාභාංශය ලැබීමෙන් එක් වර්ෂයක් ඇතුළත නම් හෝ ඉන් පසු යම් තක්සේරු වර්ෂයක් තුළ නම්, ".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ ඡේදයේ (xi) අනුඡේදයේ "පැවරීමෙන් හෝ නැති වී යාමෙන්" යන වචන වෙනුවට "පැවරීමෙන් හෝ නැති වී යාමෙන් ;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ ඡේදයේ (xii) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් :—

"(xiii) නිල ලැයිස්තු ගත පොදු සමාගමක කොටස් වන්නා වූ යම් දේපලක් 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන්පසුව සංක්‍රාන්තිවීමෙන්; සහ

(xiv) (අ) 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව, සහ

(ආ) පුද්ගලයකු හුදෙක් ම හෝ වෙනත් අය සමග හවුල් ව්‍යාපාරයක් වශයෙන් හෝ කරගෙන යනු ලබන ව්‍යාපාරයක් නිල ලැයිස්තුගත පොදු සමාගමකට පරිවර්තනය කරනු ලැබූ විට, 1977 මාර්තු මස 31 වන දිනට පෙර ඒ ව්‍යාපාරය සඳහා අත්කර ගන්නා ලද වත්කම්වල යම් කොටසක් 1977 මාර්තු මස 31 වන දින එම වත්කම්වල වෙළෙඳ අගය නොඉක්මවන මිලකට ඒ සමාගමට පවරනු ලැබුවේ නම් සහ එයේ පවරනු ලැබුවේ නම් පමණක්, ඒ ව්‍යාපාරයේ ප්‍රාග්ධන වත්කම්වල යම් කොසක් ඒ සමාගමට පැවරීමෙන්".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (ඒ) ඡේදයේ 'යම් රාජ්‍ය භාගයක්" යන වචන වෙනුවට "යම් රාජ්‍ය භාගයක්;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ඔ) 16අ වගන්තියෙහි සඳහන් සමාගමක් විසින් ඒ සමාගමේ ලාභ සහ ආදායම නිදහස් කරනු ලබන්නේ යම් කාලයක් සඳහා ද ඒ කාලය සඳහා, දළ ලාභවල ප්‍රතිශතයක් වශයෙන් ආගණනය කරනු ලැබ, නිර්වාසික තැනැත්තකුට ගෙවන ලද යම් කළමනාකරණ ගාස්තු, ඒ නිර්වාසික තැනැත්තන් වෙත කරනු ලබන ඒ ගෙවීම, ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්;

(ඕ) 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව ලංකා වෙළඳ මණ්ඩලය විසින් පවත්වනු ලබන යම් මැණික් වෙන්දේසියක දී මැණික් විකිණීමෙන් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම්;

(ක) 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව මැණික් අපනයනය කිරීමෙන් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම;

(ග) යම් තැරැව් කරුවකු විසින් ලංකා වෙළෙඳ මණ්ඩලයෙන් බලපත්‍රයක් ලබාගෙන ඇත්නම්, ඒ මණ්ඩලය විසින් පවත්වනු ලබන යම් මැණික් වෙන්දේසියකදී මැණික් විකිණීමෙන් ඒ තැරැව්කරු විසින් 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව ලබා ගන්නා ලද යම් කොමිස් මුදල් ;

(ච) විදේශීය ව්‍යවහාර මුදලින් භාර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව මැණික් සහ ස්වර්ණාභරණ විකිණීමෙන් විදේශීය ව්‍යවහාර මුදල්වලින් ඒ තැනැත්තා විසින් ලබා ගන්නා ලද මුදලින් ඒ තැනැත්තාට ඇති වන ලාභවල සහ ආදායමේ කොටසක් ;

(ජ) ප්‍රහිත පදනමක් මත, ශ්‍රී ලංකාවට ගෙන්වනු ලැබ, අවස්ථාවෝචිත පරිදි මැණික් ගල්, ලෝහ හෝ භාණ්ඩ යම් සකස් කිරීමකට හෝ නිෂ්පාදනය කිරීමකට භාජනය නොකොට නැවත අපනයනය කරනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි ඒ මැණික් ගල්, ලෝහ හෝ භාණ්ඩ වන—

(i) ශ්‍රී ලංකාවෙහි කණිනු නොලැබූ යම් මැණික් ගල් හෝ ලෝහ;

(ii) යම් ඛනිජ තෙල් නිෂ්පාදන; හෝ

(iii) ඒ භාණ්ඩ අපනයනය කිරීමෙන් රටට උපචිත වීමට ඉඩ ඇති විදේශ විනිමය වාසි කෙරෙහි සැලකිල්ල ඇතිව, මේ ඡේදයේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් එවැනි නිෂ්පාදන,

1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව අපනයනය කිරීමෙන් ප්‍රහිතකරුට හෝ ප්‍රහිතලාභියාට ශ්‍රී ලංකාවේ දී ඇති වන ලාභ සහ ආදායම;

(ට) ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රධානයක් වශයෙන් යම් තැනැත්තකු විසින් ලද යම් ත්‍යාග මුදලක් ;

(ඩ) යම් තැනැත්තකු විසින් කරන ලද නව නිපැයුමක් හෝ භාර ගන්නා ලද යම් පර්යේෂණයක් පිළිගැනීමක් වශයෙන් ආණ්ඩුව විසින් කරන ලද ප්‍රධානයක් ලෙස ඒ තැනැත්තා විසින් ලබාගත් ත්‍යාග මුදලක්",

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (ආ) ඡේදයෙහි "ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයකින් අමාත්‍යවරයා විසින් ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය පිට අනුමත කරන ලද ප්‍රයෝජනයට ගැනීමකට" යන වචන වෙනුවට "ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයකින්, 1980 අප්‍රේල් මස 1 වන දිනට පෙර අමාත්‍යවරයා විසින් ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය පිට අනුමත කරන ලද ප්‍රයෝජනයට ගැනීමකට" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුලත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 16අ සහ 16ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

" 1979 නොවැම්බර් මස 15 වන දිනට පසුව සංස්ථාගත කරන ලද සංචාරක හෝටල් වලට අදාල ඇතැම් ව්‍යවසායවල ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

16අ. (1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් ව්‍යවසායක, (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන යම් ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම, ඒ ව්‍යවසාය විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ කළ දින සිට ආගණනය කරනු ලබන අවුරුදු දහයක කාලයකට, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය මත, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ ;

(ආ) 1979 නොවැම්බර් මය 15 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කරන ලද නිල ලැයිස්තුගත පොදු සමාගමක් විසින් කරගෙන යනු ලබන්නා වූ ; සහ

(ඇ) සහභාග සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය රුපියල් කෝටි දහයකට නොඅඩු

සංචාරකයන් සඳහා හෝටල් පවත්වාගෙන යන්නා වූ යම් ව්‍යවසායකට අදාළ විය යුතු ය.

1979 නොවැම්බර් මස 15 වන දිනට පසු අතිරේක නිදන කාමර ඉදිකරනු ලබන්නා වූ සංචාරක හෝටල් වලට සම්බන්ධ ඇතැම් ව්‍යවසායවල ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

16ආ. 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 6 (1) (v) වන වගන්තිය යටතේ හෝ මේ පනතේ 16අ වගන්තිය යටතේ හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ සංචාරකයන් සඳහා හෝටල් පවත්වාගෙන යන්නා වූ ව්‍යවසායක් 1979 නොවැම්බර් මස 15 වන දිනට පසුව එහි ප්‍රයෝජනය සඳහා අතිරේක නිදන කාමර ඉදිකරනු ලබන්නේ ද ඒ ව්‍යවසායේ අදළ ලාභ සහ ආදායම, ඒ අතිරේක නිදන කාමර ඉදිකිරීම, ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය මත, සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට අත්‍යාවශ්‍ය යයි ගැසට් පත්‍රයෙහි පල කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්, ඒ අතිරේක නිදන කාමර ඉදිකරනු ලැබූ දින සිට ආගණනය කරනු ලබන අවුරුදු පහක කාලයක් සඳහා, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

මේ වගන්තියේ "අදළ ලාභ සහ ආදායම" යන්නෙන්, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන ලාභ සහ ආදායම හැර) ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායමට, 1979 නොවැම්බර් මස 15 වන දිනට පසුව ඉදිකරන ලද අතිරේක නිදන කාමර සංඛ්‍යාව සහ ඒ ව්‍යවසායේ නිදන කාමර මුළු සංඛ්‍යාව අතර අනුපාතයට සමාන අනුපාතයක් දරන මුදලක් අදහස් වේ."

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 22අ, 22ආ සහ 22ඇ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතුය :—

" ඇතැම් ගිවිසුම් ඉටු කිරීමෙන් ඇති වන ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

22අ. (අ) 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කළ ; සහ

(ආ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමග ඇතුළත් වූ ද ඒ අධිකාරිය විසින් භාර ගන්නා ලද යම් වාරිමාර්ග යෝජනා

ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යාවශ්‍ය බවට වූ ඒ අධිකාරියේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ගිවිසුමක් ඉටුකිරීමෙහි හුදෙක්ම නිරත වූ

යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් අත්වන ලාභ සහ ආදායම් නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම ඒ සමාගම විසින් ඒ අධිකාරිය සමග ඇතුළත් වූ පළමු ගිවිසුමෙහි දින සිට ආගණනය කරනු ලැබූ අවුරුදු පහක කාලය සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

දේපළ සංවර්ධනයෙහි නිරත ව්‍යවසායන්ගේ ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම

22ආ. (1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් සමාගමක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් අත්වන ලාභ සහ ආදායම් නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම ඒ සමාගම ව්‍යාපාර කටයුතු කරගෙන යෑම ආරම්භ කරන ලද දින සිට ආගණනය කරන ලද අවුරුදු දහයක කාලය සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කරනු ලැබූ ; සහ

(ආ) ව්‍යාපාර කටයුතු කරගෙන යාම ආරම්භ කරන දිනයෙහි නිල ලැයිස්තුගත පොදු සමාගමක් වන්නා වූ නැතහොත් ව්‍යාපාර කටයුතු කරගෙන යාම ආරම්භ කරන ලද දින සිට අවුරුදු දෙකක් ඇතුළත නිල ලැයිස්තුගත පොදු සමාගමක් බවට පත් වන්නා වූ; සහ

(ඇ) ආණ්ඩුවේ නාගරික සංවර්ධන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අත්‍යවශ්‍යයයි (ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද) නාගරික සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද දේපළ සංවර්ධන යෝජනා ක්‍රමවල හුදෙක්ම නිරත වූ

යම් සමාගමකට අදාළ විය යුතුය.

බලයලත් පොදු සමාගම් මගින් කරගෙන යනු ලබන ව්‍යවසායන්ගේ ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

22ඇ. (අ) නිල ලැයිස්තුගත පොදු සමාගමක් මගින් කරගෙන යනු ලබන,
(ආ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ

යම් ව්‍යවසායක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් අත්වන යම් ලාභ සහ ආදායම් නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම ඒ ව්‍යවසායෙන් කලින් පැවති යම් ව්‍යාපාරයක් කොටස් කිරීමෙන්, ප්‍රතිසංස්කරණය කිරීමෙන්, අත්කර ගැනීමෙන් ඇති කරනු නොලැබුවේ නම්, ඒ ව්‍යවසාය විසින් ව්‍යාපාර කටයුතු කරගෙන යාම ආරම්භ කළ දින සිට ආගණනය කරනු ලැබූ අවුරුදු පහක කාලයක් සඳහා ඒ ව්‍යවසාය ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය,'.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි "1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි "1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "1980 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1981 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයෙහි—

(i) "1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව" යන ඉලක්කම් සහ වචන වෙනුවට, "1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) "1980 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන ඉලක්කම් සහ වචන ඒ ඡේදයෙහි යෙදෙන කවර විටක වුවද ඒ ඉලක්කම් සහ වචන වෙනුවට "1981 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි "යම් නිලධරයකු විසින් පාවිච්චි කරනු ලබන මෝටර් බයිසිකලයක් හෝ බයිසිකලයක් හැර" යන වචන වෙනුවට "යම් නිලධරයකු විසින් පාවිච්චි කරනු ලබන මෝටර් බයිසිකලයක් හෝ බයිසිකලයක් සහ ඒ තැනැත්තාගේ සේවානියුක්තයන් ඔවුන්ගේ වැඩ කරන ස්ථානවලට සහ වැඩ කරන ස්ථානවලින් ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කරනු ලබන මෝටර් කෝච් රථයක් සම්බන්ධයෙන් හැර," යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු වගන්තිය අවසානයෙහි පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

" (v) අවුරුදු හයක් නොඉක්මවන කාලයක් සඳහා ඔහු විසින් වාර්ෂිකයක් ගෙවියයුතු අවස්ථාවක, ඒ වාර්ෂිකය වටිනා සහ ප්‍රමාණවත් ප්‍රතිෂ්ඨාවක් සඳහා හෝ ඒ වාර්ෂිකය ලබන්නාගේ ජීවිතාන්තය දක්වා වූයේ නම් මිස, එවැනි යම් වාර්ෂිකයක් වශයෙන් ඒ අවුරුද්ද තුළ ඔහු විසින් ගෙවියයුතු යම් මුදලක් සම්බන්ධයෙන් කිසිම අඩු කිරීමකට ඉඩ දෙනු නොලැබිය යුතුය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියෙහි (2) වන උපවගන්තියේ අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" එසේ වුවද යම් තක්සේරු වර්ෂයක් සඳහා පුණ්‍යායතනයක බදු අය කළ හැකි ආදයම—

(අ ) 31 වන වගන්තිය යටතේ ඒ ආයතනයට හිමිකම් ඇති යම් දීමනාවක් ; සහ

(ආ) රුපියල් දෙළොස් දහසක දීමනාවක්

සම්බන්ධයෙන් අඩු කිරීමෙන් පසු ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ආයතනයේ තක්සේරු කළ හැකි ආදයම විය යුතුය."

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ඒ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

'(ඔ) යම් තැනැත්තකු විසින්—

(i) ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ ආයතනය පනතින් පිහිටුවන ලද ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ ආයතනයට ;

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පදනමට ;

(iii) 1978 අංක 1 දරන ටවර් හෝල් රඟහල පදනම පනතින් පිහිටුවන ලද ටවර් හෝල් රඟහල පදනමට ;

(iv) 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන් දිරිගැන්වීමේ පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ කොමිසමට

මුදලින් කරන ලද ත්‍යාගක් ;

(ඕ) යම් තැනැත්තකු විසින් සේවයෙහි නියුක්ත කරන ලද කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයෙකු විසින් පදිංචි නිවාසයක් වශයෙන් පදිංචිය සඳහා යම් නිවාසයක් හෝ මහල් නිවාසයක් ඉදි කිරීමේ දී—

(i) ඒ නිවාසයේ හෝ මහල් නිවාසයේ බිම් ප්‍රදේශය වර්ග අඩි එක් දහස් පන්සියයක් නොඉක්මවන්නේ නම් ; සහ

(ii) ඒ නිවාසයේ හෝ මහල් නිවාසය සම්බන්ධයෙන් 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) අනුඡේදයේ හෝ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ දීමනාවක් අඩු කරගත නොහැකි නම්

ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් ප්‍රමාණයක් ;

(ක) 16අ වන වගන්තිය හෝ 22ආ වන වගන්තිය යටතේ අනුමත කරනු ලැබ, ප්‍රාග්ධනය රුපියල් කෝටි පහක් ඉක්මවන්නා වූ ව්‍යාපෘතියක යෙදී සිටින සමාගමක පවත්නා කොටස් නොවන සාමාන්‍ය කොටස් මිලට ගැනීමේ දී යම් තැනැත්තකු විසින් ආයෝජනය කරන ලද යම් මුදලක්

අදහස්වේ.

මේ ඡේදයේ කාර්ය සඳහා "ප්‍රාග්ධනය" යන්නෙහි, 18 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය';

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "(2) වන උප වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන්" යන වචන වෙනුවට "(2) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ක ඡේදවල සඳහන්" යන වචන ආදේශ කිරීමෙන්;සහ

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "(2) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන්" යන වචන වෙනුවට "(2) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ක) ඡේදවල සඳහන්" යන වචන ආදේශ කිරීමෙන්.",

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත්ව, එක් එක් තක්සේරු වර්ෂය සඳහා යම් තැනැත්තකුගේ ඒ වර්ෂයේ බදු අය කළ හැකි ආදායම මත—

(අ) ඔහු දේපළ භාරගන්නකුගේ, භාරකරුවකුගේ, පොල්මංකරුවකුගේ හෝ ඇවරකරුවකුගේ තත්ත්වයෙන් ක්‍රියා කරන්නකු නොවන පුද්ගලයකු නම්—

(i) 1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ I වන කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව;

(ii) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව;

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද 67 වන වගන්තියේ (7) වන උපවගන්තියේ නිර්වාසික පුද්ගලයකු ලෙස සලකනු ලබන්නේ නම්, මේ පනතේ පළමුවන උපලේඛනයේ III වන කොටසෙහි සඳහන් අනුප්‍රමාණය අනුව;

(ඇ) ඒ තැනැත්තා සමාගමක් හෝ (අ) ඡේදය අදාළ වන පුද්ගලයකු හෝ නොවන තැනැත්තකු නම්, 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ තුන්වන උපලේඛනයෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව.";

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "ඒ අතිරික්තය සඳහා ඒ තක්සේරු වර්ෂයට" යන වචනවල සිට ඒ උප වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව සේවා යෝජක විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ සියලු පුද්ගලයන්ට ඒකාකාර ලෙස අදාළ වන ක්‍රමයක් අනුව ඉහත සඳහන් මුදල ඒ පුද්ගලයාගේ සේවායෝජක විසින් ගෙවන ලැබ ඇත්නම්, මේ පනතේ පළමුවන උප ලේඛනයේ IV වන කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව බද්දක් අය කරනු ලැබිය යුතු ය. කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව ඒ සේවායෝජක විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ සියලු පුද්ගලයන්ට ඒකාකාර ලෙස අදාළ නොවන ක්‍රමයක් අනුව ඉහත සඳහන් යම් මුදලක් ඒ පුද්ගලයාට ගෙවනු ලැබ ඇත්නම්—

(i) 1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ I වන කොටසෙහි; හෝ

(ii) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසෙහි

සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ඔහුගේ බදු අයකළ හැකි ආදායමෙන් (අතිරික්තය ඇතුළුව) බද්දක් අය කරනු ලැබිය යුතු ය." ; සහ

(ඇ) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.:–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ ''යම් තක්සේරු වර්ෂයක් තුළ ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක්'' යන වචන වෙනුවට ''1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක්'' යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

''(1අ) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක් ඒ තක්සේරු වර්ෂය වෙනුවෙන් ගෙවීමට යටත් ආදායම් බද්ද—

(අ) (i) ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේ ම හෝ ඒ තක්සේරු වර්ෂය තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ සමාගමක් වී නම්, එය සංස්ථාගත කරනු ලැබූ දින සිට, ඒ වර්ෂයේ අවසානය දක්වා යම් සමාගමක්, නිල ලැයිස්තුගත පොදු සමාගමක් මෙන්ම කුඩා සමාගමක් ද වී නම්, මේ පනතේ දෙවන උපලේඛනයේ IV වන කොටසෙහි සඳහන් උචිත බදු අනුප්‍රමාණය හෝ අනුප්‍රමාණ අනුව ඒ තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම මත ගණන් බලනු ලැබූ ප්‍රමාණයකින්; හෝ

(ii) ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේම හෝ තක්සේරු වර්ෂය තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ සමාගමක් වී නම්, එය සංස්ථාගත කරනු ලැබූ දින සිට ඒ වර්ෂයේ අවසානය දක්වා නිල ලැයිස්තු ගත පොදු සමාගමක් වූ සමාගමක් සම්බන්ධයෙන් මේ පනතේ දෙවන උපලේඛනයේ IV වන කොටසෙහි සඳහන් උචිත බදු අනුප්‍රමාණය අනුව, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම මත ගණන් බලනු ලැබූ මුදලකින් ; හෝ

(iii) ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේ ම හෝ ඒ තක්සේරු වර්ෂය තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ සමාගමක් වී නම්, එය සංස්ථාගත කරනු ලැබූ දින සිට ඒ වර්ෂයේ අවසානය දක්වා නිල ලැයිස්තුගත පොදු සමාගමක් වූ සහ ජනතා සමාගමක් වූ සමාගමක් සම්බන්ධයෙන් වන විට මේ පනතේ දෙවන උපලේඛනයේ IV වන කොටසෙහි සඳහන් උචිත බදු අනුප්‍රමාණය අනුව, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම මත ගණන් බලනු ලැබූ ප්‍රමාණයකින් ; නැතහොත්

(ආ) (i) (අ) (ආ) අනුච්ඡේදයෙහි හෝ (ඇ) අනුච්ඡේදයෙහි සඳහන් සමාගමක් නොවන වෙනත් සමාගමක් සම්බන්ධයෙන් වන විට, මේ පනතේ දෙවන උපලේඛනයෙහි I වන කොටසෙහි ; හෝ

(ආ) ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේ ම හෝ ඒ තක්සේරු වර්ෂය තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ සමාගමක් වී නම්, එය සංස්ථාගත කරනු ලැබූ දින සිට, ඒ වර්ෂයේ අවසානය දක්වා කුඩා සමාගමක් වූ සමාගමක් සම්බන්ධයෙන් වන විට, මේ පනතේ දෙවන උපලේඛනයේ II වන කොටසෙහි ; හෝ

(ඇ) ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේ ම හෝ ඒ තක්සේරු වර්ෂය තුළ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වී නම්, එය සංස්ථාගත කරනු ලැබූ දින සිට ඒ වර්ෂයේ අවසානය දක්වා ජනතා සමාගමක් වූ සමාගමක් සම්බන්ධයෙන් වන විට, මේ පනතේ දෙවන උපලේඛනයේ III වන කොටසෙහි

සඳහන් උචිත බදු ප්‍රමාණය හෝ ප්‍රමාණ අනුව ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම මත ගණන් බලනු ලැබූ ප්‍රමාණයකින් ; සහ

(ii) යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම ආගණනය කරනු ලැබුවේ යම් ලාභ මත ද ඒ ලාභවලින් ඒ තක්සේරු වර්ෂය තුළ ඒ සමාගම විසින් බෙද දෙන ලද මුළු ලාභාංශවල එකතුවෙන් සියයට විස්සකට සමාන මුදලකින් සමන්විත විය යුතු ය." ; තවද

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "(1) වන උප වගන්තියේ කාර්ය සඳහා" යන වචන වෙනුවට "(1) වන සහ (1අ) වන උපවගන්තිවල කාර්ය සඳහා" වන වචන ආදේශ කිරීමෙන්.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "දෙවන උපලේඛනයේ IV වන කොටසෙහි දැක්වෙන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "දෙවන උපලේඛනයේ V වන කොටසෙහි සඳහන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) වාසික සමාගමක් විසින් ඒ නිර්වාසික සමාගමට ගෙවන ලද යම් ලාභාංශ ඇතුළත් නොවන්නා වූ සමාගම විසින් පිටරටට ප්‍රේෂණය කළ හෝ පිටරටෙහි දී රඳවා ගනු ලැබූ මුදල් ; "

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඈ) පළමු සඳහන් වාසික සමාගම නිල ලැයිස්තු ගත පොදු සමාගමක් වන්නා වූ ; හෝ ".

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (අ) ඡේදයෙහි "අදාළ ලාභාංශ ප්‍රමාණය සියයට පනහකින් වැඩි කළ විට" යන වචන වෙනුවට, "ලාභාංශ 1980 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර ගෙවිය යුතු අවස්ථාවක, සියයට පනහකින් වැඩි කළ විට සහ ලාභාංශය 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ගෙවිය යුතු අවස්ථාවක සියයට විසි පහකින් වැඩි කළ විට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි "සමාන ආදයම් බද්දක්; සහ" යන වචන වෙනුවට "සමාන ආදයම් බද්දක් ;" යන වචන ආදේශ කිරීමෙන් සහ ඒ වගන්තියේ (ඇ) ඡේදයෙහි "ආදයම් බද්දක්" යන වචන වෙනුවට, "ආදයම් බද්දක්; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) නිල ලැයිස්තුගත පොදු සමාගමකින් යම් නේවාසික සමාගමකට ලැබුණු ලාභාංශයක මුදලින් අදාළ ලාභාංශය ගෙවනු ලබන්නේ නම්, ඒ අදාළ ලාභාංශයේ මුදලින් සියයට පහකට සමාන ආදායම් බද්දක්".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ පහත දැක්වෙන පිරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) "සෑම වාසික සමාගමකට ම" යන වචන වෙනුවට "නිල ලැයිස්තුගත පොදු සමාගමක් නොවන සෑම වාසික සමාගමකට ම" ; සහ

(ආ) "යම් කොටස්කරුවකුට ගෙවිය යුතු යම් ලාභාංශ ප්‍රමාණයකින් සියයට තිස්තුනයි තුනෙන් එකකට සමාන ආදායම් බද්දක් අඩුකර ගැනීමට හිමිකම් තිබිය යුතු ය" යන වචන වෙනුවට "යම් කොටස් කරුවකුට 1980 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක, ඒ ප්‍රමාණයෙන් සියයට තිස්තුනයි තුනෙන් එකකට සමාන ආදායම් බද්දක් සහ 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක, ඒ ප්‍රමාණයෙන් සියයට විස්සකට සමාන ආදායම් බද්දක් අඩු කර ගැනීමට හිමිකම තිබිය යුතුය"

යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කර තිබේ ද යන වග" යන වචන වෙනුවට "මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කර තිබේ ද නැතහොත් නිල ලැයිස්තු ගත පොදු සමාගමකින් ලැබී තිබේ ද යන වග" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි—

(අ) "ඒ ප්‍රමාණය සියයට පනහකින් වැඩි කළ යුතු අතර, එකී සියයට පනහට සමාන මුදලක් ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමේ හිමිකම ඔහුට ලැබිය යුතුය" යන සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

(අ) 1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ ප්‍රමාණය සියයට පනහකින් වැඩි කළ යුතු අතර, එකී සියයට පනහට සමාන ප්‍රමාණයක් ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමේ හිමිකම ඔහුට ලැබිය යුතු ය ; තව ද

(ආ) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ ප්‍රමාණය සියයට විසිපහකින් වැඩි කළ යුතු අතර, එකී සියයට විසිපහට සමාන ප්‍රමාණයක් ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමේ හිමිකම ඔහුට ලැබිය යුතු ය :";

(ආ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම "ඒ සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "ඒ සම්බන්ධයෙන් ; හෝ" යන වචන ආදේශ කිරීමෙන් :

(ඇ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) නිල ලැයිස්තුගත පොදු සමාගමකින් ලැබුණු යම් ලාභාංශයක මුදල සම්බන්ධයෙන්."; තව ද

(4) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "සියයට තිස්තුනයි තුනෙන් එකක" යන වචන අත්හැරීමෙන්.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් නිශ්චල දේපළක වටිනාකම ඒ තක්සේරු වර්ෂයේ පළමුවන දිනයෙහි එහි වෙළෙඳ වටිනාකම විය යුතු ය :

එසේ වුව ද ධනය තක්සේරු කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ ද (මේ වගන්තියේ "තක්සේරු කරනු ලබන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ තැනැත්තාගේ ධනයෙන් කොටසක් වශයෙන් 1977 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළ පැවතියේ නම් හෝ 1977 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළෙහි අයිතිකරු වූ හෝ ඊට සම්බන්ධතාවක් දරනු ලැබූ වෙනත් තැනැත්තකුගෙන් තක්සේරු කරනු ලබන්නා විසින් ත්‍යාගයක හෝ උරුමයක ආකාරයෙන් අත්කර ගනු ලැබුවේ නම්, 1979 අප්‍රේල් මස 1 වන දිනයෙහි ඒ දේපළෙහි වෙළෙඳ අගය 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ දේපළ සම්බන්ධයෙන් කරන ලද යම් වැඩි දියුණු කිරීම්, එකතු කිරීම් හෝ වෙනස් කිරීම්වල වියදමට සමාන මුදලකින් ද වැඩි කරනු ලැබූ මුදල හෝ ඒ වර්ෂයේ අප්‍රේල් මස 1 වන දිනයෙහි එහි වෙළෙඳ අගය හෝ යන දෙකින් කවර වූ අඩු මුදල 1977 අප්‍රේල් මස 1 වන දිනයෙහි එහි වෙළෙඳ වටිනාකම ලෙස සලකනු ලැබිය යුතු ය.'.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයෙහි "වටිනාකමින් රුපියල් ලක්ෂ තුනක උපරිමයකට යටත්ව, 31 (9) වන වගන්තියේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16 අ වගන්තියේ හෝ අර්ථානුකූලව අනුමත පුණ්‍ය කාර්යයක් වන පුණ්‍ය කාර්යයකට ඒ එක් එක් ත්‍යාගයේ වටිනාකම රුපියල් එක් දහසකට අධිකව දෙනු ලැබූ ත්‍යාගයකට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "වටිනාකමින් රුපියල් ලක්ෂ පහක උපරිමයකට යටත්ව මේ පනතේ 31 (9) වන වගන්තයේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16 අ වගන්තියේ හෝ අර්ථානුකූලව අනුමත පුණ්‍ය කාර්යයක් වන පුණ්‍ය කාර්යයකට හෝ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඔ) ඡේදයෙහි සඳහන් යම් ආයතනයකට, පදනමකට හෝ කොමිෂමකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1අ) ත්‍යාගය සංයුක්ත වන දේපළ 1977 අප්‍රේල් මස 1 වන දිනට පෙර ත්‍යාගකරු විසින් අත්කර ගන්නා ලද නිශ්චල දේපළක් වන අවස්ථාවක, ත්‍යාගය දෙනු ලැබූ දිනයේ දී ඒ දේපළෙහි වෙළෙඳ අගය 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ දේපළ සම්බන්ධයෙන් කරන ලද යම් වැඩිදියුණු කිරීම්, එකතු කිරීම්, හෝ වෙනස් කිරීම්වල වියදමට සමාන මුදලකින් වැඩි කරනු ලැබූ මුදල හෝ ඒ වර්ෂයේ අප්‍රේල් මස 1 වන දිනයෙහි එහි වෙළෙඳ අගය හෝ යන දෙකින් කවර වූ අඩු මුදල 1977 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළෙහි වෙළෙඳ අගය ලෙස සලකනු ලැබිය යුතු ය.".

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය අවසානයේ දී පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(7) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද ශ්‍රී ලංකාවෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින්නා වූ ද පුද්ගලයකු, ඉහතින් වූ උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුවද, ඔහු ශ්‍රී ලංකාවෙහි සේවා නියුක්තිය ආරම්භ කළ දින සිට ගණන් බලනු ලැබූ අවුරුදු තුනක කාලයක් සඳහා නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.".

LIBRARY



**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තියේ (ආ) ඡේදයෙහි ඇති " ශ්‍රී ලංකාවෙහි ඇති නොවන ආදයමෙන් ගෙවනු ලැබූ පොලියකට හෝ බැංකු කරුවකු විසින් දෙනු ලැබූ යම් ණයක හෝ අත්තිකාරමක පොලියකට " යන වචන වෙනුවට " ශ්‍රී ලංකාවෙහි ඇති නොවන ආදයමෙන් ගෙවනු ලැබූ පොලියකට හෝ බැංකුකරුවකු විසින් දෙනු ලැබූ යම් ණයක හෝ අත්තිකාරමක පොලියකට හෝ යම් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් සමග විදේශ ව්‍යවහාර මුදලින් යම් තැනැත්තකුගේ බැරට ඇති මුදලට ඔහුට ගෙවනු ලැබූ යම් පොලියකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"රක්ෂණයෙන් ලැබෙන ඇතැම් ලැබීම් කෙසේ සලකනු ලැබිය යුතු ද යන වග.

89. රක්ෂණ වාරික වශයෙන් ගෙවන ලද යම් මුදලක් යම් වෙළඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලාභ හෝ ආදයම් ඉපයීමෙහි ලා දරන්නට සිදු වූ වියදමක් වශයෙන් අඩු කිරීමට ඉඩ දී ඇති අවස්ථාවක ඒ රක්ෂණ ගිවිසුම යටතේ ලබාගත් යම් මුදලක් පහත දැක්වෙන පරිදි සලකනු ලැබිය යුතු ය :—

(අ) එසේ ලබාගත් මුදල වෙළෙඳාම් බඩු තොගය හෝ ලාභ නැති වීයාම හෝ මේ වගන්තියේ (ආ) හෝ (ඇ) වන අනුඡේදයෙහි සඳහන් නොවන වෙනත් යම් මුදලක් සම්බන්ධයෙන් නම්, ඒ වෙළෙඳාමෙන්, ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් ලැබූ ලැබීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ආ) එසේ ලබාගත් මුදල 23 වන වගන්තියේ (7) වන උපවගන්තියේ අර්ථානුකූලව, ක්ෂයවීම සඳහා දීමනාවක් ප්‍රදානය කරනු ලැබූ ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් නම්, දේපළ බැහැර කිරීමෙන් ලබාගත් මුදලක් වශයෙන් සලකනු ලැබිය යුතු ය; තව ද, ඒ අනුව එම වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන ඒ මුදල් ප්‍රමාණයට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය ;

(ඇ) එසේ ලබාගත් මුදල, 23 වන වගන්තියේ (7) වන උපවගන්තියේ අර්ථානුකූලව, ක්ෂයවීම සඳහා දීමනාවක් ප්‍රධානය කරනු නොලැබූ ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් නම්, දේපළෙහි අයිතිය වෙනස්වීමෙන් ලබාගත් මුදල් ප්‍රමාණයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය. තව ද ඒ අනුව 7 වන වගන්තියේ විධිවිධාන ඒ මුදල් ප්‍රමාණයට හා ඒ සම්බන්ධයෙන් අදල විය යුතු ය.".

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තියේ (5) වන උප වගන්තියේ අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"එසේ වුව ද යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් සේවා නියුක්තියෙන් ලබන ලාභවලට අදළ යම් හිඟ මුදල් ඒ තැනැත්තා විසින් ලබා ගැනීමට ආනුෂංගිකව ඒ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ආදයම් බද්ද තක්සේරු කිරීම සම්බන්ධයෙන් මේ උපවගන්තියේ කිසිවක් අදළ නොවිය යුතු ය:

එසේම තවදුරටත් යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු තක්සේරු නොකිරීම හෝ අඩුවෙන් තක්සේරු කිරීම වංචාවක් නිසා හෝ චුවමනාවෙන් ම වැළකීම නිසා වන අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂය අවසාන වීමෙන් පසු කවර වූ හෝ අවස්ථාවක දී ඒ තැනැත්තා පිළිබඳව තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලැබිය හැකි ය.".

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ (i) ඡේදයෙහි "සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය." යන වචන වෙනුවට "සියයට පනහක් නොඉක්මවිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ (ii) ඡේදයෙහි "මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කිසියම් දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය" යන වචන වෙනුවට "ඒ ත්‍රෛමාසික බදු වාරික ලැබිය යුතු වූ තක්සේරු වර්ෂයේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන නොවැම්බර් මස තිස්වන දින තෙක් මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කිසියම් දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය ;" යන වචන ආදේශ කිරීමෙන්.

**31** ප්‍රධාන ප්‍රඥප්තියේ 131 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 131අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

"බද්ද මුදලින් ගෙවීම වෙනුවට ආණ්ඩුවට නිශ්චල දේපළ පැවරීම.

131අ. (1) මේ පනතේ හෝ 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ යම් බද්දක් ගෙවීමට යටත් යම් තැනැත්තකු විසින්, ඒ බද්ද මුදලින් ගෙවීම වෙනුවට ඒ තැනැත්තාට අයත් යම් නිශ්චල දේපළක් ඒ තැනැත්තා සහ කොමසාරිස් ජනරාල්වරයා අතර එකඟත්වයෙන් ඒ දේපළ මත තබනු ලබන වටිනාකම අනුව ආණ්ඩුවට පැවරීමට කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය. තව ද ඒ දේපළ ආණ්ඩුව වෙත පැවරීමෙන් පසු එය කළමනාකරණය කිරීමේ සත්‍යතාව සැලකිල්ලට ගෙන කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ ඉල්ලීමට ඉඩ දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උප වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමකට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉඩ දෙනු ලබන අවස්ථාවක, ඉල්ලීම කරනු ලැබුවේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළෙහි වටිනාකම වශයෙන්, ඒ උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව එකඟ වූ මුදල ඉල්ලුම්කරු විසින් ගෙවිය යුතු බද්දේ මුදල ඉක්මවන අවස්ථාවක, ඒ අතිරික්තය, 31 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (ආ) ඡේදයේ අර්ථානුකූල ව ඉල්ලුම් කරු විසින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට කරන ලද පරිත්‍යාගයක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

**32** ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තියේ (3) වන උප වගන්තියේ අතුරු වගන්තියේ (1) ඡේදයෙහි "සියයට" විසිපහකට වඩා වැඩි නොවිය යුතුය; තව ද" යන වචන වෙනුවට "සියයට පනහකට වඩා වැඩි නොවිය යුතුය; තව ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) "ලංකා සංචාරක මණ්ඩලය" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:—

'"ලංකා වෙළඳ මණ්ඩලය" යන්නෙන්, වෙළඳ මණ්ඩල ආඥාපනතින් සංස්ථාගත කරන ලද ලංකා වෙළඳ මණ්ඩලය අදහස් වේ;';

(ආ) ''දරුවා'' යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:—

''වාණිජ බැංකුව'' යන්නෙහි මුදල් නීති පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;';

(ඇ) ''විධායක නිලධරයා'' යන අර්ථකථනයෙහි ''රුපියල් එක් දහසකට'' යන වචන වෙනුවට ''රුපියල් එක්දහස් පන්සියයකට'' යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) ''විදේශීය ව්‍යවහාර මුදල්'' යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:—

''විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකය'' යන්නෙන් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දෙන ලද වාණිජ බැංකුවක ඒකකයක් හෝ දෙපාර්තමේන්තුවක් අදහස් වේ;'';

(ඉ) ''දේපළ'' යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:—

''නිල ලැයිස්තුගත පොදු සමාගම'' යන්නෙන්, ශ්‍රී ලංකාවේ වාසික වූ ද—

(i) කොළඹ තැරැව් කරුවන්ගේ සංගමයේ රීති අනුව ඒ සංගමය විසින්; හෝ

(ii) කොළඹ තැරැව්කරුවන්ගේ සංගමය විසින් ඉටුකරනු ලබන කර්තව්‍යයන්ට සමාන කර්තව්‍ය වෙනත් යම් මණ්ඩලයක් විසින් ඉටු කරන බව සැලකිල්ලට ගෙන, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන ඒ වෙනත් යම් මණ්ඩලය විසින් හෝ පළකරන ලද යම් නිල ලැයිස්තුවක, එහි කොටස් සඳහන් කරනු ලැබූ සමාගමක් බවට තක්සේරුකරු සෑහීමට පත් වන්නා වූ ද සමාගමක් අදහස් වේ.'.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපලේඛනය ආදේශ කරනු ලැබේ:—

''පළමුවන උපලේඛනය''

32 වන වගන්තිය

ආදායම් බද්දෙහි අනුප්‍රමාණය — යම් දේපළ භාරගන්නන්, භාරකරුවන්, පොල්මඃ කරුවන් හෝ ඇවරකරුවන් නොවන පුද්ගලයන්.

I වන කොටස

1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු අනුප්‍රමාණය පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | බද්දෙහි අනුප්‍රමාණය |
| බදු අය කළ හැකි ආදායමෙහි | පළමුවන | රු. 4,800 | සම්බන්ධයෙන් | .... | සියයට 7½ |
| | ඊළඟ | රු. 4,800 | ,, | .... | සියයට 10 |
| | ,, | රු. 4,800 | ,, | .... | සියයට 15 |
| | ,, | රු. 4,800 | ,, | .... | සියයට 20 |
| | ,, | රු. 4,800 | ,, | .... | සියයට 25 |
| | ,, | රු. 4,800 | ,, | .... | සියයට 30 |
| | ,, | රු. 4,800 | ,, | .... | සියයට 35 |
| | ,, | රු. 4,800 | ,, | .... | සියයට 40 |
| | ,, | රු. 7,200 | ,, | .... | සියයට 45 |
| | ,, | රු. 7,200 | ,, | .... | සියයට 50 |
| | ,, | රු. 7,200 | ,, | .... | සියයට 55 |
| | ,, | රු. 7,200 | ,, | .... | සියයට 60 |
| | ,, | රු. 7,200 | ,, | .... | සියයට 65 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් | | | | .... | සියයට 70 |

II වන කොටස

1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්දේ අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

| | | | | | බද්දෙහි අනුප්‍රමාණය |
|---|---|---|---|---|---|
| බදු අය කළ හැකි ආදායමෙහි | පළමුවන රු. 4 800 | සම්බන්ධයෙන් | .... | සියයට | 7½ |
| | ඊළඟ රු. 4,800 | ,, | .... | සියයට | 10 |
| | ,, රු. 4,800 | ,, | .... | සියයට | 15 |
| | ,, රු. 4,800 | ,, | .... | සියයට | 20 |
| | ,, රු. 4,800 | ,, | .... | සියයට | 25 |
| | ,, රු. 4 800 | ,, | .... | සියයට | 30 |
| | ,, රු. 4,800 | ,, | .... | සියයට | 35 |
| | ,, රු. 4,800 | ,, | .... | සියයට | 40 |
| | ,, රු. 7,200 | ,, | .... | සියයට | 45 |
| | ,, රු. 7,200 | ,, | .... | සියයට | 50 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඉතිරි කොටස | | සම්බන්ධයෙන් | .... | සියයට | 55 |

III වන කොටස

ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද 67 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නිර්වාසික ලෙස සලකනු ලබන්නා වූ ද පුද්ගලයකුට 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා අදාළ වියයුතු ආදායම් බද්දෙහි අනුප්‍රමාණය සියයට 25 කි.

IV වන කොටස

32 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් සේවා නියුක්තියෙන් ලබන ඇතැම් ලාභවලට අදළ විය යුතු ආදායම් බද්දෙහි අනුප්‍රමාණ:—

| | | |
|---|---|---|
| පළමුවන රුපියල් 50,000 | සම්බන්ධයෙන් | කිසිවක් නැත |
| ඊළඟ රුපියල් 25,000 | සම්බන්ධයෙන් | සියයට 5 |
| ඊළඟ රුපියල් 25,000 | සම්බන්ධයෙන් | සියයට 10 |
| ඉතිරි කොටස | සම්බන්ධයෙන් | සියයට 15". |

35 ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ උපලේඛනයේ IV වන කොටස ඒ උපලේඛනයේ V වන කොටස වශයෙන් නැවත අංක කිරීමෙන්; සහ

(ආ) ඒ උප ලේඛනයේ III වන කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:—

"IV වන කොටස

නිල ලැයිස්තුගත පොදු සමාගමක—

නිල ලැයිස්තුගත පොදු සමාගමක බදු අය කළ හැකි ආදායම මත... සියයට 40".

36. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ 4 වන විෂයයේ (අ) ඡේදයෙහි "සියයට 70" යන වචනය සහ ඉලක්කම් වෙනුවට "සියයට 55" යන වචනය සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## 1980 අංක 29 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 අගෝස්තු මස 7 වන දින]

1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 1980 අංක 29 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 26 දරන පනතින් අවසාන වරට සංශෝධනය කරන ලද 1963 අංක 11 දරන මුදල් පනතේ 120 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (iv) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් තව දුරටත් සංශෝධය කරනු ලැබේ :—

" (iv) ආභරණ හෝ 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනතේ අර්ථානුකූලව මැණික් හෝ හැර යම් නිෂ්පාදිත හෝ පදම් කළ භාණ්ඩ අපනයනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායයක්:".

---

## 1980 අංක 43 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ඔක්තෝබර් මස 24 වන දින]

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 1980 අංක 43 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අළුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"කොමිෂන් සභාවේ පාලන බලය.

5. කොමිෂන් සභාවට—

(1) බල ප්‍රදේශය සහ එම ප්‍රදේශය සම්බන්ධයෙන් ;

(2) යම් බලපත්‍රලත් කලාපයක සහ ඒ කලාපය සම්බන්ධයෙන් ; සහ

(3) යම් බලපත්‍රලත් ව්‍යවසායක සහ ඒ ව්‍යවසාය සම්බන්ධයෙන් පාලන බලය තිබිය යුතුය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අළුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"බල ප්‍රදේශය තුළ සහ බලපත්‍රලත් කලාප තුළ විශේෂ බලතල.

20 (1) කොමිෂන් සභාව විසින්—

(අ) මෙහි "ඇ" උපලේඛනයෙහි සඳහන් තත් කාලය සඳහා වූ ලිඛිත නීති යටතේ වූ යම් අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක්, නියමයක් හෝ නිවේදනයක් මුළු බල ප්‍රදේශය හෝ යම් බලපත්‍ර ලත් මුළු කලාපයක් සඳහා හෝ එහි යම් නිශ්චිත කොටසක් සඳහා සෑදීම හෝ නිකුත් කිරීම ; සහ

(ආ) යම් නිලධරයකු හෝ තැනැත්තකු වෙත එකී යම් ලිඛිත නීතියකින් සතු කරනු ලැබූ හෝ පවරනු ලැබූ බලතල හෝ කටයුතු සියල්ල හෝ ඉන් කිසිවක් හෝ බල ප්‍රදේශය හෝ යම් බලපත්‍රලත් කලාපයක් තුළ හෝ එහි යම් කොටසක හෝ ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම

නීත්‍යානුකූල විය යුතුය යන සුළු වශයෙන් වූ වෙනස් කිරීමට යටත්ව ඒ අතුරු ව්‍යවස්ථා, නියෝග, නියම හෝ නිවේදන සෑදීමට හෝ නිකුත් කිරීමට හෝ ඒ බලතල හෝ කටයුතු ක්‍රියාත්මක කිරීමට හෝ කිරීමට බලය පවරනු ලැබූ බලධරයා, නිලධරයා හෝ තැනැත්තා සම්බන්ධයෙන් එකී යම් ලිඛිත නීතියක වූ සඳහන් කිරීම්, කොමිෂන් සභාව සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම වූවාක් මෙන් සමාන ආකාරයෙන් එකී ලිඛිත නීති බල ප්‍රදේශය තුළ සහ සෑම බලපත්‍රලත් කලාපයක් තුළම බලාත්මක විය යුතු ය.

(2) මේ වගන්තියෙහි සඳහන් යම් බලයක් හෝ කටයුත්තක් කොමිෂන් සභාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට හෝ කිරීමට යම් නිලධරයකු හෝ තැනැත්තකු කොමිෂන් සභාව විසින් රීති මගින් නම් කළ හැකි ය.''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 22අ වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතුය :—

''බලපත්‍රලත් කලාප පිහිටුවීම.

22අ. (1) බලපත්‍රලත් ව්‍යවසායක් විසින් බල ප්‍රදේශයට ඇතුළත් නොවන යම් ප්‍රදේශයක, ව්‍යාපාර පිහිටුවීම පිණිස පහසුකම් හෝ වැඩිදියුණු කිරීම් සැලැස්වීමට අවශ්‍ය යයි සහ ඒ කාර්ය සඳහා මේ පනත යටතේ වූ ඇතැම් බලතල ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවට හැකි කරවීම අවශ්‍ය යයි ජනාධිපතිවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින්, ගැසට් පත්‍රයෙහි පල කරනු ලබන නියමයක් මගින්, ඒ ප්‍රදේශය බලපත්‍රලත් කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සහ ඒ කලාපයේ මායිම් නියම කිරීම කළ හැකිය.

(2) බලපත්‍රලත් කලාපයක් (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක කොමිෂන් සභාව හැර වෙනත් කිසිම තැනැත්තකු, මණ්ඩලයක් හෝ අධිකාරයක් විසින් යම් ලිඛිත නීතියක් යටතේ ඒ කලාපය ඇතුළත ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමට හෝ සැලසුම් කිරීම්, සංවර්ධනය කිරීම් හෝ වැඩි දියුණු කිරීම් අනුමත කිරීමට හෝ අදාළ යම් බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සහ කර්තව්‍යය කිරීම නොකළ යුතු ය.''.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(අ) ''බලපත්‍රලත් ව්‍යවසාය'' යන්නෙහි අර්ථකථනයේ '' අදහස් වේ; තව ද'' යන වචන වෙනුවට ''අදහස් වේ;'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ''බලපත්‍රලත් ව්‍යවසාය'' යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'''බලපත්‍රලත් කලාපය'' යන්නෙන් 22අ වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද කලාපයක් අදහස් වේ; තවද'.

**6.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ "ආ" උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) "1963 අංක 4 දරන දේශීය ආදායම් පනත" යන විෂයයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් විෂයය ඇතුළත් කිරීමෙන් :—

"1979 අංක 28 දරන දේශීය ආදායම් පනත."; සහ

(ආ) "1961 අංක 65 දරන මුදල් පනත" යන විෂයයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් විෂයය ඇතුළත් කිරීමෙන් :—

"1963 අංක 11 දරණ මුදල් පනතේ XII වන කොටස".

(2) (අ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ "ආ" උපලේඛනයෙහි කරන ලද සංශෝධනය, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

(ආ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ "ආ" උපලේඛනයෙහි කරන ලද සංශෝධනය, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

---

## 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත

[සහතිකය සටහන් කළේ 1980 ඔක්තෝබර් මස 29 වන දින]

**මධ්‍යම පාරිසරික අධිකාරියක් පිහිටුවීම සඳහා ද එම අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්ය පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා ද පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සහ ඒ සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

**1.** මේ පනත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයකින්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට, එය ක්‍රියාත්මක විය යුතු ය.

### 1 වන කොටස

### මධ්‍යම පාරිසරික අධිකාරිය සහ පාරිසරික සභාවක් පිහිටුවීම

**2.** (1) මේ පනතේ කාර්ය සඳහා මධ්‍යම පාරිසරික අධිකාරිය යනුවෙන් හඳුන් වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (1) වන උප වගන්තිය යටතේ පිහිටුවන ලද (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මධ්‍යම පාරිසරික අධිකාරිය, 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අධිකාරියේ තත් කාලීන සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙන් අධිකාරියට පැවරුණු නමින් ඒ අධිකාරිය සංස්ථාවක් විය යුතු ය. එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද ඒ නාමයෙන් අධිකාරිය විසින් නඩු පවරනු ලැබීමට ද අධිකාරියට, විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

3. (1) අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනකුගෙන් අධිකාරිය සමන්විත විය යුතු අතර—

(අ) ඉන් දෙදෙනෙක් පරිසර විෂයය පිළිබඳ ප්‍රමාණවත් විශේෂඥතාවක් හා සුදුසුකම් ඇත්තන් විය යුතු ය; තවද,

(ආ) ඉන් එක තැනැත්තෙක් පාරිසරික කළමනාකරණය පිළිබඳ යෝග්‍ය පරිපාලන කුසලතාවයක් හා ඒ පිළිබඳ පලපුරුද්දක් ඇත්තකු විය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයන් අතුරින් එක් තැනැත්තකු අධිකාරියේ සභාපතිවරයා වශයෙන් පත් කළ යුතු ය.

4. (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය භාරයේ තිබිය යුතු ය.

(2) අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකට අධිකාරියේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අධිකාරියේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන් තැබිය යුතු ය.

5. (1) අධිකාරියට අධිකාරියේ ම අරමුදලක් තිබිය යුතු ය.

අධිකාරියේ අරමුදලට—

(අ) අධිකාරියේ පරිහරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේදී, කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමේ දී අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන්; සහ

(ඇ) ශ්‍රී ලංකාවෙහි හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර කවර හෝ ප්‍රභවයන්ගෙන් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රධාන වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන් බැර කරනු ලැබිය යුතු ය.

(2) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමේදී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් ගෙවීමට අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණයන් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් දෙකෝටියක් විය යුතු ය. ආරම්භක ප්‍රාග්ධන ප්‍රමාණය, අමාත්‍යවරයා විමසා, මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන වාරිකයන්ගෙන් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලට ඒ මුදල් බැර කරනු ලැබිය යුතු ය.

6. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) අධිකාරිය විසින්, අධිකාරියේ ආදායම සහ වියදම වත්කම් සහ වගකීම් සහ අධිකාරියේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතු ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව විගණකාධිපතිවරයා විසින් සෑම වර්ෂයකම අධිකාරියේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) අධිකාරිය විසින් අධිකාරියේ වැඩකටයුතු පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව පිළියෙල කරනු ලැබිය යුතු අතර ඒ වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. විගණකාධිපතිවරයා විසින්, තමාගේ වාර්තාව ද සමග ඒ වාර්තාව පාර්ලිමේන්තුවට

ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තව ද, ඒ මුදල් වාර්තාව අදාළ වන්නේ යම් වර්ෂයකටද ඒ වර්ෂයට ඉක්බිතිවම වූ වර්ෂය අවසන් වීමට පෙර ඒ වාර්තා මහජනයාගේ දැනගැනීම පිණිස ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු ය.

7. (1) (මෙහි මින් මතු "සභාව" යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ) පාරිසරික සභාව පිහිටුවිය යුතු අතර අමාත්‍යවරයා විසින් පත්කරන ලද පහත දැක්වෙන සාමාජික යන්ගෙන් එය සමන්විත විය යුතු ය:—

(අ) පළාත්පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍ය වරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ඇ) සැලසුම් ක්‍රියාත්මක කිරීමේ විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ඈ) ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ඉ) සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ඊ) කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍ය වරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(උ) ප්‍රවාහන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍ය වරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ඌ) විදුලිබල සහ බල ශක්ති විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(එ) මහා මාර්ග විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍ය වරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ඒ) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍ය වරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ඔ) ධීවර විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ඕ) සංචාරක විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍ය වරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ක) කම්කරු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවර යාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ග) පේෂ කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ච) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ජ) විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ට) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍ය වරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ඪ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ණ) අධිකාරියේ තත්කාලයෙහි සාමාන්‍යාධිකාරි ධුරය දරන තැනැත්තා; සහ

(ත) පරිසර ක්ෂේත්‍රයේ ස්වේච්ඡා අනුයෝජිත ආයතන නියෝජනය කිරීමට අමාත්‍ය වරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක්.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් සභාවේ සභාපතිවරයා ලෙස පත්කළ යුතුය.

(3) සභාවේ කර්තව්‍ය—

(අ) අධිකාරියේ වගකීම්, බලතල, කාර්ය සහ කර්තව්‍ය සම්බන්ධයෙන් වූ කාරණා පිළිබඳව අධිකාරියට සාමාන්‍යයෙන් උපදෙස් දීම; සහ

(ආ) අධිකාරිය විසින් සභාවට යොමු කරන ලද යම් කාරණා පිළිබඳව අධිකාරියට උපදෙස් දීම, විය යුතු ය.

8. (1) තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් නම් හෝ මන්ත්‍රීවරයකු වුවහොත්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ පුරවැසියකුව සිටීම අවසන් වුවහොත්

ඔහු අධිකාරියේ හෝ සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීම සඳහා හෝ අධිකාරියේ හෝ සභාවේ සාමාජිකයකු ලෙස තව දුරටත් සිටීම සඳහා හෝ නුසුදුසු විය යුතු ය.

(2) 3 (1) වන සහ 7 (1) වන වගන්ති යටතේ පත් කරන ලද තැනැත්තන් අවස්ථාවෝචිත පරිදි, මේ වගන්තියේ (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධාන වලට යටත්ව, අවුරුදු තුනක කාලයක් ධුර දැරිය යුතු අතර, නැවත පත් කරනු ලැබීමට සුදුස්සන් විය යුතු ය.

(3) (අ) අධිකාරියේ කිසිදු සාමාජිකයෙක් සභාවේ සාමාජිකයෙක් නොවිය යුතුය; තවද

(ආ) සභාවේ කිසිදු සාමාජිකයෙක් අධිකාරියේ සාමාජිකයෙක් නොවිය යුතු ය.

(4) අධිකාරියේ යම් සාමාජිකයෙක්—

(අ) (1) උපවගන්තියෙහි සඳහන් කරන ලද නුසුදුසුකම් අතුරින් කිසිවකට යටත් වුවහොත්; හෝ

(ආ) යම් කායික අබලතාවක් හෝ සිහිවිකලතාවක් නිසා ස්වකීය කාර්ය ඉටුකිරීමට නිත්‍ය වශයෙන්ම නොහැකි තත්ත්වයකට පත්වුවහොත්; හෝ

(ඇ) ජනාධිපතිවරයාගේ මතය අනුව අධිකාරිය අපකීර්තියට පත්වන අන්දමේ යම් ක්‍රියාවක් කර ඇත්නම්

ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතුය.

(5) සභාවේ යම් සාමාජිකයෙක්—

(අ) (1) වන උපවගන්තියෙහි සඳහන් කරන ලද නුසුදුසුකම් අතුරින් කිසිවකට යටත් වුවහොත්; හෝ

(ආ) යම් කායික අබලතාවක් හෝ සිහිවිකලතාවක් නිසා ස්වකීය කාර්ය ඉටු කිරීමට නිත්‍ය වශයෙන්ම නොහැකි තත්ත්වයකට පත් වුවහොත්; හෝ

(ඇ) අමාත්‍යවරයාගේ මතය අනුව සභාව අපකීර්තියට පත්වන අන්දමේ යම් ක්‍රියාවක් කර ඇත්නම්

අමාත්‍යවරයා විසින් ඔහු ධූරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, සභාවේ කිසිදු සාමාජිකයකු, ඒ සාමාජිකයා නම් කරන ලද අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, ධූරයෙන් ඉවත් කරනු නොලැබිය යුතු ය.

(6) අධිකාරියේ සභාපතිවරයා විසින් හෝ වෙනත් යම් සාමාජිකයකු විසින් මේ වගන්තියේ විධිවිධාන යටතේ ධූරය හිස් කරනු ලැබූ විටක, ඔහුගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධූරය දැරීමට ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසන ලදුව, වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(7) සභාවේ සභාපතිවරයා විසින් හෝ වෙනත් යම් සාමාජිකයකු විසින් මේ වගන්තියේ විධිවිධාන යටතේ ධූරය හිස් කරනු ලැබූ විටක ඔහුගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධූරය දැරීමට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය;

එසේ වුව ද, ඒ සාමාජිකයා නම් කරන ලද අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, මේ උපවගන්තිය යටතේ කිසිදු පත්කිරීමක් කරනු නොලැබිය යුතු ය.

(8) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ අධිකාරියේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට තාවකාලිකව ඔහුගේ ධූරයෙහි කාර්ය ඉටු කිරීමට නොහැකිවන අවස්ථා වක, සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයා ලෙස ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට ජනාධිපතිවරයා විසින්, අමාත්‍යවරයා විමසන ලදුව, වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(9) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ සභාවේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට තාවකාලිකව ඔහුගේ ධූරයෙහි කාර්ය ඉටුකිරීමට නොහැකි වන අවස්ථාවක, සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයා ලෙස ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ඒ සාමාජිකයා නම් කරන ලද අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, කිසිදු පත් කිරීමක් කරනු නොලැබිය යුතු ය.

(10) ඉල්ලා අස්වන බවට ජනාධිපතිවරයා වෙත ලිපියක් යැවීමෙන්, අධිකාරියේ සභාපති වරයාට හෝ යම් සාමාජිකයකුට යම් අවස්ථාවක දී ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්වීමට හැකි ය.

(11) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන්, සභාවේ සභාපති වරයාට හෝ යම් සාමාජිකයකුට යම් අවස්ථාවක දී ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්වීමට හැකි ය.

(12) අධිකාරියේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට හෝ සභාවේ සභාපති වරයාට හෝ යම් සාමාජිකයකුට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(13) අධිකාරියේ හෝ සභාවේ සභාපතිවරයා පැමිණ සිටී නම්, අවස්ථාවෝචිත පරිදි, ඔහු අධිකාරියේ හෝ සභාවේ සියලුම රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට අධිකාරියේ හෝ සභාවේ සභාපතිවරයා පැමිණ නොසිටී නම් පැමිණ සිටින සාමාජිකයන් විසින් සාමාජිකයන්ගෙන් කෙනෙකු ඒ රැස්වීමෙහි මුලසුන දැරීම සඳහා තෝරා පත්කර ගත යුතු ය.

(14) (අ) අධිකාරියේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් දෙදෙනකු විය යුතු ය.

(ආ) සභාවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හත්දෙනෙකු විය යුතු ය.

(15) (අ) අධිකාරියේ හෝ සභාවේ රැස්වීම් පිළිබඳ කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යෑම, අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය හෝ සභාව විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

(ආ) අධිකාරියේ රැස්වීම් අධිකාරිය තීරණය කරනු ලබන වේලාවන්හි සහ ස්ථානවල දී පැවැත්විය යුතු ය.

(ඇ) අධිකාරිය විසින් නියම කරනු ලබන වේලාවන්හි හා ස්ථානවල දී සෑම වර්ෂයකම අඩුම වශයෙන් සිව් වතාවක් සභාව රැස්විය යුතු ය.

(16) අධිකාරිය විසින් මේ පණත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරනු ලැබීමේ දී සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කරනු ලැබීමේ දී අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධානවලට අධිකාරිය යටත් විය යුතු ය.

(17) අධිකාරියේ සාමාජිකයකු විශේෂ අවස්ථාවන්හි දී සහ අමාත්‍යවරයා විමසන ලදුව ජනාධිපතිවරයාගේ ලියවිල්ලකින් වූ කැමැත්ත ඇතිව හැර තම ධුරයේ සිටින තාක් කල් තම ධුරයේ කාර්යවලට බාහිරව කෙළින්ම හෝ අන්‍යාකාරයකින් යම් වැටුප් ලබන රැකියාවක නොයෙදිය යුතු ය.

(18) අධිකාරියේ හෝ සභාවේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හෝ සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා පමණක් අධිකාරියේ හෝ සභාවේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතු ය.

9. (1) අධිකාරිය විසින් තීරණය කරනු ලබන සාමාජිකයන්ගෙන් සමන්විත වන දිසා පාරිසරික අනුයෝජිත ආයතනයක් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා අධිකාරිය විසින් පත්කරනු ලැබිය යුතු ය.

(2) එක් එක් දිසා පාරිසරික අනුයෝජිත ආයතනයේ සභාපති වරයා එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විය යුතු ය.

(3) අධිකාරිය විසින් දිසා පාරිසරික අනුයෝජිත ආයතනයට පවරනු ලැබිය හැකි අධිකාරියේ යම් බලතල ක්‍රියාත්මක කිරීම, යම් කර්තව්‍ය හෝ කාර්ය ඉටු කිරීම දිසා පාරිසරික අනුයෝජිත ආයතනයක් විසින් කරනු ලැබිය යුතු ය.

(4) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් දිසා පාරිසරික අනුයෝජිත ආයතනයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකිය.

## II කොටස

## අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්ය

**10.** (1) අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්ය පහත දැක්වෙන ඒවා විය යුතුය:—

(අ) මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක කිරීම;

(ආ) පරිසරයේ ආරක්ෂා කරනු ලැබිය යුතු, ස්පර්ශ කළ හැකි හෝ ස්පර්ශ නොකළ හැකි ප්‍රයෝජනය සහ අගයන්, පරිසරයේ පවත්වාගත යුතු තත්ත්වය, පරිසරයේ තත්ත්වයට හානිකර නොවන පරිදි අපද්‍රව්‍ය

බැහැර කිරීමට ඉඩ දිය හැකි ප්‍රමාණය, දීර්ඝාන්තර සංවර්ධනයෙන් ඇති ප්‍රයෝජන යන මේවා සම්බන්ධයෙන් පරිසරයේ යම් කොටසක් ආරක්ෂා කිරීමට අදාළව ජාතික පාරිසරික ප්‍රතිපත්තිය සහ උපමානයන් පිළිබඳව ද පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීමෙහි ලා ක්‍රම සම්පාදනය සහ වෙනත් යම් සාධක පිළිබඳව ද අමාත්‍යවරයාට නිර්දේශ කිරීම;

(ඇ) දූෂණය ඇතිවීමේ හේතූන්, එහි ස්වභාවය, ප්‍රමාණය සහ එය වැළැක්වීමෙහි ලා සමීක්ෂණ හා විමර්ශණ පැවැත්වීම සහ ඊට සමාන සමීක්ෂණ හා විමර්ශන පවත්වන්නා වූ වෙනත් තැනැත්තන්ට හෝ මණ්ඩලවලට සහාය වීම සහ සහයෝගය දීම;

(ඈ) පාරිසරික පරිහානියේ යම් අංශයකට අදාළව පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම හෝ එවැනි පරිහානියක් වැළැක්වීම සහ පරිසරය ආරක්ෂා කිරීමට ද වැඩිදියුණු කිරීමට ද උපමාන යන් වර්ධනය කිරීම;

(ඉ) පරිසරය වැඩදායි ලෙස උපයෝගී කරගැනීම් ආරක්ෂාකර හැනීම් සඳහා ද එහි තත්ත්වය පවත්වාගෙන යාම සඳහා ද ප්‍රමිති, න්‍යායන් සහ උපමාන යන් නිශ්චය කිරීම;

(ඊ) පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය සම්බන්ධයෙන් වූ යම් අංශ පිළිබඳව වාර්තා සහ තොරතුරු ප්‍රකාශයට පත්කිරීම;

(උ) පනතට අනුකූලව ක්‍රියාකරන බවට වගබලාගැනීම සඳහා විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම සහ එහි විධිවිධාන අතුරින් යම් විධිවිධානයකට අනුකූලව ක්‍රියා නොකිරීම පිළිබඳවූ පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනය කිරීම;

(ඌ) මේ පනතේ කාර්ය සඳහා සැම්පලයක් ගැනීම සහ පරීක්ෂණ පැවැත්වීම සඳහා යොදගත යුතු ක්‍රම නිශ්චය කිරීම;

(එ) පරිසරය ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් මහජනයාට තොරතුරු හා අධ්‍යාපනය ලබදීම;

(ඒ) පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වෙනත්රටවල් සහ අන්තර් ජාතික සංවිධාන සමග සම්බන්ධතා ඇති කිරීම සහ පවත්වා ගෙන යාම;

(ඔ) පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වූ කාරණා ගැන ද පරිසරයේ යම් කොටසක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් හිතකර යැයි අදහස් කරන පවත්නා ව්‍යවස්ථාවලට යම් සංශෝධන ගැනද අමාත්‍යවරයා විසින් අධිකාරියට යොමු කරන ලද යම් කාරණා සම්බන්ධයෙන් ද අමාත්‍යවරයාට වාර්තා කිරීම;

(ඕ) පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය සඳහා දීර්ඝාන්තර සැලසුම් කිරීම් ප්‍රවර්ධනය කිරීම, දිරිගැන්වීම, සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ; සහ

(ක) අවශිෂ්ටයන් පරිවර්තනය කිරීමේ සහ ප්‍රයෝජනයට ගැනීමේ ක්‍රම උනන්දු කරවීම, ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(2) සෑම වර්ෂයකම දෙසැම්බර් මස අවසාන වීමට පෙර අධිකාරිය විසින් අමාත්‍යවරයා වෙත අධිකාරියේ සහ සභාවේ පසුගිය මුදල් වර්ෂයේ වැඩ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. අමාත්‍යවරයා විසින් ඒ වාර්තාව ලැබී දින දහහතරක් ඇතුළත හෝ පාර්ලිමේන්තුවේ සැසිවාර නොපැවැත්වෙන්නේ නම් ඊළඟ පාර්ලිමේන්තු සැසිවාරය රැස්වෙන දින සිට දින දහහතරක් ඇතුළත එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමට සැලැස්විය යුතුය.

11. මේ පනත යටතේ, අධිකාරියේ බැඳීම් ඉටු කිරීම සඳහා හෝ අධිකාරියේ කාර්ය ඉටු කිරීම සඳහා අධිකාරියට අවශ්‍ය වන මුදල් අයිරාවක මාර්ගයෙන් හෝ අන්‍යාකාරයකින් අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද යම් පොදු අනුමතයක නියමයන්ට අනුකූලව අධිකාරිය විසින් තාවකාලිකව ණයට ගනු ලැබිය හැකිය:

එසේ වුවද මේ වගන්තිය යටතේ අධිකාරිය විසින් ලබාගන්නා ලද යම් තාවකාලික ණයක් සම්බන්ධයෙන් යම් අවස්ථාවකදී ගෙවීමට තිබෙන මුදල් ප්‍රමාණවල මුළු එකතුව අමාත්‍යවරයා විසින්, මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා, තීරණය කරනු ලබන මුදලක් නොඉක්ම විය යුතුය.

12. (1) අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, යම් පළාත් පාලන ආයතනයක ප්‍රාදේශීය සීමා තුළ පරිසරය රැක ගැනීම සහ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍යයයි අධිකාරිය සලකන යම් ක්‍රියාවක් හෝ දෙයක් කරන ලෙස හෝ කරනු ලැබීමට සලස්වන ලෙස විශේෂ හෝ පොදු විධාන කලින් කල, ලියවිල්ලකින් ඒ පළාත් පාලන ආයතනයට දෙනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ විධානයක් දෙනු ලබන ලද සෑම පළාත් පාලන ආයතනයක්ම ඒ විධානයට අනුකූලව ක්‍රියා කළ යුතුය.

## III කොටස

## අධිකාරියේ කාර්ය මණ්ඩලය

13. (1) අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාන්‍යාධිකාරිවරයකු අධිකාරියට සිටිය යුතු අතර ඔහු අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතුය.

(2) අධිකාරියේ කටයුතු මෙහෙයවීම, අධිකාරියේ බලතල, කර්තව්‍ය හා කාර්ය සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ද අධිකාරියේ සේවානියුක්තයන්ගේ පරිපාලනය හා පාලනයද සභාපතිවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව, සාමාන්‍යාධිකාරිවරයා වෙත භාර විය යුතුය.

(3) සාමාන්‍යාධිකාරිවරයා අධිකාරියේ ලේකම්වරයා වශයෙන් ද ක්‍රියා කළ යුතුය.

(4) අධිකාරියේ රැස්වීම්වලට පැමිණ සිටීමේ සහ ඒ රැස්වීම්වල කථා කිරීමේ හිමිකම ලේකම්වරයාට තිබිය යුතු නමුත් ඒ රැස්වීම්වලදී ඡන්දය දීමට ඔහුට හිමිකමක් නො තිබිය යුතුය.

14. (1) කාර්යක්ෂම ලෙස අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන නිලධරයන් සහ සේවකයන් අධිකාරිය විසින් විසින් පත් කරනු ලැබිය හැකිය.

(2) නියම කරනු ලැබිය හැකි නියෝග මගින් නිශ්චය කරනු ලබන ආකාරයකින් සහ එසේ නිශ්චය කරනු ලබන අනුප්‍රමාණ අනුව අධිකාරියේ නිලධරයන්ට සහ සේවකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර එසේ නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලටද ඔවුන් යටත් විය යුතුය.

(3) අධිකාරියේ ඉල්ලීම පිට, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, අධිකාරියේ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබීම හෝ ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස පත් කරනු ලැබීම හෝ කරන ලැබිය හැකිය.

(4) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරන ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(5) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස පත් කරන ලැබූ අවස්ථාවක ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(6) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරන ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරිය යටතේ සේවය කරන ලබන යම් කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතුය.

(7) අධිකාරියේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ එම පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, අධිකාරියේ කාර්ය මණ්ඩලයට එවැනිම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබීම හෝ විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් සම්බන්ධයෙන් වූ අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ද ඇතුළුව, අධිකාරිය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ එම පළාත් පාලන ආයතනය විසින් එකඟවනු ලබන නියම සහ කොන්දේසි මත, ඒ සාමාජිකයා හෝ නිලධරයා හෝ සේවකයා අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස පත් කිරීම හෝ කරනු ලැබිය හැකිය.

(8) (7) වන උපවගන්තියේ විධිවිධාන අනුව යම් තැනැත්තකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරන ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන්නා වූ විනය පාලනයට ම ඒ තැනැත්තා යටත් විය යුතුය.

## IV කොටස

### පාරිසරික කළමනාකරණය

**15.** අධිකාරිය විසින් සභාවේ අදහස් විමසා ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සහාය ඇතිව, ඉඩම් උපයෝගී කර ගැනීමේ ක්‍රමයක්, පහත දැක්වෙන පරමාර්ථ වලට ගැලපෙන පරිදි, සකස් කිරීම සහ අමාත්‍යවරයාට නිර්දේශ කිරීම කළ යුතුය:—

(අ) උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස ඉඩම් සහ ඒවායේ සම්පත් අත් කර ගැනීම, ප්‍රයෝජනයට ගැනීම සහ නිෂ්පාදනය කිරීම සඳහා බුද්ධිමත්, ක්‍රමානුකූල සහ කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම; සහ

(ආ) ජාතියේ අවශ්‍යතාවයන් සහ ඉඩම් සම්පත් අතර අසමබරතාවයක් ඇති වීම වැළැක්වීම පිණිස ඒ සම්පත් ප්‍රඥාගෝචර ලෙස උපයෝගී කර ගැනීම සහ සංරක්ෂණය කිරීම.

**16.** 15 වන වගන්තිය යටතේ සම්පාදිත ඉඩම් උපයෝගී කර ගැනීමේ ක්‍රමයට —

(අ) විද්‍යානුකූලව ප්‍රමාණවත් ඉඩම් වට්ටෝරුවක් සහ වර්ගීකරණ ක්‍රමයක්;

(ආ) වර්තමාන ඉඩම් උපයෝගී කර ගැනීම, ඒ ඉඩම් ප්‍රයෝජනයට ගනු ලැබූ ප්‍රමාණය, ඌන ප්‍රයෝජනයට ගනු ලැබූ ප්‍රමාණය හෝ නිෂ්ක්‍රිය නැතහොත් අත්හැර දමා ඇති ප්‍රමාණය පිළිබඳව තීරණය කිරීම;

(ඇ) ප්‍රජා සංවර්ධනයට, කෘෂිකර්මයට, කර්මාන්තවලට හෝ වාණිජ කටයුතුවලට ඉඩම් යොදවා ගැනීමේ හැකියාව පිළිබඳව සවිස්තරව හා නිවැරදිව තීරණය කිරීම;

(ඈ) පාලනයෙන් තොරව සංවර්ධනය කිරීමෙන් පිළියම් නොකළ හැකි හානියක් සිදු විය හැකි වැදගත් ඓතිහාසික, සංස්කෘතික හෝ සෞන්දර්යාත්මක වටිනාකමින් යුත් ප්‍රදේශ හඳුනා ගැනීම;

(ඉ) පාරිසරික පාලනය අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි ප්‍රදේශවල ඉඩම් උපයෝගී කර ගැනීම ආණ්ඩුව විසින් පාලනය කරන ලැබීම සඳහා ක්‍රමයක්; සහ

(ඊ) පුද්ගලයන් නැවත පදිංචි කිරීම සඳහා අළුත් ප්‍රදේශ තෝරා ගැනීමට සහ ඒ ප්‍රදේශ තුළ හා ඒ අවට ඉඩම් උපයෝගී කර ගැනීම පිළිබඳව උචිත පාලන විධි තහවුරු කිරීම සඳහා වූ ක්‍රම කෙරෙහි බලපාන ප්‍රතිපත්තියක් ඇතුළත් විය යුතුය.

### ස්වභාවික සම්පත්

**17.** රටේ ස්වභාවික සම්පත් වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස සහ ඒවා අනාගත පරම්පරාවලට ආරක්ෂා කර තැබීම පිණිස ඒ ස්වභාවික සම්පත් කළමනාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා මූලික ප්‍රතිපත්තියක් සහ ඒ ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාවට නැඟීම පිණිස වූ පොදු ක්‍රියා මාර්ග පිළිබඳව ද අධිකාරිය විසින් සභාවේ අදහස් විමසා, අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතුය.

### ධීවර කටයුතු

**18.** ධීවර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සහාය ඇතිව අධිකාරිය විසින්, සභාවේ අදහස් විමසා, ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයෙහි හෝ එහි අනන්‍ය ආර්ථික කලාපයෙහි නැතහොත් එහි අභ්‍යන්තර ජලයෙහි ධීවර සහ ජලජ සම්පත් බුද්ධිමත්ව ප්‍රයෝජනයට ගැනීම සඳහා ක්‍රමයක් අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතු අතර ඒ ජලයන්ගෙන් උපරිම සහ අඛණ්ඩව පලදාව ලබා ගැනීම පවත්වාගෙන යෑම සහ පුළුල් කිරීම පිණිස පුරවැසි සහභාගිත්වයට ධෛර්යය දිය යුතුය.

**19.** ධීවර සහ වෙනත් ජලජ සම්පත් බුද්ධිමත්ව ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ ක්‍රියා මාර්ගවලට වඳවී යන මත්ස්‍ය විශේෂ හෝ වෙනත් ජලජ ජීවීන් අලෙවිකරණය විධිමත් කිරීම ඇතුළත් විය හැකිය.

### වනසත්ව

**20** වන සත්ව සංරක්ෂණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සහාය ඇතිව අධිකාරිය විසින්, සභාවේ අදහස් විමසා වන සත්ව සම්පත් බුද්ධිමත්ව, ප්‍රයෝජනයට ගැනීමේ සහ සංරක්ෂණය කිරීමේ ක්‍රමයක් අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතු අතර ඒ පිළිබඳ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පුරවැසි සහභාගිත්වයට ධෛර්යය දිය යුතුය.

### වන විද්‍යාව

**21.** වන විද්‍යා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සහාය ඇතිව අධිකාරිය විසින් සභාවේ අදහස් විමසා —

(අ) (i) වන සම්පත් බුද්ධිමත්ව ප්‍රයෝජනයට ගැනීමේ;

(ii) වඳවී යාමට භාජනය වී ඇති වන සම්පත් අලෙවිකරණය විධිමත් කිරීමේ

(iii) වඳවී යාමට භාජනය වී ඇති වෘක්ෂලතා විශේෂ සංරක්ෂණය කිරීමේ සහ එහිලා රටේ වන සම්පත් උපරිම ඵලදායකත්වයෙන් සෑම කල්හිම තබා ගැනීම පිණිස පුරවැසි සහභාගිත්වයට ධෛර්යය දීමේ ක්‍රමයක් අමාත්‍ය වරයාට නිර්දේශ කළ යුතුය.

(ආ) නැවත වන වැවීම, දුව අංගන දියුණු කිරීම, වන ආරක්ෂා කිරීම, ඉඩම් වර්ගී කරණය කිරීම, වන ව්‍යාප්තිය කළමනාකරණය කිරීම, කාර්මික වටිනාකමින් යුත් වෘක්ෂ වගා කිරීම, උද්‍යාන සහ වන සත්ව කළමනාකරණය කිරීම, වනාන්තර විවිධ ප්‍රයෝජනවලට යොද ගැනීම, දුව කළමනාකරණය කිරීම සහ වනාන්තර පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සඳහා අඛණ්ඩ ප්‍රයත්නයක් දැරීමේ ක්‍රමයක් අමාත්‍යවරයාට නිර්දේශ කළ යුතුය.

### පස සංරක්ෂණය

**22.** පස සංරක්ෂණය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සහාය ඇතිව අධිකාරිය විසින්, සභාවේ අදහස් විමසා, අවදනම් සහිත දිය බස්නා ප්‍රදේශ හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම, විද්‍යාත්මක ගොවිතැන් ක්‍රමවලට භෞතික හා ජෛව වෛද්‍ය මාර්ගවලින් පස සංරක්ෂණය කිරීමට සහ ඵලදායී ලෙස පස සංරක්ෂණය කිරීම සඳහා කෙටි කාලීන සහ දීර්ඝ කාලීන පර්යේෂණ හා තාක්ෂණවේදය යොද ගැනීමට දිරි ගැන්වීම ඇතුළුව පස සංරක්ෂණය කිරීම පිළිබඳ වැඩ සටහන් නිර්දේශ කළ යුතුය.

**23.** අධිකාරිය විසින් පාරිසරික කළමනාකරණය සඳහා අඛණ්ඩ අධ්‍යයන හා පර්යේෂණ වැඩ සටහන් සකස් කිරීමට භාර ගෙන ඒවා ප්‍රවර්ධනය කළ යුතු අතර, පාරිසරික පර්යේෂණ සඳහා ප්‍රමුඛත්වය දිය යුතු අංශ කලින් කල තීරණය කළ යුතුය.

## V කොටස

### සාමාන්‍ය

**24.** (1) මේ පනතේ සිද්ධාන්ත සහ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින් යම් පරිශ්‍රයක පදිංචිකරු වෙත භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් දින දහහතරක් ඇතුළත හෝ දැන්වීමේ සඳහන් කර ඇති ඊට වඩා දීර්ඝ කාලයක් ඇතුළත ඒ පරිශ්‍රයේ පවත්වාගෙන යන්නා වූ යම් නිෂ්පාදන, කාර්මික හෝ වෙළෙඳ පිරි සැකසුම් පිළිබඳව හෝ එකී පරිශ්‍රයෙන් පිට කරන හෝ පිට කරනු ලැබීමට ඉඩ ඇති ඒ දැන්වීමේ සඳහන් අපද්‍රව්‍ය පිළිබඳව අධිකාරිය වෙත තොරතුරු සපයන ලෙස එම පදිංචිකරුට නියම කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයකට අනුව අධිකාරියට සපයන ලද සියලු තොරතුරු අධිකාරිය විසින් අතිශය රහස්‍ය ලෙස සැලකිය යුතු අතර (3) වන උපවගන්තියට යටත්ව, මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් නඩු පැවරීමක කාර්යය සඳහා අධිකරණයකට හැර ඒ තොරතුරු වෙනත් යම් තැනැත්තකුට හෙළිදරව් නොකළ යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයක් අනුව අධිකාරියට සපයන ලද යම් තොරතුරක් හෝ කරන ලද ප්‍රකාශයක්, තොරතුරු සපයන හෝ ප්‍රකාශය කරන තැනැත්තා තමා අපරාධ චෝදනායකට ලක්වීමට ඉඩ ඇති බවට ඒ තොරතුරු සපයන හෝ ප්‍රකාශය කරන අවස්ථාවේ දී විරෝධය දක්වා ඇත්නම් මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් එම තැනැත්තාට විරුද්ධව යම් නඩු කටයුත්තකදී සාක්ෂි වශයෙන් ආවේශ්‍ය නොවිය යුතුය.

**25.** අධිකාරිය විසින්—

(අ) මේ පනතේ කාර්ය සඳහා ගන්නා ලද සැම්පල් විශ්ලේෂණය කිරීම පිණිස රසපරීක්ෂකයන්; සහ

(ආ) පරිසරයේ ග්‍රාහක කොටස්වලට අපද්‍රව්‍ය එකතු වී ඇති බව, ඒ අපද්‍රව්‍යවල ප්‍රමාණය සහ ස්වභාවයද පරිසරයේ ග්‍රාහක කොටස් කෙරෙහි ඒ අපද්‍රව්‍ය වලින් ඇති කෙරෙන බලපෑම් ද සොයා ගැනීම සඳහා වූ නියමිත උපකරණ සහ සවි කිරීම් සමීක්ෂණය කිරීමේ වාර්තා පරීක්‍ෂා කිරීම සහ ඇගයීම් සඳහා පරිසර දූෂණ පාලන නිලධරයන් පත් කරනු ලැබිය හැකිය.

**26.** (1) (5) වන උපවගන්තියට යටත්ව අධිකාරිය විසින් කරන ලද නියමයක් මගින් මේ පනත යටතේ අධිකාරිය සතු බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින් යම් බලතල කාර්ය හෝ කර්තව්‍ය යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ යම් පළාත් පාලන ආයතනයකට පවරා දෙනු ලැබිය හැකිය.

(2) අධිකාරය විසින් යම් බලයක් යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ යම් පළාත් පාලන ආයතනයකට හෝ පවරා දෙන ලද විටක බලතලවලින් කිසිවක් සාමාන්‍යාධි කාරිවරයා විසින් ම ක්‍රියාත්මක කරන ලද්දේ නම් ඔහු විසින් ක්‍රියාත්මක කළ හැකිව තිබුණු බලතලවලින් කිසිවක් ඒ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන ආයතනයේ යම් නිලධරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

(3) පරිසරය ආරක්ෂා කිරීමට සහ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට ඇති අධිකාරිය සතු යම් වගකීමකට මේ වගන්තියේ වූ කිසිවකින් බාධාවක් නොවිය යුතුය.

(4) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් අධිකාරිය විසින් කවර වූ හෝ අවස්ථාවකදී ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබීම හෝ වෙනස් කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකිය.

(5) අධිකාරිය විසින් (1) වන උපවගන්තිය යටතේ—

(අ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හැර යම් පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන්; සහ

(ආ) යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් වූ විටක ඒ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හැර

නියමයක් නොකළ යුතුය.

**27.** අධිකාරියේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

**28.** අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතුය.

**29** වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතුය. තවද, ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ ඒ වෙනත් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවයක් ඇති වුවහොත් මේ පනතේ විධිවිධාන ඒ වෙනත් ලිඛිත නීතියේ විධිවිධාන අභිබවා බල පැවැත්විය යුතුය.

30. (1) (අ) මේ පනත යටතේ අධිකාරිය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව; හෝ

(ආ) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට අධිකාරියේ, සභාවේ හෝ දිසා පාරිසරික අනුයෝජිත ආයතනයේ සාමාජිකයන් හෝ අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයන්ට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතුය.

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් දරනු ලබන යම් වියදමක් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී අධිකාරිය වෙත ගෙවනු ලබන හෝ අධිකාරිය විසින් අයකර ගනු ලබන යම් ගාස්තුවක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය පිට කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී ඔහු විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය තීරණය කළහොත්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගනු ලැබුවේ නම් මිස, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

31. මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක යම් විධිවිධානයක් කඩකරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම පැහැර හරින සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත් වරයෙකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් එක්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

32. (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් ප්‍රකාශිත හෝ නියමිත හෝ මේ පනතින් නියෝග සෑදීමට අවශ්‍ය සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන පසු දිනයක හෝ සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයෙන් පසු හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනුමතයේ දිනයෙහි සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඒ පරිච්ඡින්න කිරීමෙන් හානියක් නොවිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සැලකනු ලැබිය යුත්තේ යම් දිනයක සිට ද ඒ දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"වැඩදායි ලෙස උපයෝගී කර ගැනීම" යන්නෙන් මහජන යහපතට, සුබසාධනයට ආරක්ෂාවට හෝ සෞඛ්‍යයට හිතකරවන පිණිස පරිසරය හෝ පරිසරයේ යම් කොටසක් උපයෝගී කරගැනීමක් සහ අප ද්‍රව්‍ය බැහැර කිරීමෙන්, පිටකිරීමෙන් හා බහා තැබීමෙන් ඇතිවන විපාකවලින් පරිසරය හෝ පරිසරයේ යම් කොටසක් ආරක්ෂාකර ගැනීමක් අදහස්වේ;

''පරිසරය'' යන්නෙන් ඉඩම්, පස, ජලය, වායුගෝලය, දේශගුණය, ශබ්දය, ගඳ, රස සහ සෑම විස්තරයකම සතුන්ගේ හා ශාකවල ජෛවී සාධක ඇතුළුව මනුෂ්‍යයන්ගේ වට පිටාවන්වල භෞතික සාධක අදහස් වේ;

''අනන්‍ය ආර්ථික කලාපය'' යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රිය කලාපය පිළිබඳ පනතෙහි 5 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයෙන් අනන්‍ය ආර්ථික කලාපය ලෙස ප්‍රකාශයට පත් කරන ලද කලාපය අදහස් වේ;

''ඉඩම'' යන්නට වාසස්ථාන, ගොඩනැගිලි සහ ඒවාට සම්බන්ධ පරවශතාව ඇතුළත් වේ;

''පළාත් පාලන ආයතන'' යන්නෙන් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටුකරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍ය වලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ;

''දූෂණය'' යන්නෙන්, පරිසරය වැඩදායී ලෙස උපයෝගී කරගැනීමට අහිතකර ලෙස හෝ මහජන සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ සුබසාධනයට නැතහොත් සත්ව යන්ට, කුරුල්ලන්ට, වනසතුන්ට, ජලජ ජීවිතයට හෝ සෑම විස්තරයකම ශාකවලට උපද්‍රවකාරී හෝ සම්භාව්‍ය උපද්‍රවකාරී තත්ත්වයක් ඇතිවන ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමෙන්, පිටකිරීමෙන් හෝ බහා තැබීමෙන් පරිසරයේ යම් කොටසක භෞතික, තාපජ, රසායනික, ජෛවී හෝ විකිරණශීලී පදාර්ථයන් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් වෙනස් කිරීම අදහස් වේ;

''නියමිත'' යන්නෙන්, නියෝගයක් මගින් නියමිත බව අදහස් වේ;

''දේශීය ජල තීරය'' යන්නට ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු තීරය හා ඓතිහාසික ජල තීරය ඇතුළත් වේ; සහ

''අපද්‍රව්‍ය'' යන්නට අපද්‍රව්‍ය බවට නියම කරන ලද යම් ද්‍රව්‍යයක් සහ යම් ඝනත්වයකින්, සංයුතියකින් හෝ ආකාරයකින් යුත් පරිසරයේ වෙනසක් ඇති කිරීම සඳහා පරිසරය වෙත බැහැර කරන ලද, පිටකරන ලද හෝ බහා තබන ලද දියර, ඝන, වායු හෝ විකිරණශීලී හෝ යම් ද්‍රව්‍යයක් ඇතුලත් වේ.

---

## 1980 අංක 58 දරන විසර්ජන පනත

**[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 23 වන දින]**

**1981 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ යම් යම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ පනතකි.**

1. මේ පනත 1980 අංක 58 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව මේ පනතෙහි ''1981 මුදල් වර්ෂය'' යනුවෙන් සඳහන් කරනු ලබන 1981 ජනවාරි 1 වන දිනෙන් ආරම්භව 1981 දෙසැම්බර් 31 වන දින අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි තක්සේරු කර ඇති රුපියල් දෙදහස් තුන්සිය අසූදෙකෝටි පනස් අටලක්ෂ තිස්හත් දහස් එකසිය අසූ එකක් වූ ආණ්ඩුවේ වියදම—

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළහැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම් වලින් ; හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් එක් දහස් දෙසිය අනූහත් කෝටි දශ ලක්‍ෂයක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල් වලින්

පියවිය යුතුය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් දෙදහස් තුන්සිය අසූදෙකෝටි පනස් අටලක්‍ෂ තිස්හත් දහස් එකසිය අසූ එකක් වූ මුදල මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකිය.

(2) මේ වගන්තියේ (1) වන උප වගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන අන් කිසි ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතුය.

3. (1) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්තෙන් 2 වන වගන්තියෙහි සඳහන් මුදල් වර්ෂය තුළ දී ආණ්ඩුවට ලැබෙන ලැබීම එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතු ය. එහෙත් එසේ බැර කරනු ලබන ලැබීම්වල සමස්තය එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ දක්වෙන අවම සීමාව නොඉක්මවිය යුතුය. එවැනි කටයුත්තකින් ඒ අවම සීමාව ඉක්මවා ලැබෙන ලැබීම් කිසිවක් වෙතොත් එය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

(2) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම් ඒ මුදල් වර්ෂය තුළදී එම කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම් වලින් ගෙවිය යුතුය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ II වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය අවසානයේදී හිඟව ඇති හර ශේෂය එම උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය. තවද, ඒ මුදල් වර්ෂයේ අවසානයේදී එම කටයුත්තේ මුළු බැරකම් එම උපලේඛනයේ V වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

4. 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුවට ලැබෙන ලැබීම් ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා අමාත්‍යවරයා අවශ්‍ය යයි සලකන මුදල් ඒකාබද්ධ අර මුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කළ හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්තය එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතුය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධානය කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතුය.

5. (1) යථෝක්ත උපලේඛනයේ සඳහන් කිසියම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම් කිසි වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට මේ පනතේ පළමුවන උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්ද වූ හෝ මතුවට

වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද, යම් මුදලක් එම වැඩසටහනේම මූලධන වියදමේ වෙන් කිරීමකට හෝ එම ශීර්ෂයේම වෙනයම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ වෙන් කිරීමකට හෝ භාණ්ඩාගාරයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකිය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයෙහි සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතුය.

6. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම් බලාපොරොත්තු වූ මුදල් වලට වඩා අඩු විය හැකි බවට ; හෝ

(2) යම් කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට, අමාත්‍යවරයා සෑහීමකට පත් වූ අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදල කින් හෝ මුදල් වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදාහරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් ඉවත් කර ගැනීම අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කළ හැකිය.

7. මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයෙහි, IV වන තීරයෙහි හෝ V වන තීරයෙහි දැක්වෙන යම් උපරිම සීමාවක් හෝ III වන තීරයෙහි දැක්වෙන අවම සීමාව හෝ ආණ්ඩුවේ අනුමතය ඇතිව 1982 මැයි 31 වන දින හෝ ඊට පෙර අමත්‍යවරයා විසින් නියමයක් මඟින් වෙනස් කළ හැකිය. නැතහොත් අමුතු කළ හැකිය. එබඳු යම් නියමයක්, එහි එසේ ප්‍රකාශිතව ම සඳහන් කරනු ලැබුවහොත්, ඒ නියමය කරනු ලැබූ දිනයට කලින් වූ සහ එහි දක්වනු ලබන දිනයක සිට බලපැවැත් වූ ලෙස සැලකිය යුතුය.

8. මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් හා ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් එකතු කිරීමෙන් පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මඟින් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.

---

## 1980 අංක 59 දරන විසර්ජන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 29 වන දින]

**1979 අංක 71 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1980 අංක 59 දරන විසර්ජන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1979 අංක 71 දරන විසර්ජන පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "රුපියල් එක් දහස් එකසිය විසිකෝටි දශ ලක්ෂයක්" යන වචන වෙනුවට, "රුපියල් එක් දහස් පන්සිය කෝටි අනූ ලක්ෂයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## 1980 අංක 60 දරන ලංකා බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 29 වන දින]

ලංකා බැංකු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 1980 අංක 60 දරන ලංකා බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ

2. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 10 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා බැංකු ආඥා පනතේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ප්‍රාග්ධනය.

7. (1) බැංකුවේ අනුමත ප්‍රාග්ධනය, එක් එක් කොටස රුපියල් එක් දහසක් වන්නා වූ කොටස් දශ ලක්ෂයකට බෙදනු ලැබූ රුපියල් කෝටි සියයක් විය යුතුය.

(2) බැංකුවේ ගෙවා නිමි ප්‍රාග්ධනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් ප්‍රමාණයක් විය යුතුය.

(3) එකම කොටස් හිමියා ලෙස යම් අවස්ථාවක ආණ්ඩුව සතු වගකීම, තත්කාලයෙහි ආණ්ඩුව විසින් දරනු ලබන කොටස් වලින් නියෝජනය වන ප්‍රාග්ධනයේ මුළු ප්‍රමාණයට සීමා කරනු ලැබිය යුතු ය."

3. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 10 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ: —

"අමාත්‍යවරයා විසින් විධාන දෙනු ලැබිය හැකි බව.

33. බැංකුවෙහි කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලය වෙත ලියවිල්ලකින් දෙනු ලැබිය හැකි අතර, ඒ විධාන අනුව ක්‍රියා කිරීම මණ්ඩලයෙහි කාර්යය විය යුතු ය.".

---

## 1980 අංක 61 දරන මහජන බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 29 වන දින]

1961 අංක 29 දරන මහජන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 1980 අංක 61 දරන මහජන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 25 දරන මහජන බැංකු (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"(1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරයන් දස දෙනකුගෙන් මණ්ඩලය සමන්විත විය යුතු අතර, ඒ අධ්‍යක්ෂවරයන්ගෙන් දෙදෙනකු සමුපකාර විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ප්‍රාග්ධනය

12. (1) බැංකුවේ අනුමත ප්‍රාග්ධනය, එක් එක් කොටස රුපියල් පනහක් වන්නාවූ කොටස්, කෝටි දෙකකට බෙදුනු ලැබූ රුපියල් කෝටි සියයක් විය යුතු ය."

(2) බැංකුවේ ගෙවා නිමි ප්‍රාග්ධනය, ගැසට් පත්‍රයෙහි පලකරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් ප්‍රමාණයක් විය යුතු ය.".

4. 42 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 42 අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"අමාත්‍යවරයා විසින් විධාන දෙනු ලැබිය හැකි බව.

42අ. බැංකුවෙහි කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කළින් කල මණ්ඩලය වෙත ලියවිල්ලකින් දෙනු ලැබිය හැකි අතර, එම විධාන අනුව ක්‍රියා කිරීම මණ්ඩලයෙහි කාර්ය විය යුතු ය.".

---

## 1980 අංක 62 දරන මුදල් නීති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කලේ 1980 දෙසැම්බර් මස 29 වන දින]

මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 1980 අංක 62 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මුදල් නීති පනතේ 44 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.